ශ්‍රී ලංකාවේ පළවන ඉපැරැණිම සිංහල පුවත්පත



1968 ජූලි 17 වැනිදා මුල්වරට අගරදගුරු වසමට සහයක රදගුරු හිමිපාණන් දෙනමක් පත් වූ අතර ඉන් වසර 44 කට පසු යළි එවන් මොහොතක් උදා වී ඇත.

**ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා !**

3 පිටුව



**නවක රදගුරු හිමි වතගොත**

නවක රදගුරු හිමිපාණන් දෙනමගේ අතීත මතක සටහන් වර්තමාන ඇසින්.....

8 පිටුව



**ජනවන්දනාව**

ගීතාවලිය සතිපතා සැදැහැ ජනතාව වෙත ගෙන එන ලිපි මාලාවක ආරම්භය

12 පිටුව



2010 වසරේ හොඳම ආගමික පුවත්පත


# ඥානාර්ථ ප්‍රදීපය

ආරම්භය : 1866 ජූනි 07


**රදගුරු අබිසෙස් විශේෂ කලාපය**



ක්‍රිස්තු වර්ෂ 2012 ක් වූ පෙබරවාරි මස 05 ඉරිදා 146 වෙළුම 35 කලබ සතිපතා පත්‍රය - පිටු 24 - මිල රු. 20 QD/12/NEWS/2012 පුවත්පතක් ලෙස ලියාපදිංචි කරන ලදි.

## අගරදගුරු පදවි සහයක රදගුරු හිමි දෙනමගේ අභිෂේකය 11 වැනිදා කොටහේනේ දී







ඔර්ටාහි නාමධාරී අති උතුම් ෆිඩේලිස් ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ

DOMINUS VOBISCUM

'ස්වාමීන් වහන්සේ ඔබ සමඟ වන සේක්වා'





ලෙසිනාහි නාමධාරී අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණෝ

CIBAVIT EOS EX ADIPE FRUMENITI

'එතුමාණෝ ඉස්තරම් ධාන්‍යයෙන් ඔබ පෝෂණය කරන සේක'

### අගරදගුරු වසමේ සහයක රදගුරු වතගොත

1



අති උතුම් ඇන්තනි ද සේරම් රදගුරු හිමි
( 1963 - 1965)

2




අති උතුම් ෆ්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමි
( 1965 - 1968 )

3



අති උතුම් එඩ්මන්ඩ් ජේ. ප්‍රනාන්දු ඕ.ම.ඕ. හිමි
( 1968 - 1983 )

4



අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් රදගුරු හිමි
( 1968 - 1996 )

5



අති උතුම් මැල්කම් රංජිත් රදගුරු හිමි
( 1991 - 1996 )

6



අති උතුම් මේරියස් පීරිස් රදගුරු හිමි
( 2001 - මේ දක්වා)

7 - 8

අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමි
අති උතුම් මැක්ස්වල් සිල්වා රදගුරු හිමි
( 2012 සිට )

**පුදැදුරු මාහිමි පා එන්නේ දෙවියන් සිත ද දිනා දිනා....**

පදවියෙන් පදවියට

# පාකිස්තානයේ හිර බත් කන ශ්‍රී ලාංකික ධර්මදූතයා

**ශ්‍රී ලංකාවේ සංචාරක වීසා මත රැඳී සිටි ඉස්ලාමීය පූජක වරුන් 256 දෙනෙකුට වහා රටින් පිටවන ලෙස පසුගියදා කළ නියෝගයකට අනුව මුස්ලිම් ජනතාව සහ මුස්ලිම් ඇමතිවරු සිය අප්‍රසාදය පළකර සිටියහ. මෙම සිද්ධියෙන් දින කිහිපයකට පසු 2012 ජනවාරි 24 වන දින පාකිස්තානයේ සේවය කරන කතෝලික පියතුමකු ද එම රජය විසින් අත්අඩංගුවට ගෙන තිබුණි. එසේ අත්අඩංගුවට ගැනුනේ නිර්මල මරිය නිකායික ගරු ක්‍රිස්ට් සිල්වා පියතුමාවය.**



මෙතුමා පකිස්තානයේ ධර්මදූතික සේවාව සඳහා යවා ඇත්තේ 2007 ජනවාරි මාසයේ දීය. නොයෙකුත් තර්ජන හමුවේ පාකිස්තානයේ වෙසෙන කිතුනු ජනතාව වෙනුවෙන් වසර කිහිපයක් සේවය කර ඇති මෙතුමා අත්අඩංගුවට ගන්නා විට සේවය කරමින් සිටියේ මුල්ටාන්හි පිහිටි පූජක සහෝදර තුමන් පුහුණු කරන දෙව්සත්හලේ අධ්‍යක්‍ෂ පියතුමා ලෙසිනි.

මෙතුමා නිසි විදෙස් බලපත්‍ර සහිතව එහි සේවය සඳහා ගොස් ඇති අතර සෑම වසරක දී බලපත්‍ර දීර්ඝ කරගැනීම සඳහා අයදුම් කර එය නිසි පරිදි සිදුකරගෙන ඇත. මේ වර්ෂයේ දී ද ඒ සඳහා අයදුම් කොට ඇති අතර බලපත්‍ර ලැබෙන තෙක් ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන අවසර පත්‍රය ද ඒ අවස්ථාවේ දී එතුමා සතුව තිබී ඇත. සෑම වසරක දී ම බලපත්‍ර ප්‍රමාදවීම සාමාන්‍ය සිරිතක් වන අතර එය ආගමන විගමන දෙපාර්තමේන්තුවේ අකාරක්ෂමතාවය මත සිදුවන්නක් බව තතු දන්නෝ පවසති.

2012 ජනවාරි 25 වන දින පියතුමන් උසාවියට ඉදිරිපත් කර ඇති අතර උසාවි නියෝග මත 2012 පෙබරවාරි 7 දක්වා එතුමාව රක්ෂණ බන්ධනාගාර ගතකොට ඇත. 1973 වසරේ සිට මේ දක්වා වසර 39 ක් නිර්මල මරිය නිකායික ශ්‍රී ලාංකික පියතුමන් පාකිස්තානයේ වෙසෙන කතෝලික ජනතාවගේ ආත්මික අවශ්‍යතා මෙන්ම අධ්‍යාපනය, සෞඛ්‍ය හා අන්තර් ආගමික සබැඳියාව ගොඩනැගීමේ ලා ඉමහත් කැපවීමකින් සේවය කරන අතරම අන්‍යාගමික දුගී දුප්පත් අසරණ ජනතාවගේ අවශ්‍යතා අනුව ඔවුන්ගේ ද ජීවිත ගොඩනැගීමට ඉමහත් කැපවීමකින් සේවය කරනු ලැබේ. 39 වසරක් ධර්මදූත සේවය තුළ මෙවැනි ඛේදවාචකයක් සිදුවූ ප්‍රථම අවස්ථාව මෙය බව පවසන එහි සේවයේ යෙදී සිටින පියතුමන් ප්‍රකාශ කර සිටින්නේ ශ්‍රී ලංකාවේ රැඳී සිටි මුස්ලිම් මිෂනාරි 256 දෙනාට රටින් පිටුවහල් කිරීමට කළ නියෝගයට සමගාමීව මෙම සිද්ධිය සිදුකොට ඇති බවයි.

පාකිස්තානයේ වෙසෙන මුළු ජනගහනය 164741924 ක් වන අතර ඉන් 97% ක් මුස්ලිම් ජනයාත්, 3% ක් වෙනත් ආගම් අදහන සුළුතරයන් වේ. ඉස්ලාම් දහම අදහන ජනයාගෙන් 77% ක් සුන්නි මුස්ලිම් වන අතර 20% ක් සියා මුස්ලිම් වේ. මුළු ජනගහනයෙන් 1.6% ක ප්‍රතිශතයක් එනම් දෙකෝටි අටලක්ෂයක් පමණ කිතුනුවන් ජීවත් වේ. පාකිස්තානය තුළ අගරදගුරු පදවි දෙකක් සහ පදවි හතරක් පිහිටා ඇත. කතෝලික සභාව විසින් අධ්‍යාපනය සඳහා මහත් සේවාවක් කරන අතර කතෝලික පාසල් 542 ක් ඇත.

ලෝකයේ ක්‍රිස්තු භක්තිකයන්ට හිංසනය ගෙනදෙන රටවල් අතරින් ප්‍රධාන ස්ථානයක් පාකිස්තානයට හිමිවේ. දහමට අපහාස කිරීම හේතු කොටගෙන මරණ දඬුවම ලබාදෙන ලොව තිබෙන එකම රට පාකිස්තාන යයි. (Blasphemy Law) මෙම නීතිය යටතේ එරට බොහෝ අන්‍යාගමිකයින් මරණ දඬුවම ලබා ඇත. පකිස්තානයේ පවතින මෙම වාතාවරණය මත එහි ජීවත්වන කිතුනුවන් මෙන්ම අනෙකුත් ආගමිකයින් බොහෝ කලක සිට මහත් හිංසනයකට හා පීඩනයකට ලක්වී ඇත.

ගරු ඩිලාන් පෙරේරා නි.ම.නි පියතුමා

## නිළ නිවේදනයයි

කොළඹ උතුර (මීගමුව) කලාපීය ගරු පියවරුන් සඳහා ධර්ම විවේකයක් පෙබ්‍ර. 27-28 දිනයන්හි තේවත්ත ධර්ම විවේක ආශ්‍රමයේ දී පැවැත්වේ. සහභාගි වීම අනිවාර්යයයි.

කලාපීය නාහිමි
අතිගරු පැට්‍රික් පෙරේරා පියතුමා

## නිදහස් දිව්‍ය පූජාව ගුවන් විදුලියේ

**64 වන ජාතික නිදහස් දින සමරුව නිමිත්තෙන් පෙබරවාරි 04 වැනි දින අනුරාධපුර සා. ජෝසප් ආසන දෙව්මැඳුරේ පැවැත්වෙන දිව්‍ය පූජාව එදින පස්වරු 12.15 ට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්වදේශීය සේවය ඔස්සේ විකාශනය කැරේ.**

## නව සත්ප්‍රසාද කරඬුවක්

වැලිවිට සා. මරියා දේවස්ථානයට නව සත්ප්‍රසාද කරඬුවක් යුද සමයේ රට වෙනුවෙන් දිවි පිදු මේජර් රවි අලගියවන්න රණවිරුවා සිහි ගැන්වීමට බොදුනු දෙමාපියන් විසින් පරිත්‍යාග කරන ලදි.

සුසිල් හැරිසන්



තරුණ තරුණියන් ඇතුලු පිරිසක් ඉකුත්දා කිතු දහම වැළඳ ගත්හ. මේ අය අතරින් මූල ධර්ම වාදයට හසුවූ මං මුලා වූ අයද වෙති. එම මූල ධර්ම වාදීන්ගෙන් බේරී ඒමට නාත්තන්ඩිය මීසම් සේවක ගරු පීටර් උපාලි චර්චිල් පියතුමා ගත් උත්සාහය අපමණය. එතුමාගේ මඟ පෙන්වීම යටතේ වසර 37 ක නිහඬ සේවාවක් කරන නාත්තන්ඩිය කන්‍යාරාමයේ දිව්‍ය සංරක්ෂණයේ ගරු පැවිදි සොයුරියන්ගේ මඟ පෙන්වීම මීට ලැබුණු අතර මෙම තරුණ තරුණියන් කිතු දහමින් පෝෂණය කළේ දිව්‍ය සංරක්ෂණයේ ගරු එමෙල්ඩා පැවිදි සොයුරියයි.

සටහන - ජූඩ් නිමල් බර්නාඩ්, සේයා - ශ්‍රියාංගනි පිලීෂියා


## බටගමට දිවි කැප මොයිස් පියෙනි සගසුව සැප ලැබේවා නිතිනි

**ජනවාරි 27 දින අප අතරින් සමුගත් ගරු මොයිස් ෆර්නැන්ඩ් නිමනි පියතුමා සග සුව දිනන විට අවුරුදු 93 කි.**

1919 පෙබරවාරි 14 වන දින බෙල්ජියමේ නිම්ස්ටර් හි දී ලියෝපෝල්ඩ් මොයිස් සහ මරියා මොයිස් යුවළට දාව මෙලොව උපත ලබා මූලික අධ්‍යාපනික කටයුතු 1939 වන විට අවසන් කළ හෙතෙම දෙව්සත්හල් අධ්‍යාපනය කොර්බික්ලු (Korbeek Loo) හි දී සහ වෙලායිනස් (Velaines) හිදී සම්පූර්ණ කළේය. 1944 දී එතුමා තම පූජකවරය ලබාගත්තේය.

1946 නොවැම්බර් 4 වන දින ගරු මොයිස් නිමනි පියතුමා ශ්‍රී ලංකාවට සැපත් වූයේ ධර්මදූතවරයකු ලෙසය. තම පළමු වගකීම ලෙස මොරටුව මීසමේ සහයක ලෙස වැඩ බාරගත්තේය. 1947 දී පමුණුගම මීසමේ සහයක ලෙස ද 1949 දී දෙමටගොඩ මීසමේ වැඩ බලන මීසම් සේවක ලෙස ද සේවය කර 1949 ජූනි මාසයේ කටුකුරුන් ද මීසමේ මීසම් සේවක පියතුමා ලෙස පත් කරන ලදී. තම පූජක දිවියේ සුවිශේෂ කඩ ඉමක් පසු කරන්නේ වසර 22 කට ආසන්න කාලයක් (1955-1977) බටගම මීසමේ සේවය කිරීමෙනි. පසුව එතුමා පමුණුගම මීසමට 1977 දී පත්වූ එතුමා 1982 සිට බොල්ලත මීසමේ සේවය කර ඇත.

1992 සිට මිදෙල්ලවිට, අම්පිටිය (නිමනි දෙව්සත්හල) හා කොහුවල (නිමනි වැඩිහිටි නිවාසය - මේරියන් ග්‍රෝව්) යන ස්ථාන වල වාසය කළේ ය.



විදේශීය නිමනි ධර්මදූත වරයකු ලෙස ශ්‍රී ලාංකික කිතුනු කෙත අස්වද්දන්නට වසර 66 කට ආසන්න කාල වකවානුවක් කළ සේවයේ දී පෙරලා තම මව්බිම වන බෙල්ජියමට යාමට වත් උනන්දු නොවූ තරමට එතුමා මෙරටට ආදරය කළේ ය.

උන්වහන්සේ ජීවිතයෙ තිබූ බොහෝ යහපත් ගුණධර්ම අතරේ කැපී පෙනුනු ගුණාංගය වූයේ මුව පුරා පිරුණු දයාබර සිනාහවයි. එම සිනහව තුළ බොහෝ දෙනෙකු එතුමාට ආගන්තුකයෝ නොවූහ. ශ්‍රී ලාංකික නිමිනි සේවාවේ සුවිශේෂ චරිතයක් වූ හෙතෙම ජනතාවට ආදරය කළේ ඔවුන් දෙවිඳුන්ගෙන් ලද තිළිණ ලෙස අත්දකිමිනි.

එතුමාගේ අවසාන කාලයේදීවත් තම මව් රටට නොගිය එතුමාගේ ආශාව හා එකම ඉල්ලීම වූයේ තම මෘත දේහය බටගම මීසමේ භූමදාන කරන ලෙසය. එය ඒ ආකාරයෙන්ම සිදුවිය. එතුමාණන් සේවය කළ මීසම් වල ජනතාව එතුමා කව්ද යන බවට හෙඳම සාක්ෂීන්ය.

ගරු එස්. රන්දිල් ප්‍රනාන්දු නිමනි පියතුමා

## ගරු පීටර් රේවල් පුල්ලේ පිය සග සැපතේ වාර්ෂික සමරුව



මෙලොව උත්පත්තිය ලබන සෑම කෙනෙක්ම මරණයට පත්වන්නේ දෙවියන් වහන්සේ දානය කරන ලද හුස්ම උන්වහන්සේගේ අභිප්‍රාය පරිදි ලබා ගන්නා හෙයිනි. එසේ ලබා ගන්නා විට සුරලොව තුළ උත්පත්තිය ඇතිවන බව අපගේ විශ්වාසයයි. එබැවින් ජීවිතය අයිති උන්වහන්සේට යයි පල්ලන්සේන මීසම් සේවකව සිටි ගරු පීටර් රේවල් පුල්ලේ පියතුමා සමග සේවය කළ මීසම් සහයක ගරු සිසිර සමරකෝන් පියතුමා, ගරු රේවල් පුල්ලේ පියතුමා සග සැපත් වී වර්ෂ පූර්ණ සංවත්සරික දිව්‍ය යාගයේ දී පැවසීය.

ගරු සමරකෝන් පියතුමා සමඟ මීසම් සේවක ගරු ජයන්ත නිමල් පියතුමා ද ජපමාල නිකායේ කොච්චිකඩේ ප්‍රාදේශීය දෙව්සත්හලේ ගරු අනිල් ප්‍රියශාන්ත පියතුමා ද දිව්‍ය යාගය පැවැත් වූහ. ඉකුත් ඉරුදින මීසම් වාසීන් සියළුදෙනා තම දිවා ආහාරය රැගෙන පැමිණි අතර විශේෂ දේව මාතා දේවස්ථාන භූමියේ දී මීසම් සේවක පියතුමා ආසිරි ගැන්වීමෙන් පසු සග සැපත් පියතුමාගේ ඥාතීන් විසින් දුගී පවුල් වෙත වාර්ෂික දානය පිරිනමන ලදී.



මෙල්වින් ද කොස්තා

## කෝපියාවත්තේ පුබුදු සුබ සාධක හා මරණාධාර සමිතිය රජත ජයන්තිය සමරයි

**ආගම්, ජාති භේදයෙන් තොරව ගමේ සැමම එකමුතු වෙලා මේ ආ..... ගමන ඉතාමත් ප්‍රහංසානීයයි. අවුරුදු 25 ක් සමරන්න තරම් කෝපියාවත්ත ජනතාව ධනාත්මක චින්තනයෙන් කැපවීමෙන් වැඩකරලා තියනවා. රාගම කෝපියාවත්තේ සුබ සාධක සහ මරණාධාර සංගමයේ 25 රජත ජයන්ති උලෙළේ ප්‍රදාන අමුත්තා වශයෙන් පැමිණි හපුගොඩ මීසම් සේවක ගරු ඉවොන් රසික පියතුමා පැවසීය.**

එම සංවත්සර උත්සවයට පෙර දින කෝපියාවත්ත පුබුදු මාවතේ සැකසුණ විශේෂ මණ්ඩපයේ ජේසුතුමන්ට තුති පිදීමේ දිව්‍ය පූජා යාගයක් පැවැත්විය.

ක්‍රිස්ටෝපර් සිල්වා



## කතෝලික මුද්‍රණාලයේ ජංගම පොත් අලෙවි හල

පෙබරවාරි 4-5 නායකකන්ද සා. මරියා දෙව්මැඳුර
පෙබරවාරි 10-11 කිඹුලාපිටිය ලූර්දු මාතා සිද්ධස්ථානය

## භාග්‍යවත් ජුසේ වාස් මුනි තෙශත සංවත්සර සමාප්ති උලෙළ

**භාග්‍යවත් ජුසේ වාස් පියතුමා සගසැපතේ තෙවන ශත සංවත්සර අගරදගුරු පදවි සමාප්ති උලෙළ කොළඹ නව සහයක රදගුරු ලෙස නම් කර සිටින අතිගරු මැක්ස්වල් සිල්වා මාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් කලමුල්ල මීසමේ ජේසු බිළිඳු දෙව්මැඳුරේ දී පැවත් විය.**

ක්‍රි. ව. 1697 දෙසැම්බර් 24 දින මැදියම් රැයේ දිව්‍ය පූජාව පැවත්වූ කලමුල්ල කන්‍යාරාමය අසල භූමි භාගයේ ඉදිකර ඇති උන්වහන්සේගේ ප්‍රතිමාව අසල සිට පැමිණි පෙරහරකින් පසු මාහිමිපාණන් පිළිගෙන තූර්යවාදක කණ්ඩායම පෙරටුව දෙව්මැඳුර කරා කැඳවා ගෙන එන ලදි. මේ අවස්ථාවට භාග්‍යවත් ජුසේ වාස් කමිටුවේ ගරු ආචාර්ය ඇන්තනි ප්‍රනාන්දුපුල්ලේ නැගෙනහිර කලාපීය නාහිමිපාණන් ද, කළුතර දිසා නායක ගරු ජූලියන් තිසේරා, කලමුල්ල මීසම් සේවක ගරු මොරිස් නාමල්, සහයක ගරු රුවන්ත ප්‍රනාන්දු පියතුමන් ද සහභාගි විය.

ඇන්ටනි ප්‍රනාන්දු

ඥානාර්ථ ප්‍රදීපය

ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල පුවත්පත

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8, දු.ක. 2695984, 4899611 ෆැක්ස් 2692586
ඊමේල්: pradeepaya@yahoo.com, වෙබ් අඩවිය: www.colombocatholicpress.lk

ක්‍රිස්තු වර්ෂ 2012 පෙබරවාරි 05 ඉරිදා

# නවක සහයක රදගුරු හිම්පාණනි !

කොළඹ අගරදගුරු පදවියට තවත් සහයක රදගුරු දෙනමක් ලත් පත්වීම අසා අපි මහත් සේ ප්‍රසාදයට පත් වූයෙමු. විශේෂ කොට කොළඹ අගරදගුරු පදවියේ කතෝලික ජන ඝනත්වය සලකා බලමිනුත් එලෙසම විහිද ගොස් ඇති මීසම් සංඛ්‍යාව හා තවත් වැඩිවන මීසම් ව්‍යුහය අනුවත් අග්‍රරාජගුරු ප්‍රසාදින් වහන්සේට සියල්ල තනිව ඉටු කිරීමේ තිබෙන අසීරුතාවය සලකා බලා කළ ඉල්ලීමක් අනුව ශුද්ධාසන අනුමතිය තුළ ඔබ තුමන් පත්වීම ලද බව අපි දනිමු. කාලයේ සලකුණු නිවැරදිව කියවමින් විය යුතු දෙය පසෙකට නොදමා අදම ඉටු කළ යුතු බැවිනුත් මේ පත්වීම කොළඹ අගරදගුරු පදවියට පමණක් නොව මුළු මහත් ශ්‍රී ලංකා වාසී කතෝලික ජනතාවටම අමන්දානන්දයට පත්වීමට හේතුවක් වී ඇති බව පැවසීම අරුමයක් නොවේ.

මේ වන විට මුළු මහත් අගරදගුරු පදවියම ප්‍රතිව්‍යුහගත සැලසුමකට බඳුන් වී සිටී. කලාප අනුව හා දිසා අනුව නව නිර්ණය කිරීම් සැලසුම් සහගත ලෙස ඉටු කරන්නට විවිධ සාකච්ඡා ඇති වෙමින් පවතී. බොහෝමයක් දේවස්ථාන අරබයා ශත සංවත්සරයන් ඉක්මවා යන ජයන්ති මහෝත්සව පවත්වන්නට පිඹුරු පත් සකස් වෙමින් පවතී. ඒ සියල්ලට වඩා ගිහි ජනතාව හා කිට්ටු සහසම්බන්ධතාවයක් තුළින් දේව වචනයේ සැබෑ හරය විවර කරන්නට පැවදි පූජක පක්ෂය වෙත පැවරෙන යුතුකම් ඉහළ යමින් පවතී.

එහිදී නිවැරදි නායකත්වයක් හා ඍජු ප්‍රතිපත්තිමය දැක්මක් සහා නායකත්වය තුළින් ඉල්ලීමේ හඬටද ඉහළ ඉල්ලුමක් පවතින බව රහසක් නොවේ. කලාපීය කරණය හා නව දිසා නිර්ණය කොට වඩාත් හරවත් හා විධිමත් පරිපාලන සේවාවක් තුළින් එඬේරික දූත කාර්යයට සැබෑ අධ්‍යාත්මික ජීවය පොවන්නට ගන්නා වූ තීරණ විධිමත්ව බලාත්මක කරන්නට හා පරිධිය සමතුලිත කරන්නට කේන්ද්‍රිය වටිනාකම ඉහළ නැංවෙන නිසා ඒ කේන්ද්‍රයේ සිට ක්‍රියාත්මක වීමට යෝග්‍ය කාලය උදාවී ඇත.

නව සහයක රදගුරු හිම්පාණනි, ෆිඩෙලිස් ලයනල් එම්මානුවෙල් නාමය තුළ ඔබ තුමනට දැන් රදගුරු මාවත විවර වන යුගයයි. දමිළ - සිහල ඒකාත්මිකත්වයක් තුළ කතෝලික අධ්‍යාත්මයේ සැබෑ ජීව හඬ ගොඩ නඟන්නට ඔබ තුමන්ට පැවරෙන වගකීම සුළුපටු නොවේ. පොදු බව තුළ, ජාතිකත්වය ඉක්මවා යන කතෝලික හර පද්ධතිය තුළට සහෝදරත්වයේ දැක්ම ලං කරන්නට සුදතුම් වරම් ලැබී ඇති ඔබවහන්සේගේ ඒ ගමන ජීවයෙන් බල සහිත බවට පත්කරන්නට සවිමත් විය යුතුයි. අග නගරයේ සිහල - දමිළ සහෝදරත්වයේ සැබෑ පාලම බවට පත් විය යුතුයි. ශක්තිමත් පදනමක් තුළ දකුණේ දමිළ කතෝලික ශක්තියට ශක්තියක්ම විය යුතුයි. 'Dominus Vobiscum' වදනින් අර්ථ ගැන්වෙන ඔබ එඬේරික සේවාව අර්ථවත් කරන්නට 'ස්වාමින් වහන්සේ ඔබ සමඟ වන සේක්වා' යන්න අපගේත් පැතුමයි.

නව සහයක රදගුරු හිම්පාණනි, මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා යන ඔබ නාමය තුළ ඔබ තුමන්ටත් දැන් රදගුරු මාවත විවර වන යුගයයි. සංවේදිව හා ලයාන්විතව අධ්‍යාත්මික පරිනත බවක් ජීවිතයෙන් හුවා දක්වමින් එඬේරිය කාර්යය භාරය ඉටු කරන්නට ඔබ තුමන් ලත් කැඳවීම අර්ථවත් කරන්නට දැන් කාලය එළඹ ඇති හැඩයි. අධ්‍යාපන තලයේ දිගු කාලයක් සේවා දැක්ම විහිද හැර ඇති ඔබ වහන්සේට දැන් අර්ථයෙන් හා ධර්මයෙන් ශ්‍රී ලාංකේය කතෝලික සසුන් කෙත අස්වද්දන්නට නොමඳ වරමක් හිමිවී ඇති බව පැහැදිලිය. ප්‍රති ව්‍යුහගතකරණයට ලක්වී ඇති කොළඹ පදවිය තුළ වඩාත් හරවත් හා ප්‍රායෝගික ක්‍රියා දැක්මක් හරහා ඔබතුමන්ගේ දූත කාර්යය විහිද යවන්නට එහි පරිනත වැඩිහිටි ක්‍රිස්තු දේහයක් ගොඩ නැංවීමේ මහා භාරදූර කර්තව්‍යය මුල ආරම්භයේ පටන්ම ශක්තිමත් කරන්න. 'Cibavit Eos Ex Adipe Frumeniti' යන ගීතාවලියේ සැබෑ පහන් වැකිය අනුව 'එතුමාණෝ ඉස්තරම් ධාන්‍යයෙන් ඔබ පෝෂණය කරන සේක' යන්න අපගේත් ප්‍රාර්ථනාවයි, යාච්ඤාවයි.

**චිරං ජයතු නව සහයක රදගුරු හිම්පාණනි!**

# ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා!



මීට හතලිස් හතර වසරකට පෙර එනම් වර්ෂ 1968 ජූලි මස 17 **පොහෝ දිනයේ දී කොළඹ කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේ දී කොළඹ අගරදගුරු අති උතුම් තෝමස් කාදිනල් කුරේ හිම්පාණන් අතින් කොළඹ අගරදගුරු වසම සඳහා ඉතිහාසයේ මුල්වරට සහයක රදගුරු හිම්පාණන් දෙනමක් එක්වර අබිසෙස් ගන්වන ලදී. එදා සහයක රදගුරු වරයට එසැවුණේ අති ගරු ඔස්වල්ඩ් ගෝමිස් හා අති ගරු එඩ්මන්ඩ් ජේ. ප්‍රනාන්දු මාහිම්පාණන් ය.**

ලබන සෙනසුරාදා එනම් 2012 පෙබරවාරි 11 වැනිදා කොළඹ කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේ දී කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිම්පාණන් අතින් කොළඹ අගරදගුරු වසම සඳහා හතලිස් හතර වසරකට පසුව එකවර සහයක රදගුරු හිම්පාණන් දෙනමක් අබිසෙස් ගන්වනු ලැබේ. මෙදා සහයක රදගුරු වරයට ඔසොවන්නේ අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු හා අතිගරු මැක්ස්වල් සිල්වා මාහිම්පාණන් ය.

කොළඹ අගරදගුරු වසමේ දූත සේවාවේ දී සහයක රදගුරු හිම්පාණන් දෙනමකගේ සේවය කලින් කල ලැබී ඇති බැව් ඉතිහාසය පිරික්සීමේ දී පෙනී යයි. එහෙත් සහයක රදගුරු හිම්පාණන් දෙනමක් එකවර අබිසෙස් ගැන්වෙනුයේ 1968 ට පසු 2012 දී ය. එනම් වසර 44 කට පසුවය. ඒ සමඟම මෙවර නව සහයක රදගුරු හිම්පාණන් දෙනම පත්වීමත් සමඟ කොළඹ අගරදගුරු වසමට සහයක රදගුරු හිම්පාණන් තෙනමකගේ සේවාව ලැබේ. කොළඹ අගරදගුරු පදවි සහයක රදගුරු වශයෙන් දැනටත් සේවය කරන අති උතුම් මේරියස් පීරිස් හිම්පාණන් සමඟ නව රදගුරු හිම්පාණන් දෙනමද එක්වෙති.

කොළඹ අගරදගුරු වසම රදගුරු හිම්පාණන් බිහිකරන 'තිඹිරි ගෙය', 'රදගුරු තවාන' ආදී අන්වර්ථ නාමයන්ගෙන් හඳුන්වන්නට පටන් ගත්තේ අද ඊයේ සිට නොවේ. ආසියාවේ විශාලතම රදගුරු වසම ලෙස ඓතිහාසික වටිනාකමින් මෙන්ම සමාජ, ආර්ථික, සාමයික හා ආධ්‍යාත්මික වටිනාකමින් ද පොහොණි වීම මත එවැනි උරුම හිමිකමකට එය වරම් ලබා ඇතැයි හැඟේ. කොළඹ අගරදගුරු වසම එවැනි පුරෝගාමී උරුමයකට හිමිකම් කියද්දී මෑතක, පටන් 'රදගුරු තවාන' වන කොළඹ අගරදගුරු වසමේ 'රාජගුරු මව්කුසය' බවට ගහට ගහක් මුණ ගැසෙන මොරටුව පත්වෙමින් සිටීදෝයි කුකුසක් මතුවේ. ඒ මෙවර සහයක රදගුරු වරයට නම් කළ අති ගරු මැක්ස්වල් සිල්වා මාහිම්පාණන් මොරටු පූජක පුතකු (විල්ලෝරාවත්ත) නිසාවෙනි. මොරටුව ගම් 18 කින් සුසැදි පුරෝගාමීන්ගේ පුරවරයයි.

ශ්‍රී ලංකා කතෝලික රදගුරු සමුළුවේ දැනටමත් රදගුරු හිම්පාණන් තෙනමක් මොරටු පුත්‍රයෝ වෙති. අති උතුම් මේරියස් පීරිස්, අති උතුම් වින්ස්ටන් ප්‍රනාන්දු දිසනි හා අති උතුම් දෙව්ශ්‍රිත වැලන්ස් මෙන්ඩිස් හිම්පාණෝ මොරටු පුත්‍රයෝ වෙති. අති උතුම් මැක්ස්වල් සිල්වා හිම්පාණන්ගේ පත්වීමත් සමඟ මේ සංඛ්‍යාව හතර දක්වා ඉහළ යති.

1968 දී කොළඹ අගරදගුරු වසමට සහයක රදගුරු හිම්පාණන් දෙනමක් ලබාදෙමින් ශුද්ධාසනය නිවේදනය නිකුත් කළේ ජූනි 23 වැනිදාය. එම සහයක රදගුරු හිම්පාණන් අබිසෙස් ගැන්වූයේ මෙරට ප්‍රථම කාදිනල් තුමන් අතිනි. එනම් අතිඋතුම් තෝමස් කාදිනල් කුරේ නි.ම.නි හිම්පාණන් අතිනි. එදා අබිසෙස් ගැන්වූ අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමි පසුව කොළඹ අගරදගුරු වසමේ මහ පුදැදුරාණන් ලෙස ද සේවය කළේ ය. 2012 දී කොළඹ අගරදගුරු වසමට රදගුරු හිම්පාණන් දෙනමක් නැවත වරක් නම්කර ඇති මේ අවස්ථාවේ කොළඹ අගරදගුරු වසමේ මහා පුදැදුරාණන් අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිම්පාණෝ වෙති. නැවතත් කාදිනල් හිම්පාණන් නමක අතින් අබිසෙස් ලබන්නට සහයක රදගුරු හිම්පාණන් දෙනමක් වරම් ලබති.

එදා මෙන් නොව අද දියුණු තාක්ෂණය හමුවේ පවා කොළඹට පත්වන අලුත් බිෂොප්ලා ගැන තැන තැන කසු කුසු මතු වු අන්දම රහසක් නොවේ. ඒ සඳහා ඉදිරිපත් වූ නම් ගම් ද රැසකි. එහෙත් ඒ සියලු දේ පසකලා අවසානයේ දේව කැමැත්ත ලෙස සියල්ල ඉෂ්ඨ සිද්ධ විය. හෙට දවසේ කොළඹ අගරදගුරු වසමේ යෝජිත ප්‍රතිව්‍යුහගත සැලසුම් සමඟ නවෝදයක මාවත ඔස්සේ පිය නගන්නට වරම් ලැබේවා යන්න සැදැහැ ප්‍රාර්ථනයයි. නව සහයක රදගුරු හිම්පාණෙනි!

ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා!

ශිරාන් මෛත්‍රී

## කැමිලස්ගේ — තිත්ත ඇත්ත



# රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ ත්‍රිත්වීය කාර්ය භාරයන්



"රාජගුරු ප්‍රසාදීන් වහන්සේ තම දූත කාර්ය තුළින් කතෝලික සභාවේ සුවිශේෂ ලක්ෂණ යථාර්ථයට නංවයි. එයනම්, ක්‍රිස්තුන් වහන්සේ විසින් මෙලොවට ගෙන ආ ගැලවීම පූර්ණත්වයට පත් කිරීමයි."

**මා මෙහිදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ රාජගුරු ප්‍රසාදිතුමකුගේ ත්‍රිත්වීය කාර්ය භාර්යයන් හා වගකීම් සම්භාරය පිළිබඳවයි.**

මෙම ත්‍රිවිධ කාර්යයන් ඉටුකිරීම සඳහා තත්කාලීන සළකුණු සියුම් ලෙස පරීක්ෂා කර බැලීම ද ඒ සළකුණු වල අර්ථය සුවිශේෂාලෝකයෙන් අර්ථකථනය කිරීම ද අපේක්ෂා කෙරේ. එමෙන්ම ජනතාව නිරන්තරයෙන් අසන ප්‍රශ්න වලට එක් එක් පරම්පරාවට අවබෝධ වන අයුරින් පිළිතුරු දීමට, අප ජීවත් වන ලෝකය ද, එහි අපේක්ෂාවන් හා දැඩි ආශාවන් ද, බොහෝවිට දක්නට ලැබෙන චමත්කාරජනක ලක්ෂණයන් ද හඳුනාගෙන තේරුම් ගැනීම ද අවශ්‍ය වන්නේ ය.

අද අපි මිනිස් ඉතිහාසයේ නව අවධියක ගමන් කරමින් සිටිමු. සීඝ්‍රයෙන් ලෞකීකකරණය වන චකවානුවක, මානුෂික හා අධ්‍යාත්මික සාරධර්මයන් අවතක්සේරුවකට පත්වී ඇති යුගයකට අවතීර්ණ වී ඇති වත්මන් ලොවේ රදගුරු භූමිකාව ඉටුකිරීම පහසු කාර්යයක් නම් නොවේ.

රාජගුරු ප්‍රසාදීන් වහන්සේ කෙනෙකුගේ ත්‍රිත්වීය කාර්ය භාරයන් වනුයේ ධර්මය ඉගැන්වීම, ජනතාව ශුද්ධවන්ත කිරීම හා නායකත්වයේ වගකීම් දැරීම වේ. පියාණන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ මෙලොවට එවන ලද්දේ දිවැසිවර, පූජක හා රාජකීය දූත කාර්යයන් ඉටුකිරීමට ය. මෙම ත්‍රිවිධ කාර්යභාරයන් එකිනෙකට වෙනස් වුව ද ඒවා අතර කිට්ටු අන්තර් සම්බන්ධතාවයක් පවතී.

## රාජගුරු ප්‍රසාදින් වහන්සේගේ ගුරු භූමිකාව

රාජගුරු ප්‍රසාදි තුමකුගේ ප්‍රථම දූත කාර්ය වන්නේ අප ගුරු දේවයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අනුව යමින් එතුමන්ගේ ගුරු භූමිකාව ක්‍රියාවට නැංවීමය. "මෙසේ උන්වහන්සේ ඔවුන්ගේ පාද සෝදා තමන් උතුරු සළුව හැඳගෙන නැවත හිඳගත් කළ ඔවුන්ට මෙසේ වදාළ සේක. මා ඔබට කළදේ කිමෙක් දැයි ඔබ දන්නහු ද? 'ගුරුදේවයනි', 'ස්වාමිනි' කියා ඔබ මා අමතන්නහුය. එසේ කීම හරිය; මම එසේ වෙමි. ඔබේ ස්වාමින් ද ගුරුදේවයාණන් ද වන මම ඔබේ පාද සේදුවෙම් නම්, ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතුය. මම ඔබට කළාක් මෙන් ඔබත් කළයුතු බවට ආදර්ශයක් මම දුනිමි (ජුවාම් 13:12-15).

රාජගුරු ප්‍රසාදීන් වහන්සේ තම දූත කාර්ය තුළින් කතෝලික සභාවේ සුවිශේෂ ලක්ෂණ යථාර්ථයට නංවයි. එයනම්, ක්‍රිස්තුන් වහන්සේ විසින් මෙලොවට ගෙන ආ ගැලවීම පූර්ණත්වයට පත් කිරීමයි. මෙම දූත කාර්ය වනුයේ ක්‍රිස්තුන් වහන්සේගේ සුභාරංචිය කිසිදු අඩුවක් නොමැතිව සකල ජනතාවට ප්‍රකාශ කිරීමයි. රාජගුරු ප්‍රසාදීන් වහන්සේ 'දේව වචනය' පදවියේ කිතුනු ජනතාවට පමණක් නොව සමස්ත ජනතාවටම ප්‍රකාශ කිරීමට බැඳී සිටියි. මෙය ගුරු නිලයේ ධර්මදූතික පැතිකඩයි. සභාවේ දූත කාර්ය කිතු සමිඳුන්ගේ දූත මෙහෙවර නොකඩවා ඉදිරියට ගෙනයාමයි. "පියාණන් වහන්සේ මා එවා වදාළාක් මෙන් මම ද ඔබ යවමි යැ යි" ඔවුන්ට කී සේක (ජුවාම් 20:11) ක්‍රිස්තුන් වහන්සේ සිය ශ්‍රාවකයන්ට හා සුදු සබයට ක්‍රියාශීලී දූත මෙහෙවර සඳහා පියාණන් වහන්සේගෙන් උන්වහන්සේ ලත් ශුද්ධාත්ම බලය පවරා දෙයි. මෙම ධර්මය ඉගැන්වීමේ කාර්ය බාරයට ධර්මය ප්‍රකාශ කිරීම, ධර්මෝපදේශය හා ශුභ අස්න දේශනා කිරීම යන ත්‍රිත්වීය ක්‍රියාවලින් අනිවාර්යයෙන්ම අයත් වේ. ශුද්ධ වූ ත්‍රිත්වයේ නාමයෙන් බෞතිස්මය ලබාදීම මඟින් ශ්‍රාවක සංඝ බිහිකිරීම, දේව පනත් අනුසාර කිරීමට ඔවුන්ට ඉගැන්වීම, අන්‍යෝන්‍ය ප්‍රේමය හා දිව්‍ය රාජ්‍යයේ වටිනාකම් ඔවුන් තුළ ප්‍රගුණ කිරීමෙන් චරිත වර්ධනයක් හා අධ්‍යාත්මක පරිවර්තනයක් ඇති කිරීම මෙම දූත මෙහෙවරේ හි අන්තර් ගත වේ. ක්‍රිස්තුන් වහන්සේ පවසා ඇත්තේ මෙම දූත මෙහෙවර ක්‍රියාත්මක කිරීමේ දී උත්ථාන වූ උන්වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන් සමඟ සිටින බවය. සෑම රාජගුරු ප්‍රසාදින් වහන්සේ කෙනෙක්ම පෞද්ගලිකව මෙම දූත මෙහෙවරෙහි නියැලීම අනිවාර්ය වේ.

ක්‍රිස්තුන් වහන්සේ සුදු සභයට පැවරූ දූත කාර්ය පූර්ණත්වය කරා ගෙනයාමට තව බොහෝ දුරක් යා යුතුවේ. ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් පමණ සංඛ්‍යාවක් ක්‍රිස්තුන් වහන්සේ මෙසේ හඳුනාගෙන නොමැති බව සංඛ්‍යා ලේඛන සනාථ කරන අතර ස්වර්ගීය පියාණන් වහන්සේ ඔවුන්ට ප්‍රකාශ වීමට අපේක්ෂාවෙන් සිටින බව ද නොරහසකි.

ගුරුවර කාර්ය ඉටු කිරීමේ දී රාජගුරු ප්‍රසාදීන් වහන්සේ හුදෙක් බලධාරියෙක් මෙන් නොව දේව වචනය ගැඹුරින් වටහාගත් ගුරුවරයෙකු මෙන් කටයුතු කිරීමට බැඳී සිටියි. තමා අමතන ජනතාවට තේරුම් ගතහැකි පරිදි ආධ්‍යාත්මික පදනමක් මත පිහිටා දේව වචනය ප්‍රකාශ කළ යුතුවේ. සභා නීතියට අනුව රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ ගුරු කාර්ය භාරයේ තවත් විශේෂ අංගයක් වනුයේ දේව වචනය හඳුන්වා දී එහි අන්තර්ගත ධර්මෝපදේශය පැහැදිළි කරදීමයි. එසේම කතෝලික අධ්‍යාපනය වර්ධනය සඳහා උත්සුක වීම සමාජ ජන සන්නිවේදනයට අවධානය දීම ද එම කාර්යයට අයත් වේ.

රාජගුරු ප්‍රසාදින් වහන්සේ සැමවිටම දේව ධර්මය පිළිබඳව අවධියෙන් සිටිය යුතුය. ධර්මයේ නිවැරදිභාවය ආරක්ෂා කිරීම එතුමාගේ වගකීම වන හෙයින්, මෙහිදී කතෝලික සභාවේ ධර්මෝපදේශය පිළිබඳව වර්ෂ 1992 දී නිකුත් වූ ග්‍රන්ථය ඉමහත් පිටුවහලක් වනු ඇත. එමෙන්ම රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සිය ගුරු කාර්ය භාරය ක්‍රියාවට නැංවීමේ දී කිතුනු විශ්වාසය හා කිතුනු ජීවිත තුළින් පිළිබිඹු කෙරෙන සාරධර්ම සභාවේ ඉගැන්වීම් වලට අනුකූල විය යුතුවේ. එසේම එතුමා විවිධ මානව, සමාජීය, මනෝවිද්‍යාත්මක, දේශපාලන, ආර්ථික, වෛද්‍ය විද්‍යාව ආදී විෂයයන් හී සැඟවී ඇති සත්‍ය අවබෝධ කරගැනීමේ හැකියාව නතුකර ගත යුතුයි. කෙටියෙන් කිවහොත් මානව යථාර්ථය ප්‍රත්‍යක්ෂ කරගැනීමට සමත් විය යුතුය.

## ජනතාව පාරිශුද්ධ කිරීම සඳහා රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ භූමිකාව

රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ දෙවන කාර්යභාරය වනුයේ ජනතාව පාරිශුද්ධවත් කිරීමය. සුබ අස්න පාරිශුද්ධත්වය හඳුන්වනුයේ ප්‍රේමයේ පාරිශුද්ධත්වය වශයෙනි. "මම යහපත් එඬේරා වෙමි. යහපත් එඬේරා බැටළුවන් වෙනුවෙන් තම ජීවිතය පූජා කරන්නේ ය" (ජුවාම් 10:11). 'යහපත් එඬේරා' ක්‍රිස්තුන් වහන්සේ අප ඉදිරියේ තබන පරමාදර්ශයයි. රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ දූත කාර්ය ක්‍රිස්තුන් වහන්සේට දක්වන ජීවමාන සාක්ෂියක් විය යුතුයි. ක්‍රිස්තුන් වහන්සේ පේදුරු තුමාගෙන් ඇසූ ප්‍රශ්නය රාජගුරු ප්‍රසාදීන් වහන්සේගෙන් ද අසනු ඇත......... "ඔබ මට ප්‍රේම කරන්නෙහි ද?" (ජුවාම් 21:15) ක්‍රිස්තුන් වහන්සේ තම බැටළුවන් බාරදෙන හැම අවස්ථාවකදීම බලාපොරොත්තු වනුයේ මෙම ප්‍රේමයේ ප්‍රකාශන යයි. යහපත් එඬේරෙකු වීමට ඇති එකම මාර්ගය ද මෙයයි. එනම් ක්‍රිස්තුන් වහන්සේට හා තම බැටළුවන්ට ප්‍රේම කිරීමේ මාර්ගයයි. ඔබ මට ප්‍රේම කරන්නෙහි ද? යනුවෙන් ක්‍රිස්තුන් වහන්සේ බලාපොරොත්තු වන්නේ කුමන ආකාරයක ප්‍රේමයක් ද? ඉතා පවිත්‍ර ප්‍රේමයකි. රාජගුරු ප්‍රසාදීන් වහන්සේ ක්‍රිස්තුන් වහන්සේ සමඟ ගැඹුරු ප්‍රේම සම්බන්ධතාවයක් පැවැත්විය යුතුයි. "මට නම් ජීවත් වීම ක්‍රිස්තුන් වහන්සේ උදෙසා ජීවත්වීමයි" (පිලිප්පි 1:21). ක්‍රිස්තුන් වහන්සේ සමඟ ඇති කරගන්නා මෙම ප්‍රේම සම්බන්ධතාවය හේතු කොට ගෙන රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා තුළ ජනිතවන අනන්‍යතාවය ප්‍රසාද නිධාන දානය කිරීමේ දී මනාව ප්‍රත්‍යක්ෂ වනු ඇත. දේව ජනතාව ශුද්ධවන්ත භාවය සඳහා දැඩි පිපාසයෙන් සිටී. ඔවුන්ට එය ලබාදිය හැකි මාර්ග වන්නේ ප්‍රසාද නිධාන හා ජන වන්දනාවයි. රාජගුරු ප්‍රසාදීන් වහන්සේ මෙම පිළිවෙත් තුළින් ප්‍රකාශ කෙරෙන දිව්‍ය අභිරහස් විශ්වාසය තුළ නිරාවරණය කිරීමට මෙන්ම තම ජීවිත සාක්ෂියෙන් ප්‍රකාශ කිරීමට ද බැඳී සිටී. මෙම කාර්යයන් ඉටු කිරීමේ දී වඩාත් වැදගත් වනුයේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ පෞද්ගලික ශුද්ධවන්ත බවයි. ක්‍රිස්තුන් වහන්සේ තම ශ්‍රාවකයන් ගෙන් එදා ඇසූ ප්‍රශ්නය මෙය මනාව පැහැදිලි කර දෙයි. "මා කවරෙකු කියා ඔබ කියන්නහු දැ"යි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. "ඔබ ක්‍රිස්තුවරයාණෝ" ය යි පේදුරු පිළිතුරු දුන්නේ ය. මින් අදහස් වන්නේ ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව දැනගැනීම නොව උන්වහන්සේ අප ජීවිත තුළ අත්දැකීමයි. දැන් ජීවත් වන්නේ මා නොවේ. ක්‍රිස්තුන් වහන්සේ මා තුළ ජීවත් වන සේක" (ගලාති 2:20).

ක්‍රිස්තුන් වහන්සේ මා කවරෙකු දැයි ඔබ කියන්නෙහි ද? යන පැනය ශ්‍රාවකයන්ගෙන් අසා වදාළේ සෙසරියා පිලිප්පි හී දීය. සෙසරියා පිලිප්පි යනු "පිලිප්පි කයිසාරියා" නමින් හැඳින් වූ ප්‍රදේශ යයි. බයිබලීය පුරාවිද්‍යාව තුළින් හෙළිවන කරුණු කාරණා අනුව පිලිප්පි කයිසාරියා විවිධ දේව මාලිගා වලින් පිරුනු ප්‍රදේශයක් විය. සීසර් ඔගස්තස් අධිරාජ්‍යයා වෙනුවෙන් කැපවූ දෙව් විමනක් හා බාල් දෙවියන්ට මෙන්ම වෙනත් ස්වභාවික දෙව් දේවතාවුන්ට කැපවුනු වන්දනා ස්ථාන හා ඒවාට වන්දනා මාන පිදූ බැතිමතුන්ගෙන් පිරුණු ප්‍රාන්තයක් ද විය. ක්‍රිස්තුන් වහන්සේ "ඔබ මා කවරෙකු යැයි කියන්න හු ද? යන ප්‍රශ්නය උන්වහන්සේගේ ශ්‍රාවකයන් ගෙන් අසා වදාළේ එවන් පරිසරයක දී ය. අද අපි ජීවත් වනුයේ ද නූතන පිලිප්පි කයිසාරියක නොවේ ද? වස්තුව, බලය, නම්බුව, කාමය, රාගය, බේබදු කම, සල්ලාලකම දේවත්වයෙන් පිදෙන යුගයක නොවේ ද? මෙවන් පරිසරයක ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ අපගේ ස්ථාවරය කුමක් ද?

## රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ සේවක නායකත්වයේ භූමිකාව

වත්මන් සමාජයේ දේශපාලන ක්ෂේත්‍රයේ යහපාලනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන බව පෙනේ. එහෙත් යථාර්ථය ඊට හාත්පසින්ම වෙනස් ස්වරූපයක් ප්‍රකාශ කරයි. මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි. එහෙත් අද ජනතා සේවයට නොහොත් පරාර්ථකාමී සේවය අභිබවා ආත්මාර්ථකාමී බව ඉස්මතු වී ඇත. "බලය දූෂිතය, අසීමිත බලය අසීමිතව දූෂිත කරයි" යනුවෙන් ඇක්ටන් සාමිවරයා ප්‍රකාශ කරයි. ක්‍රිස්තුන් වහන්සේ තමන් වහන්සේගේ නායකත්වය යහපත් එඬේරා තුළින් පිළිබිඹු කර ඇත. යහපත් එඬේරෙකු වීමට නූතන යුගයේ අභියෝග රාශියක් අභිබවා යා යුතුයි. එසකියෙල් දිවස් ප්‍රසාදිතුමා, ජනතාවගේ එඬේරා බවට පත්වීමට දෙවිමහෝත්තමයාණන්ගේ අභිප්‍රාය මෙසේ ප්‍රකාශ කරයි. "මහෝත්තම දෙවිස්වාමින් වහන්සේ මෙසේ වදාරණ සේක. "බලන්න මම ම මගේ බැටළුවන් ගැන සොයා බලා, උන් රැකබලා ගනිමි" (එසකියෙල් 34:11) රාජගුරු ප්‍රසාදීන් වහන්සේ මෙම මූලික සත්‍යතාවය එනම් යහපත් බැටළු එඬේරාණන් සැමවිටම දෙවිමහෝත්තමයාණන් වහන්සේ බව සිහිතබා ගෙන උන්වහන්සේ අනුව යෑමට අධිෂ්ඨාන කරගත යුතුයි. එසකියෙල් දිවස් ප්‍රසාදි තුමා තිස් හතරවෙනි පරිච්ඡේදයේ යහපත් හා අයහපත් එඬේරුන් අතර හුවා දක්වන සංසන්දනය අදටත් වඩා යෝග්‍යය. "නුඹලා කිරි බොන්නහුය. ලෝම ඇඳුම් ඇඳගන්නාහු ය. තර සතුන් මරා කන්නහු ය. එහෙත් නුඹලා බැටළුවන් පෝෂණය නොකරන්නහු ය." අයහපත් එඬේරා පිළිබඳව මෙසේ ප්‍රකාශ කරන අතර එසකියෙල් දිවස් ප්‍රසාදින් වහන්සේ යහපත් එඬේරා පිළිබඳව මෙසේ ප්‍රකාශ කරයි. "එඬේරෙකු තම බැටළු රැළෙන් විසිර ගිය සමහරකු සොයා යන්නාක් මෙන් මමත් මාගේ බැටළුවන් සොයා ගොස් මීදුම් අන්ධකාරය ඇති දවසේ දී උන් විසිරී ගිය සෑම තැන් වලින් ම උන් ගලවා ගන්නෙමි" (එසකියෙල් 34:12). යහපත් එඬේරාගේ පරමාදර්ශය වන ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳව ශුද්ධ වූ ජුවාම් තුමා සිය ශුභ අස්නයේ මෙසේ ප්‍රකාශ කරයි. "මම යහපත් එඬේරා වෙමි. යහපත් එඬේරා තම ජීවිතය බැටළුවන් උදෙසා පූජා කරන්නේ ය" (ජුවාම් 10:11-16). එහෙයින් රාජගුරු ප්‍රසාදින් වහන්සේගේ මූලික දූත මෙහෙවර ජීවමාන ක්‍රිස්තුන් වහන්සේට තම ජීවිතයෙන් සාක්ෂි දැරීමයි. අප ගුරු දේවයාණන්ගේ ඉගැන්වීමට අනුව නායකයා සේවකයා විය යුතුය. "ඔබේ ස්වාමින් ද ගුරු දේවයාණන් ද වන මම ඔබේ පාද සේදුවේ නම් ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතුය. මම ඔබට කළාක් මෙන් ඔබත් කළ යුතු බවට ආදර්ශයක් මම දුනිමි" (ජුවාම් 18:14). රාජකීය නායකත්වය යනු මෙයයි. සෑම දෙනාම තම තමාගේ යහපත පමණක් නොසොයා අන්‍යයන්ගේ යහපත ගැන ද සැලකිලිමත් වන්න. "ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ පැවති ජීවිත ආකල්පය ඔබ තුළත් පවතීවා. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ ස්වරූපය දැරූ නමුත් දෙවියන් වහන්සේ හා සමානත්වය තමා විසින් බදාගෙන තබා ගත යුතු වස්තුවක් යැයි නොසිතා, එය ඉවතලා සේවකයකුගේ ස්වරූපයක් ගෙන අප හා සමවන මිනිසෙක් වූ සේක" (පිලිප්පි 2:6-8). එහෙයින් ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් නායකත්වය දැරීම ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කරමින් කුරුසියේ මරණයට පාත්‍රවී රාජකීය ඔටුන්න හිමිකර ගැනීමයි. තත්කාලීන සමාජය, යහපාලනය, 'කළමනාකරණය' වශයෙන් නිර්වචනය කරයි. එහෙත් කිතුනු නායකත්වය කළමනාකරණයට පමණක් සීමා වූවක් නොව, ප්‍රේමයේ පාරමිතාවෙන් පෝෂණ ය වූ නායකත්වයක් තුළින් දේව ජනතාවට සේවය කිරීමයි.

ශුද්ධ වූ අගොස්තීනු මුනිතුමා ශුද්ධ වූ සභාවේ එඬේරීය නායකත්වය පිළිබඳව මෙසේ ප්‍රකාශ කරයි. "ස්වාමින් වහන්සේ සිය අභිප්‍රාය මත පිහිටා මා මෙම දූත මෙහෙවරට පත්කරනුයේ මගේ සුදුසුකම් මත රඳා නොවේ." මෙම දූත මෙහෙවර තුළ ද්විත්ව පැතිකඩයක් දැකිය හැකිය. එනම් පළමුව මම කිතුනුවරයෙක් වෙමි. දෙවෙනුව මා ඔබ උදෙසා රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වශයෙන් පත්කරනු ලැබ සිටිමි. කිතුනුවරයෙක් වීම මට වාසියකි. රාජගුරු ප්‍රසාදිවරයෙකු වීම අනතුරු දායක විය හැක.

එහෙයින් යහපත් එඬේරාණන් වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට සමීපව අනුරූපී වන්න.

**අති උතුම් මේරියස් පීරිස් රදගුරු තුමා**
කොළඹ සහයක රදගුරු

### මුළු රටටම එළිය දෙන්න

සමන් ගිරට හාදු දි දී - හිරු කුමරුන් එයි හිනහී
කුරුළු රෑන ගීත ගයයි - අද අමුතුම පද වැලකී
කිරියි - පැණියි එකට පිරී - දෝරෙ ගලා යයි ඉතිරී
ලක් සසුනට යුව කුමරුන් - ලැබිලා ඇත අසිරි පිරී

දහම් කෙතට පොහොනි වෙලා - සුදත් වරම් පිරී යන්න
සිතුම් පැතුම් සපල වෙලා - දෙව් සමිඳුට ලංව ඉන්න
තල් අත්තෙන් පොල්අත්තෙන් - ලක් දෙරණට සෙවන දෙන්න
සවිය ගනන් දිරිය ගන්න - අප සැමවත් එක්ක යන්න

දිළිඳු කඳුල පිස දමලා - සිනා පොඩිතක් මවන්න
ළමා තරුණ වැඩිහිටි සැම - ඔබ හා රස බස් දොඩන්න
පැල්පත තුළ ඉදෙන බතින් - රස වේලක රස විඳින්න
මුළු රටටම එළිය දෙන්න - පහන් ටැඹේ දැල්ල වන්න

**ක්‍රිස්ටි ඔස්මන් පෙරේරා**
**පුල්ලුහේන**

# කොළඹ අගරදගුරු වසමේ සහයක රදගුරු වංශාවලිය

1 


**අති උතුම් ඇන්තනි ද සේරම් රදගුරු හිමි**
**( 1963 - 1965)**

2 

**අති උතුම් ෆ්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු රදගුරු හිමි**
**( 1965 - 1968 )**

3 

**අති උතුම් එඩ්මන්ඩ් ජේ. ප්‍රනාන්දු නි.ම.නි. හිමි**
**( 1968 - 1983 )**

4 

**අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් රදගුරු හිමි**
**( 1968 - 1996 )**

5 

**අති උතුම් මැල්කම් රංජිත් රදගුරු හිමි**
**( 1991 - 1996 )**

6 

**අති උතුම් මේරියස් පීරිස් රදගුරු හිමි**
**( 2001 - මේ දක්වා)**

7 8 

**අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු රදගුරු හිමි**
**අති උතුම් මැක්ස්වල් සිල්වා රදගුරු හිමි**
**( 2012 සිට )**

**2012 නවම් මස 11 දින, කොළඹ අගරදගුරු වසමට මෙන් ම, සමස්ත ලාංකේය ශු. සභාවට ම උත්තරීතර දායාදයක් ද, ලක්දිව එඬේරික වංශාවලියේ රන් අකුරින් සනිටුහන් වන දිනයක් ලෙස හැඳින්වුවහොත් එය නිවැරදි වේ යැයි? මට සිතේ. අඛන්ඩ කොළඹ අගරදගුරු වසමේ සහයක පුදැදුරු හිමිවරුන් ලෙස අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණන් ද අතිගරු මැක්ස්වල් සිල්වා යන මාහිමිවරුන් අභිනව රදගුරු හිමිවරුන් ලෙස ශුද්ධාසනය විසින් නම් කොට, එතුමන්ලාගේ රදගුරු අභිෂේකය මේ මස 11 වන දා පැවැත්වීමට නියමිතය.**

මෙහිදී සහයක රදගුරුතුමකුගේ භූමිකාව, එතුමන්ලා දරන වගකීම් හා සේවාවන් පිළිබඳව අපගේ අවධානය යොමු කිරීම වැදගත් වේ යැයි මම සිතමි. සාසන නීති සංග්‍රහය තුළ සහයක රදගුරුතුමකු පත්කරන්නේ නාමධාරී රදගුරුතුමන්ලා ලෙසිනි. එනම් එක් කාලයක දී පැවතුණු, නොයෙකුත් හේතුන් නිසා අද රදගුරු වසමක් ලෙස ක්‍රියාත්මක නොවන ප්‍රදේශ මෙකී නාමධාරී රදගුරු වසම් ලෙස හැඳින්වේ. උදාහරණ ලෙස අතීතයේ මැද පෙරදිග හා ජර්මනිය, එංගලන්තය, වැනි රටවල පැවති රදගුරුවසම් නම් කළ හැකිය. මෙහි දී සහයක රදගුරුතුමා එකී පදවියක නාමධාරී රදගුරුතුමකු ලෙස පත්කරනු ලබන්නේ ය.

උදාහරණ ලෙස අති උතුම් මේරියස් පීරිස් රදගුරුතුමා ටකරාටාහි නාමධාරී රදගුරු හිමිපාණෝ ය. පදවියේ එඬේරික දූත මෙහෙවර වඩාත් හොඳින් හා කාර්යක්ෂමව ඉටු කිරීමට සහයක රදගුරු හිමිවරුන් අත්‍යවශ්‍ය වේ. සහයක රදගුරුතුමන්ලා කොටස් දෙකක් වෙයි. ඉන් පළමුවැනි කොටස විශේෂ බලතල සහිත සහයක රදගුරුතුමන්ලා වන අතර දෙවන කොටස බලරහිත රදගුරුතුමන්ලාය.

මෙහි දී පළමු කොටසේ සහයක රදගුරු තුමන් ලා පදවියේ එඬේරික දූත මෙහෙවර හා පරිපාලනයේ දී පාලක රදගුරුතුමාට සහය විය යුතු අතර, පදවියේ රදගුරුතුමා පදවියෙන් පිට ව සිටින අවස්ථාවන්හිදී එතුමන්ලාගේ ස්ථානය ගනියි. තවද එවැනි විශේෂ බලතල සහිත අනුනායක හෝ කලාපීය නාහිමි තත්ත්වයකට ද නිතැතින්ම එතුමන්ලා පත් වේ. මෙහිදී බල රහිත රදගුරුතුමන්ලා හට තම රදගුරු වසමේ අවශ්‍යතා අනුව බලතර පවරන අතර එවැනි ම වූ අවශ්‍යතා මත අනුනායක හෝ කලාපීය නාහිමි තත්ත්වයකට පත් වේ. මෙහි දී සහයක රදගුරු හිමිවරු පදවි පාලක රදගුරුතුමා හා සමීප සහයෝගයෙන් ක්‍රියා කරන අතර එඬේරික දූත මෙහෙවර හා සුවිශේෂී කාරණා වල දී පදවි රදගුරුතුමා ද සහයක රදගුරුතුමන්ගේ උපදේශකත්වය තුළ ක්‍රියා කරයි.

තවද සහයක රදගුරුතුමා ද තම රදගුරු වසමේ සුවිශේෂී වගකීම් හා යුතුකම් භාර ගැනීමට නිල වශයෙන් කැඳවීමක් ලබා ඇති නිසා එඬේරික දූත මෙහෙවර, සභා නියෝග හා ධර්මානුශාසනා පැනවීමේ දී පදවියේ රදගුරුතුමා සමඟ සහයෝගයෙන් හා සුහදතාවයෙන් යුතුව ක්‍රියා කළ යුතු වන්නේ ය.

තවද තම නිලයට හා නියෝගයන් ද, අදාළ කටයුතු වල දී පදවියේ රදගුරුතුමා සේවාවක් ඉල්ලා සිටියහොත් සහයක රදගුරු නියැත වශයෙන් ම එය ඉටුකිරීමට ණය යුක්තියෙන් බැඳී සිටින්නේ ය. ඇතැම් අවස්ථාවන්හි දී පදවි පාලක රදගුරුතුමා සසුන් නියෝග හෝ පෞද්ගලික අවැසිතා මත පදවියෙන් පිට රැඳී සිටියොත්, පදවියේ පාලනය, දූත මෙහෙවර ඉටු කිරීමට සහයක රදගුරුතුමා බැඳී සිටියි. ස්වකීය අපෝස්තලික හා එඬේරික දූත මෙහෙවර තුළ අභිවෘද්ධි ආලේපනය දානය කිරීම, මීසම් බැහැදැකීම දේවස්ථානවල මංගල්‍යයන් හා ජුබිලි වලට සහභාගී වීම වැනි දේවල් ද මෙකී සහයක රදගුරු ධුරයන් හා සමඟ බැඳී පවතී.

කොළඹ අගරදගුරු වසමේ පළමු සහයක රදගුරුතුමන් ලෙස ලාංකේය සභා ඉතිහාසයේ රන් අකුරින් සනිටුහන් වන්නේ අති උතුම් ඇන්තනි ද සේරම් හිමිපාණෝ ය. ක්‍රි.ව. 1915 මැයි 10 වැනි දින මීගමු කොච්චිකඩේ දී උපත ලබා 1941 මාර්තු 25 වැනි පූජක වරම් ලබා දෙමටගොඩ, මෝදර සා. ජේම්ස්, කොටහේන ආදි මීසම්වල මීසම් සේවයේ යෙදුණු අතිගරු ඇන්තනි සේරම් හිමිපාණන්ව ක්‍රි.ව. 1962 දෙසැම්බර් 27 වන දින ටාකාපේ නාමධාරී රදගුරු වසමේ රදගුරු හිමිපාණන් ලෙස ද කොළඹ අගරදගුරු වසමේ ප්‍රථම සහයක රදගුරු හිමිපාණන් ලෙසින් එතුමාණන්ව තෝරා පත් කෙරුණු අතර එකල කොළඹ අගරදගුරු ධුරය දරුවේ සඟ සැපත් අති උතුම් තෝමස් කුරේ අගරදගුරු හිමිපාණන් ය. එතුමන්ගේ රදගුරු අභිෂේකය 1963 මාර්තු 25 දින කොළඹ සා. ලුසියා ආසන දෙව්මැඳුරේ පැවතිණි.

1965 මාර්තු 22 දින මෙතුමන් ව ගාලු රදගුරු වසමේ තෙවන රදගුරුහිමි ලෙස ශුද්ධාසනයෙන් නම් කළ අතර ක්‍රි.ව. 1982 පෙබරවාරි 28 වන දින එතුමන් ස්වර්ගස්ථ වන තෙක් ම එහි රදගුරුධුරය දැරූ අතර මෙතුමන්ගේ පාලන සමය ගාලු රදගුරු වසමේ ස්වර්ණමය යුගය ලෙස හැඳින්වේ.

කොළඹ අගරදගුරු වසමේ දෙවන සහයක රදගුරු ලෙස 1931 ඔක්තෝබර් 19 දින මීගමුව කටුවපිටියෙන් උපත ලබා 1956 දෙසැ. 26 වන දින පූජකවරය ලැබූ අති උතුම් ෆ්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු හිමිපාණෝ ඉතිහාසගත වන්නාහ. 1965 ජුලි 24 දින අභිනව කොළඹ සහයක රදගුරු හා ඔලිවාහි නාමධාරී රදගුරු ලෙස නම් කෙරුණු අතර එතුමන්ගේ රදගුරු අභිෂේකය 1965 අගෝස්තු 19 දින පැවතුණි.

1968 ජුනි 08 වන දින හලාවත යුවරදගුරු ධුරයෙන් පිදුම් ලත් මෙතුමා සලාපුර දෙවන රාජගුරු හිමි තුමා ලෙස පදවි ප්‍රාප්ත වූයේ 1972 දෙසැම්බර් 27 වන දින ය. පුරා 34 වසරක් පුරාවට සලාපුර රදගුරු වසමට මෙන් ම සමස්ත සභාවට ම ඉතා අනගි මෙහෙවරක් ඉටුකළ අති උතුම් ෆ්‍රැන්ක් මාකස් ප්‍රනාන්දු හිමිපාණෝ සුප්‍රකට දේශනාවාදියෙකි.

ප්‍රගතිශීලි මෙන්ම කිවයුතු දේ නොසඟවා ප්‍රකාශ කළ කිසිවකුට අලගු තැබිය නොහැකි උත්තමයෙකි. යුගයේ දිවැසිවරයෙකි. එතුමා ස්වර්ගස්ථ වූයේ 2009 වසරේ අගෝ. 24 දා ය. මීළඟට කොළඹ අගරදගුරු වසමට එකවර සහයක රදගුරු දෙනමක් පත්වන්නේ 1968 ජුනි මස 23 වන දින දී ය.

ඒ. 1921 මාර්තු 25 දා මීගමුව පිටිපන දී උපත ලබා නිර්මල මරිය නිකායික පූජාප්‍රසාදිතුමකු ලෙස පුදැදුරු වරම් ලැබූ "ඉගිල්ගිලී"හි නාමධාරී රදගුරු ලෙස පත් කළ අති උතුම් එඩ්මන්ඩ් ජේ. ප්‍රනාන්දු (නි.ම.නි.) සහ 1932 දෙසැම්බර් 12 වන දින කැළණියේ උපත ලබා, 1958 පෙබරවාරි 03 දින පූජකවරම් ලබා අනගි සේවාවන් තුළින් අගරදගුරු වසමට මෙන් ම ජාතික තලයට ම ජාත්‍යන්තරයට ස්වකීය දූත මෙහෙවර විදහාලූ "මුලියා"හි නාමධාරී රදගුරුතුමන් ලෙස පත්කළ අති උතුම් ඔස්වල්ඩ් කොල්මන් ගෝමිස් හිමිපාණෝ ය. මෙම රදගුරු හිමිවරු දෙනාටම රදගුරු පදවියේ ගරු ජේ. ප්‍රනාන්දු හිමිපාණන් 1983 පත්වන තෙක් කොළඹ අගරදගුරු පදවියේ සහයක රදගුරු ධුරය හෙබවූ අතර 1983 දෙසැම්බර් 05 වන දින එතුමන්ව බදුල්ල රදගුරුහිමි ලෙස පත් කරන ලදී.

1995 මාර්තු 03 වන දින දක්වා බදුල්ල රදගුරු වසම අනගි සේවාවක් කළ මෙතුමා 2004 ජුලි 16 වන දා ස්වර්ගස්ථ වුණි. අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් 1996 දී අනුරාධපුර දෙවන රාජගුරු හිමි ලෙස ශුද්ධාසනයෙන් පත් කළ අතර 2002 වසරේ දී කොළඹ අගරදගුරු හිමිපාණන් ලෙස පත් කළ අතර 2009 අගෝස්තු 05 වන දා එතුමාණන් විශ්‍රාම ගියේය. විශ්‍රාම ගනු ලැබූවත් ඊයෙත්, අදත්, හෙටත් එතුමා විද්වත් දේශකයකු, වියතකු, ඉතිහාසඥයකු... ලෙස ලාංකේය ශු සභාවට මෙන් ම, ජාත්‍යන්තර තලයට ඉතා අනගි මෙහෙවරක් ඉටුකරන්නේ ය.

තවද සාමයික මෙන් ම අන්තර් ආගමික සහජීවනයට මඟ පැදූ ප්‍රබල යුග පුරුෂයකු ලෙස ද මෙතුමන්ව හැඳින්විය හැකිය. මීළඟ කොළඹ අගරදගුරු වසමේ පස්වන සහයක රදගුරු හිමිපාණන් ලෙස පත්වූයේ වත්මන් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ය. 1991 ජුනි 17 වන දින "කබර්සුසි"හි නාමධාරී රදගුරු හිමිපාණන් ලෙස මෙතුමන්ව පත් කළ අතර 1996 වසර තෙක් වසර 05 ක කාලයක් අගරදගුරු වසමේ සහයක රදගුරු හිමිපාණන් ලෙස සේවය කළ අතර එතුමන්ගේ රදගුරු අභිෂේක 1991 අගෝස්තු 31 වැනි දින පැවැත්වුණි.

ඉන් අනතුරුව 2001 වසරේ කොළඹ අගරදගුරු වසමේ සහයක රදගුරු හිමි ලෙස පත්වූයේ අති උතුම් වින්සන්ට් මේරියස් පීරිස් හිමිපාණන් ය. එතුමා 1941 ඔක්තෝබර් 11 වන දා උපත ලබා 1972 ජනවාරි 25 වන දින පූජකවරම් ලැබ, මීසම්, දෙව්සත්හල්, ආයතන හා පදවි නාහිමි ධුරයන් ද දරා 2001 වසරේ පෙබරවාරි 03 වන දා සහයක රදගුරු ධුරයට හා "ටාකාරාටා" හි නාමධාරී රදගුරුතුමන් ලෙස එතුමන්ව අබිසෙස් ගන්වන ලදි. මේ ලැබුවාවූ නව වසරේ දෙවි සමිඳාණෝ කොළඹ අගරදගුරු වසමට මෙන් ම සමස්ත ශු. සභාවට දානය කරන ප්‍රබල තිළිණ හා වරප්‍රසාදයේ සලකුණක් ලෙස අභිනවයෙන් සහයක රදගුරු ධුරයට ඔසවනු ලබන අතිගරු මැක්ස්වල් සිල්වා හා අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු මාහිමිවරුන් නම් කළ හැකිය.

**අතිගරු එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෝ** 1948 මැයි 20 දින යාපනයෙදී උපත ලබා, සා. බෙනදික් විදුහලෙන් මූලික අධ්‍යාපනය ලබා සා. ඇලෝසියස් දෙව්සත්හලට ඇතුළු වී පසුව අම්පිටිය ජාතික දෙව්සත්හලේ ද අනතුරුව රෝමයේ උර්බානියානා සරසවියෙන් දේවධර්මය හා ශීලධර්මය හදාරා 1973 ජනවාරි 6 දා වතිකානයේ දී VI වන පාවුළු සුදු පියා අතින් පූජක වරම් ලබා ගත් අතර අම්පිටිය දෙව්සත්හලේ කථිකාචාර්යවරයකු හා අදියුරු පියනම ලෙස ද මීසම් ගණනාවක හා කොළඹ අගරදගුරු වසමේ කලාපීය නාහිමි ලෙසද සේවය කොට ශුද්ධාසනය විසින් 2011 ක් වූ නොවැම්බර් මස 28 වන දින එතුමන්ව කොළඹ සහයක රදගුරු හා "හොර්නාහි" නාමධාරි රදගුරු හිමිපාණන් ලෙස පත් කරන ලදි.

**අතිගරු මැක්ස්වල් සිල්වා හිමිපාණෝ** 1953 සැප්තැම්බර් 27 දා මොරටුව විල්ලෝරාවත්තේ දී උපත ලබා, මොරටුව සා. සෙබස්තියන් විදුහලෙන් සිප් සතර හදාරා බොරැල්ල සා. ඇලෝසියස් දෙව්සත්හලින් මහනුවර අම්පිටිය ජාතික දෙව්සත්හලින් ද පූජක පුහුණුව නිමාකොට 1981 ජුලි 07 වන දින පූජක වරම් ලබා, අධ්‍යාපන සේවයේ දී අධ්‍යාපනවේදියකු හා විදුහල්පතිවරයකු, ගුරුවරයකු ලෙස ද දළුගම, තිබ්බටුගොඩ, මාබෝල වැනි මීසම් සේවාවන් ඉටුකළ මැක්ස්වල් සිල්වා මාහිමිපාණන් ඉකුත් දින දී රදගුරු අබිසෙස් ලබන්නේ කොළඹ සහයක රදගුරු හා "ලෙසිනා"හි නාමධාරී රදගුරුතුමන් ලෙස ය.

මෙලෙස අඛණ්ඩ කොළොම්පුර සහයක රාජගුරු හිමි පරපුරට නවක සහය එඬේරුන් ලෙස අභිනවයෙන් තෝරා පත් වූ සහයක රදගුරු හිමිවරු දෙනමට "සමිඳු කෙත අස්වද්දමින් එහි එලදාව නෙළා.... දේව ජනතාව නමැති බැටළුවන් නිල්තණ බිම යන දේව රාජ්‍යය කරා රැගෙන යන්නට අවැසි සවිය බලය සමිඳු වෙතින් ම පතා සිටින්නෙමු.

ජේසු ක්‍රිස්තු ආරාධිත වේවා!

**අසේල දසනායක**


## අති උතුම් මැක්ස්වල් රදගුරුතුමන්ව පිළිගනිමු බැති සිතින්

බැති සිතින් සෙනෙහසින්
පිය දෙවිඳුන් අමතා
අපි සැම දෙන අයැදිමු
අද දින අයැදිමු දෙවිඳුන් වරම් පතා

විස්කම් දස්කම් පාන පුරවරේ
අප ගම් පියසේ උපත ලබා
කිතු බැති පවුලින් දහම් මඟ තුළින්
කැඳවුම පිළිගෙන සත් වරම් ලබලා

දෙව් ජනතාව ඔසොවාලන්නට
පූජක දිවි තුළ කැපවීලා
අදියුරු පිය ලෙස දූ දරුවන්ට ශිල්ප බෙදා
අවුලා ශුද්ධාත්ම ගින්න අවුලා

දෙවිඳුන් දුන්නා අති අගනා
තලෙන්තුවයි රදගුරු උතුමා
රැළ රැක ගන්නට එඬේර වීලා
රදගුරු නිලේ මුදුව පැළඳා



**මෝල්පේ ජෙනට් ඇම්. ප්‍රනාන්දු**

# චිරං ජයතු නව සහයක රදගුරු හිමිපාණෙනි!



**පුදැදුරු දිවියේ 38 වසරක් පුරාවට කිතු සමිඳුන්ගේ සදහම් මෙහෙවරේ විශ්වසනීය දාසයකු ලෙසින් ඔබතුමන් ඉටුකළ මහත් වූ සේවාව කෙරෙහි ප්‍රසන්න වූ දෙවි මහෝත්තමයාණන් වහන්සේ ඔබතුමන් බොහෝ දැ කෙරෙහි අධිපතියා බවට පත් කරන දිනය අද යැයි මට සිතෙයි. සුභාරංචියේ වදන් මා මතකයට නැගේ.**

**"යහපත් වූද, විශ්වසනීය වූද දාසය ඔබ ස්වල්පයක් කෙරෙහි විශ්වාසවන්ත වූ බැවින් බොහෝ දැ කෙරෙහි ඔබ අධිපතියා කරමි." (ශු. මතෙව් 25:23)**

ඒ උදාරතර වගකීමට පණ පොවන්නට, අගරදගුරු පදවියේ සත්වන සහයක රදගුරු ධුරයෙහි අබිසෙස් ලබන අති උතුම් ෆිඩෙලිස් ලයනල් එම්මානුවෙල් ප්‍රනාන්දු හිමිපාණෙනි! මේ පින්බර, ආශිර්වාදලත් මොහොතේ මොරටු මීසම් සංඝයේ සුභ පැතුම්, යැදුම් හා ආදර ගෞරවය පුදකර සිටිනු වස් මෙම ලිපිය අරමුණු කොට ගනිමි.

පුරෝගාමීත්වයේ නගරය ලෙසත්, සත්‍ය විශ්වාසයේ තෝතැන්නක් ලෙසත් හඳුන්වන අප මොරටු පුරවරය ඔබතුමන්ව බිහි නොකළත්, පූජක දිවියට අත්දැකීම් සමුදායක්, සුවිශේෂී පන්නරයක් ලබා දුන් බව මගේ හැඟීමයි. 2002 වසරේ පෙබරවාරි මාසයේ මොරටු මීසම් පවුලේ ආත්මික එඬේරාණන් ලෙසින් සේවාව භාරගත් එතුමා වසර හතකට ආසන්න කාලයක් අප දහම් කෙත අස්වද්දනු පිණිස ගත් වෙහෙස මහන්සිය මොරටු ජනතා හදවත් තුළින් කිසිදා බැහැරව නොයනු ඇත. වචනයේ පරිසමාප්තයෙන්ම එතුමා දෙවි පියාණන් වහන්සේ තුළ යැපුණු ජනතාවාදී පියතුමෙකි. පුදැදුරු දිවිය අලංකාර කරන නිහතමානීකම, සංවේදීබව, සරලබව, සාමුහිකත්වය, අන්මත ඉවසීම වැනි යහගුණාංග රැසක් මම එතුමන් තුළ දුටුවෙමි. මොරටු මීසම් සංඝයෙන් සමුගත්තද, අප කලාපයේ අනුනායක පියතුමා ලෙසින් තවදුරටත් එතුමාගේ එඬේරික පහස ලබන්නට අපි භාග්‍යවත් වූයෙමු.

ගිහි ජනතා ශක්තිය කෙරෙහි ප්‍රබල විශ්වාසයකින් පසුවූ එතුමා මීසම් සේවයේ දී වඩ වඩාත් ගිහි ජනතාව ළං කරගත්තා පමණක් නොව නිදහස්, පැහැදිලි මනසකින් එම සේවාව ඉටුකරලීමට අවකාශයද ලබා දුනි. එතුමන්ගේ සේවා සමයේ දී දහම් පාසල් විදුහල්පති ධුරයේ කටයුතු කළ මගේ ගිහි සේවාවට එතුමන් ලබා දුන් ධෛර්යය හා පන්නරය මා ජීවිතය තුළ සදා සටහන් වී ඇතිව පමණක් නොව මාගේ අනාගත ජීවිතයට ද මහඟු පිටිවහලක් වූ බවද සතුටින් පවසමි.

එතුමා මීසම් සංඝයේ නිහතමානී එඬේරාණන් විය. මීසම් සේවය අවසන් කර සමුගෙන වෙනත් මීසමකට ගමන් කළ, සහය මීසම් සේවක පියතුමකුගේ දෙපා නමැද මීසම් පවුලෙන් යම් වරදක් සිදුවිනි නම් ඒ වෙනුවෙන් සමාව භජනය කිරීමට තරම් එතුමා නිහතමානී විය. එවැනි ක්‍රියාදාමයක් මා දුටු ප්‍රථම හා එකම අවස්ථාවද වූ බව සටහන් කරනු වටියි.

එතුමා මොරටු මීසමට පැමිණෙන විට එතුමා ඉදිරියේ භාරධූර අභියෝග යක් විය. පිඹුරුපත් සකසා මූලික කටයුතු පමණක් ආරම්භ කර තිබූ දහම් පාසල් ගොඩනැගිලි වැඩකටයුතු අවසානය කරා රැගෙන යාමට සිදුවීම එම අභියෝග යයි. මීසම් පවුලේ හදවත නොහොත් සා. සභාවේ ජීවනාලිය දහම් පාසල ලෙස හුදු වචන කිහිපයකට පමණක් සීමා වී ඇති වත්මන් යුගයේ එම සංකල්පය බලගන්වන්නට එතුමා දැරූ වෙහෙස මහන්සිය වෙසෙසින් සිහිපත් කරනු කැමැත්තෙමි. ගිහි ජනතාව සමඟ අත්වැල් බැඳ ගනිමින් විවිධ ව්‍යාපෘතීන් සඳහා නායකත්වය දුන් එතුමා සිය විදෙස් මිතුරන්ගේ ආධාර ද ඒ වෙනුවෙන් යොදවා අලංකාර දෙමහල් ගොඩනැගිල්ලක් නිමවා මොරටු සංඝයේ අනාගත පරපුරට දායාද කෙරිණි. අද 1500 කට අධික දරු දැරියන් පිරිසක් දහමෙහි පෝෂණය ලබමින් දේව මහිමය පතා ක්‍රියාකාරී මෙහෙවරේ නියැලෙති.

මීසමක සේවය කරද්දී අවශ්‍ය තවත් ප්‍රබල ගුණාංග යක් සේ මා දකින්නේ අන්‍යෝන්‍ය ආගමික සහජීවනයයි. සංහිඳියාවයි. ඒ පිළිබඳව මනා අවබෝධයකින් හෙබි අප පියතුමා අසල්වාසි විහාරයන්හි භික්ෂුන් වහන්සේ සමඟ සමීප සබඳතා පැවැත්විය. මීසමේ බොහෝ කටයුතු සඳහා භික්ෂුන් වහන්සේ ආරාධනා ලැබූ අතර, පන්සලේ බොහෝ දැ වෙනුවෙන් පියතුමා ඇරයුම් ලැබීය. වෙසක් උත්සවය අරබයා මීසමේ කිතුනු ජනයාගේ සුභ පැතුම් රැගෙන පියතුමන් භික්ෂුන් වහන්සේ බැහැදුටු අතර, නත්තල් උත්සවය අරබයා බෞද්ධ ජනතාවගේ සුභ පැතුම් රැගෙන භික්ෂුන් වහන්සේ මීසම් ගෘහයට වැඩම කළහ. මේ පිළිබඳ මොරටුව ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානාධිපති පූජ්‍ය මාගල්ලේ නාගිත අනුනායක හිමිපාණන් අදටත් ප්‍රශංසා මුඛයෙන් කතා කරති.

සාංඝික දේපල පිළිබඳවත්, එය රැක ගැනීම පිළිබඳවත් එතුමා තුළ වූයේ දැඩි පිපාසාවකි. සභාවට අයත් දේපළ අන් අයගේ භුක්තියටත්, යටි අරමුණු මුදුන් පමුණුවා ගැනීම වෙනුවෙනුත් යොමු වන කාලයක එහි අයිතිය වෙනුවෙන් අධිකරණවලට යාමට පවා එතුමාට සිදුවූ අවස්ථා එමටයි. ඒවාට සතුටින් මුහුණ දුන්නා පමණක් නොව ඒ පිළිබඳව ගිහි ජනතාව අවදි කරන්නටත්, ඒ වෙනුවෙන් ජනතාව පෙළ ගස්වන්නටත් එතුමා සමත් විය.

මොරටු මීසම් ජනතාවගේ හදවත් තුළින් දෝරේ ගලා යන දේව මාතා භක්තිය තව තවත් වර්ධනය කරවීමෙහිලා එතුමා ගත් වෙහෙස මහන්සියද අප්‍රමාණයි. 2400 හා 2500 වන සදාසරණ මාතා බැතිය අධ්‍යාත්මික පරිසරයක් තුළ පැවැත්වීම එතුමාගේ ඒකායන අරමුණ විය. දිව්‍ය ගැළවුම්කාර නිකායික පියවරුන් හරහා මහා ධර්ම විවේකයක් සංවිධානය වූයේ ඒ නිසාවෙනි.

එතුමාගේ සේවාව හුදෙක් උත්සව සැණකෙළි ආදියට වඩා ආධ්‍යාත්මිකත්වයට නැඹුරු වූ සේවාවකි. විසිර ගියවුන් දෙවිපියාණන් හා සම්බන්ධ වූහ. දේවස්ථානයේ ක්‍රියාකාරීත්වයට නැවත සම්බන්ධ විණි. කතෝලික ශීලධර්මය පිළිබඳ එතුමා තුළ වූ හසල අත්දැකීම් තුළ ජනතාව දැනුවත් වූවා පමණක් නොව දේවස්ථානයෙන් විවාහ නොවූ පවුල් රැසකගේ විවාහයන් සක්‍රමේන්තු ගත කෙරිණි.

දුප්පත්, පොහොසත්, කුල, ගෝත්‍ර, පවුල් වාදයන්ට හසු නොවුනු පියතුමා සමස්ත මීසම් සංඝයේම දයාබර තාත්තා විය. ජනතාව කෙරෙහි එතුමා කෙතරම් සංවේදී ද යන්න මා හොඳින් දුටු අවස්ථාවක් වූයේ එතුමා මොරටු මීසමෙන් මාරු වී කළුතර දෙව්සත්හලට ගිය දිනයයි. බස් රථ කිහිපයකින් විශාල ජනතාවක් එතුමා සමඟ එහි පැමිණියහ. බොහෝ දෙනා එතුමන් වැළඳ හඬා වැටුණහ. එතුමාගේ දෑසින් ද කඳුළු කඩා හැලෙන්නට වුණි. එම අවස්ථාව අතිශයින් සංවේදී විය. එතුමා කොතරම් සංවේදීද? ජනතාවට එතුමා කොතරම් ආදරය කරන්නට ඇතිද? යන ප්‍රශ්නයන්ට මට එම සිදුවීම දැකීමෙන් පිළිතුරු ලැබිණි. තවත් එක් සිදුවීමක් මෙහි නොලියවුවහොත් ලිපිය අසම්පූර්ණ වේ යැයි සිතමි.

සුනාමි ඛේදවාචකයට 2004 වසරේ අප රට මුහුණ දෙන විට එතුමා සේවය කරමින් සිටියේ ද මොරටු මීසමේය.

☛ 15 පිටුවට

✍ මොරටුවේ
**ප්‍රදීප් සුරවීර**

# නිහතමානී රදගුරු උතුමා

**"නුඹ මව් කුස තුළ සිටියදීම මම නුඹ තෝරා පත් කර ගත්තෙමි" යන සමිඳු වදන සනාථ කරමින් කෝට්ටේ සා. තෝමස් විදුහල්පති අතිගරු මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා පියතුමන්ව ශුද්ධාසනය මඟින් රදගුරුවරයට ඔසවා ඇත.**

මොරටුව විල්ලෝරාවත්ත මීසමට අයත්ව මෝල්පේ සම්පතාවඩුගේ ස්ටැන්ලි ජෝන් සිල්වාගේ හා කුරුකුලසූරියගේ යූජින් ගර්ට්‍රෑඩ් ඩයස් යන දෙපළගේ ආදරයේ සංකේතයක් ලෙස එම දෙපලට දරුවන් සතර දෙනකු ලැබුණි. වැඩිමලා දියණියක වූ අතර අනෙක් තිදෙනා පිරිමි දරුවෝ වූහ. 1953 සැප්තැම්බර් මස 27 වෙනි දින එම දෙපළට පළමු පිරිමි දරුවා ලැබිණි. එම දරුවාට මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා යන නම තබා ප්‍රසාද ස්නාපනය තුළ දේව දරුකම ලබා දී ඇත්තේ කඩලාන සා. අන්තෝනි මුනිඳුන්ගේ දෙව්මැඳුරේ දී ය. ඔහු දෙවියන් වහන්සේටම කැප වූ දරුවකු වූ අතර, කෙදිනක හෝ ඔහු මෙවැනි තනතුරකට පත්වේ යැයි අද ජීවතුන් අතර නැති එම දෙමාපියෝ නොසිතන්නට ඇත.

විල්ලෝරාවත්ත රෝමානු කතෝලික මිශ්‍ර විදුහලින් සිය මූලික අධ්‍යාපනයට අත් පොත් තැබූ කුඩා මැක්ස්වල් 1 වසරේ සිට 2 වසර දක්වා එහි ඉගෙනුම ලැබීය. ඉගෙනීමටද අති දක්ෂයකු වූ මැක්ස්වෙල් ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා ද ලාසාල් සහෝදරතුමන්ලාගේ පාලනය යටතේ වූ මොරටුව සා. සෙබස්තියන් විදුහලට ඇතුළත් වූ අතර 3 වසරේ සිට 11 වසර දක්වා එහි ඉගෙනුම ලබමින් 1969 වසරේ පෙනී සිටි සාමාන්‍ය පෙළ විභාගයෙන් විශිෂ්ඨ සාමාර්ථයක් ලැබීය. පූජකවරයකු වී ජේසුගේ මිදි උයනේ සේවය කිරීමේ සිහිනයක් ඔහු සිත තුළ ලියලන්නට වූයෙන්, එවකට කඩලාන මීසම් සේවකව සිටි ස්වර්ගස්ථ වූ ගරු ටියුඩර් වනිගසේකර පියතුමාගේ මඟපෙන්වීම යටතේ එම වසරේදීම ඔහු බොරැල්ල සා. ඇලෝසියස් කුඩා දෙව්සත්හලට ඇතුළු විය. පාසල් යන අවදියේ කණිෂ්ඨ මරිය භටයකු ලෙස සිය මීසම තුළ කළ දූත කාර්යය පූජකවරයකු ලෙස කළ යුතු යැයි ඔහු සිතුවා විය හැකිය. සා. ඇලෝසියස් දෙව්සත්හලේ සිට උසස් අධ්‍යාපන කටයුතු සඳහා බම්බලපිටිය සා. පීතර විදුහලට පැමිණි මැක්ස්වල් 1971 දී උසස් පෙළ සාමාර්ථය ලබා එම වසරේ දීම හපුතලේ භාවඩන් අතරමැදි දෙව්සත්හලට ඇතුළු වූයේ පූජක දිවියේ මුල් ආරම්භය සනිටුහන් කරමිනි. 1974 පෙබරවාරි 09 වැනි දින අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුළු වූ එතුමා එහි දී දේව ධර්මය හා දර්ශනවාදය හදාරා රෝමයේ ප්‍රොප ගන්ඩා සරසවියෙන් දේව ධර්ම උපාධිය ද ලබා ගත්තේය. 1980 දෙසැම්බර් මස 07 වෙනි දින තේවාචාරී වරම් ලැබූ මැක්ස්වල් සිල්වා සහෝදරතුමා 1981 ජුලි මස 26 වෙනි දින එවකට සිටි කොළඹ අගරදගුරු අති උතුම් නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන් අතින් පූජක වරම ලබා ගත්තේය. කඩවත මීසම් සේවක ගරු සුනිල් කුමාර පීරිස් පියතුමා හා ගරු සුනිල් හර්මන් පෙරේරා පියතුමා, මෙතුමන් සමඟ පූජකවරය ලැබූ විල්ලෝරාවත්ත මීසම් පවුලේ පුතුන් වන අතර ගරු සුනිල් හර්මන් පෙරේරා පියතුමා අද ජීවතුන් අතර නැත. මෙහි විශේෂත්වය වන්නේ මෙම පියවරු තිදෙනාම පූජක වරම් සඳහා යොමු කර ඇත්තේ ස්වර්ගස්ථ වූ ගරු ටියුඩර් වනිග සේකර පියතුමා වීමය. පූජකවරය ලැබීමෙන් පසුව දළුගම මීසමේ සහයක පියතුමා ලෙස පත් වූ එතුමා 1983 සැප්තැම්බර් මස 4 වෙනි දින ගොවි ගම්මානයක් වූ තිබ්බොටුගොඩ මීසම් සේවක පියතුමා ලෙස පත්වීය.

> **ඉතා නිහතමානී, ශාන්ත ගුණ ඇති දැහැමි පියතුමකු වන අතිගරු මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා පියතුමා තමන්ට මූලික අධ්‍යාපනය ලබා දුන් විල්ලෝරාවත්ත රෝමානු කතෝලික මිශ්‍ර විදුහලේ සේවය කළ යහපත් එඬේරාගේ පැවදි නිකායේ ගරු මේරි ලොරේට් (නැසීගිය) ගරු මේරි මෙලනි පැවදි සොයුරිය ඇතුළු, ග්‍රේස් ගුරුතුමිය, නැසීගිය චාලට් ගුරුතුමිය ආදීන්වද සිහිපත් කළේ ගුරු ගෞරවයත්, ගුරු භක්තියත් නිසාවෙනි.**

එහි මීසම් සේවාවේ යෙදෙමින් වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා කැළණිය විශ්ව විද්‍යාලයට ඇතුළත් වීය. සිය අධ්‍යාපන කටයුතු නිදහස්ව කරගෙන යාමට අවශ්‍ය වූ නිසාම අගරදගුරු හිමිපාණන් එතුමන්ට තනි මීසමක් වූ මාබෝල මීසම 1986 දී භාර දුනි. තිබ්බොටුගෙ ාඩ මීසමෙන් ආරම්භ කළ විශ්ව විද්‍යාල අධ්‍යාපනය මාබෝල මීසමෙන් අවසාන කළේ එතුමා ශාස්ත්‍රවේදී උපාධිය ද ලබා ගනිමිනි. මාබෝල මීසම් සේවකව සිටිමින් 1992 දී ගුරු වෘත්තියට ඇතුළත් වූ එතුමා ග්‍රෑන්ඩ්පාස් සා. ජෝශප් විදුහලට පළමු පත්වීම ලැබීය. මීසම් සේවාවට වැඩි ඇල්මක් දැක්වූ එතුමාට ගුරු වෘත්තිය නිසාම ඉන් ඉවත් වීමට සිදුවූ අතර, කෙරවලපිටිය සා. ජෝශප් දෙව්මැඳුරේ නේවාසිකව සිටිමින් එහි ජනතාවගේ ආධ්‍යාත්මික පෝෂණයට ද උර දෙමින් සිය වෘත්තීය කටයුතු කැපවීමෙන් ඉටු කළේය. 1998 දී රාගම බැසිලිකා විදුහලේ උප විදුහල්පති ලෙස පත් වූ ගරු මැක්ස්වල් සිල්වා පියතුමා 2001 වසරේ ජුලි මාසයේ දී කෝට්ටේ සා. තෝමස් විදුහලේ විදුහල්පති ලෙස වැඩ භාර ගත්තේය. ඉතා පහත් මට්ටමක තිබූ එම විදුහල අධ්‍යාපනය අතින් ඉතා උසස් මට්ටමකට ගෙන ඒමටත් කතෝලික දරුවන්ගේ ප්‍රතිශතය ඉහළ දැමීමටත් එතුමා කටයුතු කළේය.



1986 දී කඳාන දිසාවේ තරුණ කටයුතු බාර උපාධ්‍ය පියතුමා ලෙස කටයුතු කළ එතුමා රද ගුරු නිලයට එසැවෙන තුරුම කතෝලික ගුරු එකතුවේ උපාධ්‍ය පියතුමා ලෙස කටයුතු කළේය. ඉතා නිහතමානී, ශාන්ත ගුණ ඇති දැහැමි පියතුමකු වන අතිගරු මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා පියතුමා තමන්ට මූලික අධ්‍යාපනය ලබා දුන් විල්ලෝරාවත්ත රෝමානු කතෝලික මිශ්‍ර විදුහලේ සේවය කළ යහපත් එඬේරාගේ පැවදි නිකායේ ගරු මේරි ලොරේට් (නැසීගිය) ගරු මේරි මෙලනි පැවදි සොයුරියත් ඇතුළු, ග්‍රේස් ගුරුතුමිය, නැසීගිය චාලට් ගුරුතුමිය ආදීන්වද සිහිපත් කළේ ගුරු ගෞරවයත්, ගුරු භක්තියත් නිසාවෙනි. අති උතුම් හැරල්ඩ් ඇන්තනි පෙරේරා රදගුරු හිමි, අති උතුම් මේරියස් පීරිස්, ආචාර්ය හෙන්රි සිල්වා පියතුමාවද බැතිබරව සිහිකරයි.

අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා නවක රදගුරු හිමිපාණන් දෙවි මහෝත්තමයාණන් විල්ලෝරාවත්ත කුඩා මීසම් සංඝයට ලබා දුන් දේව තිළිණයකි. මොරටුව පුරවරයෙන් දොරට වඩින හතර වැනි රදගුරු හිමිපාණන් ලෙස අති උතුම් මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා රදගුරු හිමිපාණන් වෙත, කොළඹ අගරදගුරු පදවිය තුළ පැවරෙන දූත කාර්යය සාර්ථකව ඉටු කිරීමට අවශ්‍ය ශුද්ධාත්ම මඟ පෙන්වීමත්, නිරෝගී ශාරීරික සුවයක් ලැබේවා! තිස් වසරක පූජක දිවිය තුළ ලැබූ අත්දැකීම් ඉදිරි ගමන යන්නට ශක්තියක් වේවා!

✍ **ට්‍රිසිල් එෆ්. මැන්දිස්**

# සැරදේවා නව රදගුරු හිමිපාණෙනි



**යාපනයේ විසූ කීර්තිධර සිවිල් ඉංජිනේරුවරයෙකු වන නැසීගිය විසුවාසම් සේවියර් බැස්ටියන් ප්‍රනාන්දු සහ නැසී ගිය ඥානසොරොබි ප්‍රනාන්දු යුවලගේ පවුලේ බාලයා ලෙස 1948 මැයි මස 20 වන දින ෆිඩෙලිස් ලයනල් එම්මැනුවෙල් දරුවා මෙලොව එලිය දිටීය. දේව ගරු බිය ඇතිව ජීවත් වූ ප්‍රනාන්දු යුවල කුඩා එම්මැනුවෙල්ව 1948 මැයි මස 29 වන දින අසරණයන්ගේ සරණය වන දෙව්මව්න්ගේ දේවස්ථානයේ දී නි.ම.නි විදේශික ධර්මදූතයෙකු වන එස්. වෙන්ඩර්කෝන් පියතුමන්ගේ පින්බර දෝතින් ප්‍රසාද ස්නාපනය ලබා දුනි. කුඩා එම්මැනුවෙල්ගේ පියා රජයේ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවෙන් විශ්‍රාම ගෙන කොළඹ පෞද්ගලික ආයතනයක සේවයට පැමිණීම නිසා මෙම පවුල කොළඹට සංක්‍රමණය වී කොටහේනේ පදිංචියට පැමිණියේ ය.**

තම බාල පුතා පාසල් යැවීමේ කාලය එලබියෙන් ඔහුව 1953 දී අධ්‍යාපනය පිළිබඳ සිරිලක නම් ඇරු දලාසාල් පැවිදි සොහොයුරන් විසින් පාලනය කරන කොටහේනේ සා. බෙනදික් පෞද්ගලික විදුහලට කුඩා එම්මැනුවෙල්ව ඇතුලත් කරන ලදුව ඔහු අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) දක්වා එහිදී අකුරු කරවන ලදී. දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලද මෙතුමා වයස අවුරුදු 12 සිට කොටහේනේ විහාරස්ථානයේ වැඩ විසූ ගෞරවණීය ස්වාමින් වහන්සේගේ මඟ පෙන්වීමෙන් සිංහල භාෂාව ප්‍රගුණ කරලීය.

සාමාජික සාමාජිකාවන් අට දෙනෙකුගෙන් සමන්විත තම පවුලේ වැඩිමහල් සොහොයුරා යාපනය පදවියේ පූජකයෙකු වීම නිසා ද, තමන්ගේ සොහොයුරියන් දෙදෙනෙකු කන්‍යා සොහොයුරියන් වීම නිසා ද, තමා කොටහේනේ සා. ලුසියා ආසන දෙව්මැඳුරේ පුදසුන් සේවකයකු වශයෙන් ද කටයුතු කළ බැවින් දේව කැඳවීමේ බීජය මොහු තුළ රෝපණය විය. මේ අනුව කොළඹ අගරදගුරු වසමේ සේවය සඳහා පූජකවරයකු වීමේ අභිලාසයෙන් 1965 දී ගරු සික්ස්ටස් කුරුකුලසූරිය පියතුමාගේ මඟපෙන්වීමෙන් බොරැල්ලේ පිහිටි සා. ඇලෝසියස් කණිටු දෙව්සත්හලට ප්‍රවිශ්ඨ විය. වත්මන් කොළඹ අගරදගුරු අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් ද මෙදිනම දෙව්සත්හල් ගතවීම දෛවෝපාගත සිදුවීමකි.

කණිටු දෙව්සත්හලේ මූලික පූජක පුහුණුවෙන් පසුව හපුතලේ පිහිටි සා. එමාඩ් අතරමැදි දෙව්සත්හලේ මාස කිහිපයක වැඩිදුර පූජක පුහුණුවෙන් පසුව 1966 දී මහනුවර අති සුන්දර පරිසරයක පිහිටි ශ්‍රී ලංකා අප ස්වාමිදුවට කැපකර ඇති අන්තර් පදවි ජාතික දෙව්සත්හලට ඇතුලත්ව දර්ශන වාදය පිළිබඳ වසර 3 ක උසස් පාඨමාලාව හදාරා ඩිප්ලෝමා සහතිකයක් ලබා ගත්තේය.

තරුණ එම්මැනුවෙල් සහෝදරතුමා තුළ සැඟවුනු දක්ෂතා සහ කුසලතාවයන් ර සක් ඇති බවත්, ඔහුට දිදුලන අනාගතයක පෙර නිමිති ඇති බවත්, ඉවෙන් මෙන් දැනගත් එවකට කොළඹ නායක එඬේරාණන් වශයෙන් කටයුතු කළ ශ්‍රී ලංකාවේ පළමුවන කාදිනල් ධූරන්දර දේව සේවක අතිගරු තෝමස් බෙන්ජමින් කුරේ කාදිනල් හිමිපාණන් දේව ධර්මය හැදෑරීම සඳහා මෙතුමාව රෝමයට යවන ලදි. 1969 දී රෝමයේ ප්‍රොපගැන්ඩා ෆීඩෙයි සසුන් පිය සරසවියට ඇතුලු වූ මෙතුමා 1972 දී දේව ධර්මය පිළිබඳව පශ්චාජ්ත් උපාධිය හිමිකර ගත්තේ ය. ඉන් අනතුරුව 1973 ජනවාරි මස 06 වන දින ලෝකයේ විවිධ රටවල් 19 කින් සුදුසුකම් ලබා පැමිණි ගරු සහෝදරවරුන් 38 දෙනෙකු සමඟින් එවකට සසුනිසුරාණන්ව සිටි ස්වර්ගස්ථ වී වදාළ දේව සේවක 6 වන පාවුළු සුදොතුම් පියාණන්ගේ ශුද්ධවන්ත දැතින් පුදැදුරු වරම් ලැබීය. එවකට කොළඹ අගරදගුරුව සිටි කාදිනල් කුරේ හිමිපාණන්ගේ උපදෙස් මත තම පූජකවරයෙන් පසුව රෝමයේ නැවතුන මෙතුමා උර්බානු සසුන් පිය සරසවියට අනුබද්ධිත වී ශීල ධර්මවේදය විශේෂ කොට ශාස්ත්‍රපති උපාධිය 1974 දී දිනා ගන්නා ලදි. ඉන්පසුව තම මව්බිමට පැමිණ සපුගස්කන්ද සා. සේවියර් දෙව්මැඳුරේ නේවාසිකව දළුගම මීසමේ සහයක මීසම් සේවක වශයෙන් කටයුතු කළේ ය. 1975 දී වග වැලිකන්න ශු. ජපමාල රාජේශ්වරියන්ගේ දෙව්මැඳුරේ නේවාසිකව හංවැල්ල මීසමේ සහය මීසම් සේවක වශයෙන් කටයුතු කළ මෙතුමා 1976 වසරේ දී කොටහේන සහය මීසම් සේවක වශයෙන් කටයුතු කරද්දී, කොච්චිකඩේ සිද්ධස්ථාන භාර පියතුමා වශයෙන් සේවය කළේ ය.

ඉන් පසුව මීසම් සේවයෙන් සමුගෙන 1976 දී මහනුවර ජාතික දෙව්සත්හලේ ආචාර්ය මණ්ඩලයේ සේවය කරමින් එහි සදාචාර ධර්මය සහ ශිලධාර්මික මූලධර්ම පිළිබඳ කතිකාචාර්ය මෙන්ම ඥනාප්‍රගාසර් දෙමළ සංස්කෘතික ආයතනයේ උපාධ්‍ය පියතුමා වශයෙන් කටයුතු කළේ ය. 1981 දී තම ආචාර්ය උපාධිය සඳහා විදෙස් ගතවී ඇමරිකාවේ වොෂිංටන් නුවර පිහිටි කතෝලික විශ්ව විද්‍යාලයට අනුබද්ධ වී තම ආචාර්ය උපාධිය හිමිකර ගත්තේ ය. ඉන් පසුව නැවත 1987 දී ශ්‍රී ලංකාවට සැපැත් වූ මෙතුමා සුපුරුදු ලෙස ජාතික දෙව්සත්හලේ මහාචාර්ය ධූරයේ වැඩකටයුතු වල නිරත විය. 1989 දී එහි උප අධ්‍යක්‍ෂ ධූරයට ඔසවනු ලැබීය. 1991 දී ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය මඟින් ජාතික දෙව්සත්හලේ අධ්‍යක්‍ෂ ධූරයට පත්කරනු ලැබූ මෙතුමා මේ සමයෙහි ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනයේ දේවධර්මය පිළිබඳ කමිටුවේ සමාජිකයෙක් ද විය. 1998 වසරේ දී තම අධ්‍යාපන නිවාඩුව සඳහා වසරකට විදේශ ගත වූ මෙතුමා නැවත පැමිණ කොළඹ අගරදගුරු පදවියේ පර්යේෂණ කාර්යංශයේ අධ්‍යක්‍ෂ වශයෙන් වැඩ භාර ගත්තේ ය. මේ සමයෙහි දී කිතු දහමේ ව්‍යාප්තිය පිළිබඳව ස්ථාන 8 ක ප්‍රදර්ශන සංවිධානය කිරීමට මෙතුමා මූලික විය.

2001/2002 කාලසීමාව තුළ තිල්ලන්දූව මීසම් සේවක වශයෙන් කටයුතු කරමින් බෝලවලාන දිසාවේ දිසානායක ධූරය ද හොබවන ලදී. 2002 සිට 2009 දක්වා මොරටවු මීසම් සේවක වශයෙන් කටයුතු කරමින් මොරටුව දිසාවේ දිසානායක ධූරය ද හොබවන ලදී. මෙම සේවාවට අමතරව 2004 දී කොළඹ අගරදගුරු පදවියේ ධර්මෝපදේශ හා පවුල් ජීවිත පිළිබඳ අපෝස්තලික සේවාව භාර කලාපීය අනුනායක වශයෙන් ද කටයුතු කළේ ය. 2009 වසරේ දී මෙතුමා මීසම් සේවාවෙන් නිදහස් කොට කොළඹ අගරදගුරු පදවියේ දකුනු කලාපය (මොරටුව හා කළුතර දිසා) භාර කලාපීය අනුනාහිමි ලෙස පත් කළේ ය. කළුතර පලාතොට දහම් සෙවන අතරමැදි දෙව්සත්හලේ නේවාසිකව සිටි මෙතුමා කලාපීය අනුනායක ලෙස අමිල සේවාවක් ඉටුකරන ලදි. මාරිස්ට් සහෝදරතුමන්ලා විසින් පාලනය කරන ලද කළුතර සිරිකුරුස විදුහල 2010 වසරේ දී කොළඹ අගරදගුරු පදවියට පවරා ගැනීමෙන් පසු එහි පළමුවන විදුහල්පති ධූරයට මෙතුමා පත්කරන ලද්දේ කලාපීය අනුනායක ධූරයට අමතරවය. එම වසරේ දී ම කොළඹ අගරදගුරු පදවියේ දෙමළ අංශය භාර කලාපීය අනුනායක වශයෙන් පත්වීම් ලදමෙතුමා අගරදගුරු මැඳුරේ නේවාසික සියලුම දෙමළ බැතිමතුන් ඒකරාහිකොට ඔවුන් සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන්නට මහත් වෙහෙසක් දැරීය. මේ අතර තුර බොරැල්ලේ සිංහල දේවධර්ම නිකේතනයේ සහ ඇක්වයිනස් වද්‍යායතනයේ කතිකාචාර්ය ධූරයන් ද උසුලන ලදි.

2011 නොවැම්බර් මස 28 වන දින ඔර්ටා (ORTA) හි නාමධාරි කොළඹ අගරදගුරු පදවියේ සහයක රදගුරුතුමන් ලෙස 16 වන බෙනදික් සුදොතුම් පියාණන් විසින් ප්‍රකාශයට පත්කරන ලදි.

පත්වීම් ලද නවක රදගුරු හිමිපාණනි, ඔබ තුමා ලද අධ්‍යාපන දැනුමෙන් මෙන්ම මීසම් සේවයෙන් ලද පන්නරයෙන් අමිල වූ සේවාවක් කොළඹ අගරදගුරු පදවියට කිරීමට වරම් ලැබේවා.

**කඩුවෙල වැලිවිට මීසම් සේවක :**
**ගරු එල්මො රාජ් ප්‍රනාන්දු පියතුමා**



**කොළඹ අගරදගුරු අති උතුම් දෙව් දහම් විශාරද ආචාර්ය මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ව සුදසුන මඟින් කාදිනල් ධූරයෙන් පුදනු ලැබූ පසු එතුමන් කාර්ය බහුලවිය. ශ්‍රී ලංකාවේ කාර්යභාරයට අමතරව ශුද්ධාසනයේ වැඩ කටයුතු වල නිරත වීමට ද, නිතර විදේශ ගතවීමට සිදුවීම නිසා ද තමා හට සහයක රදගුරුවරුන් කීප නමකගේ සේවාව ලබා දෙන ලෙස රෝමයෙන් ඉල්ලා සිටියේ ය. මේ නිසා මෙම ධූර වලට අසවල් පූජකතුමන්ලා පත්වේ යයි තැන තැන පූජක හා ගිහියන් අතර කසු කුසුවක් පැතිරෙන්නට විය. එහෙත් අවසානයේ දී සියල්ල ඉතා සූක්ෂම ලෙස පරිශීලනය කළ 16 වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමන් විසින් ශුද්ධාත්ම ආලෝකයෙන් පිරිපුන් සහයක රදගුරු හිමිවරුන් දෙදෙනෙකු කොළඹ අගරදගුරු පදවිය සඳහා පත් කරන ලදි. මේ අනුව දැනට කොළඹ අගරදගුරු පදවියේ දෙමළ අංශය භාරව කටයුතු කරන අතිගරු ෆිඩෙලිස් ලයනල් එම්මැනුවෙල් ප්‍රනාන්දු සහ දැනට කෝට්ටේ සාන්ත තෝමස් රජයේ විදුහලේ විදුහල්පති ධූරය හොබවන ගරු මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා යන පියවරුන් දෙනමව රදගුරු නිලයට පත් කරනු ලැබූහ.**

2012 පෙබරවාරි මස 11 වන දින උදේ 9.00 කොටහේනේ සා. ලුසියා ආසන දෙව්මැඳුරේ දී කොළඹ අගරදගුරු අති උතුම් දෙව් දහම් විශාරද ආචාර්ය මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සහ ශ්‍රී ලංකා රදගුරු මණ්ඩලයේ සියලුම රදගුරු තුමන්ලාගේ සහභාගිත්වයෙන් සහ විශාල ගිහි පැවිදි අයගේ සහභාගිත්වයෙන් පැවැත්වෙන විශේෂ දිව්‍ය පූජා යාගය තුළ මෙම නවක සහයක රදගුරුවරු දෙනම අබිසෙස් ලබා සේවයට කැපවන්නාහ.

### මොරටුවෙන් තවත් රදගුරු තුමෙක්

පුරෝගාමීත්වයේ නගරයයි නම් ලත් ලී බඩු නිශ්පාදනයෙහි ලෝ සුපතල නමක් දරා ඇති මොරටුව පුරවරයේ අති රමණීය ගම්මානයක් වන විල්ලෝරාවත්ත ප්‍රදේශයේ පදිංචිව සිට නැසීගිය බැතිමත් කතෝලික යුවලක් වන සම්පතාවඩුගේ ස්ටැන්ලි ජෝන් සිල්වා සහ නැසීග ිය කුරුකුලසූරියගේ ඉව්ලින් වික්ටෝරියා ඩයස් යුවලට දාව එම පවුලේ මද්දුමයා ලෙස මැක්ස්වල් ග්‍රැන්විල් කුල කුමරුවා 1952 සැප්තැම්බර් මස 27 වන දින මෙලොවට ජනිත විය. එවකට කඩලාන මීසම් සේවකව සිටි නිර්මල මරිය නිකායික ප්‍රංශ ධර්මදූතයෙකු වන ගරු ඒ. ජී. තෝමස් පියතුමාගේ පින්බර දෝතින් ළදරු මැක්ස්මල් 1953 ඔක්තෝබර් 11 දින ප්‍රසාද ස්නාපනය ලැබීය.

ළදරු මැක්ස්වල්ව පාසලට ඇතුලත් කිරීමේ කාලය එලබෙත්ම ඔහුගේ දෙමාපියෝ ඔහුව තම නිජබිම වන විල්ලෝරාවත්ත රෝමානු කතෝලික පාසලට ඇතුලත් කරන ලදි. එහි පහල බාලාංශයේ ඉගෙනුම අවසන් කළ මොහු 1961 දී මොරටුව පුරවරයේ ජනප්‍රිය හා සුපිරි පාසලක් වන එවකට ද ලාසාල් පැවිදි සොහොයුරන් විසින් පාලනය කරන ලද සා. සෙබස්තියන් පෞද්ගලීක පාසලට ඇතුලුවී අ.පො.ස (සා.පෙල) දක්වා එහි සිප් සතර හැදෑරීය. මේ සමයෙහි දී ඔහු පූජා සහයකයකු ලෙස කටයුතු කළ බැවින්, දේව කැඳවීමේ බීජය ඔබ තුළ රෝපණය විනි. මේ අනුව එවකට කඩලාන මීසම් සේවක වශයෙන් කටයුතු කළ ස්වර්ග ස්ථ වී වදාල ගරු ටියුඩර් වනිගසේකර පියතුමාගේ පූර්ණ අනුශාසකත්වයෙන් 1969 දී කොළඹ අගරදගුරු පූජක සේවාවේ නියැලීමේ අපේක්ෂාවෙන් යුතුව කොළඹ අගරදගුරු පදවියේ හදවත බඳු බොරැල්ලේ කින්සි පාරේ පිහිටි සා. ඇලෝසියස් කණිටු දෙව්සත්හලට පිය මැනීය. එහි මූලික පූජක පුහුණුවෙන් පසුව 1971 දී හපුතලේ පිහිටි සා. එමාඩ් අතර මැදි දෙව්සත්හලට ඇතුලු වී වැඩිදුර පූජක පුහුණුව ලැබීය. ඉන් ඉක්බිති 1974 දී ශ්‍රී ලංකාවට පූජක පුතුන් බිහි කරන තෝතැන්න වන මහනුවර අම්පිටියේ අති රමණීය කඳුගැටයක පිහිටි ශ්‍රී ලංකා අප ස්වාමිදුගේ ජාතික දෙව්සත්හලට ඇතුලු වී පුරා වසර 8 ක් දර්ශන වාදය හා දේවධර්මය පිළිබඳව උසස් පාඨමාලාව හදාරා රෝමයේ උර්බානු සසුන් පිය සරසවියෙන් පිරිනමන දේවධර්ම පිළිබඳව පශ්චාජ්ත් උපාධිය දිනා ගන්නා ලදි. දෙව්සත්හලේ සිටි දක්‍ෂ ටෙනිස් හා ක්‍රිකට් ක්‍රීඩකයෙකු වන මෙතුමා සහෝදරවරුන් සියලු දෙනාගේම කුළුපග මිතුරෙකු විය.

1981 ජූලි මස 25 වන දින තවත් සහෝදර පූජක පුතුන් 12 දෙනෙකු සමඟින් කොළඹ කොටහේන සා. ලුසියා ආසන දෙව්මැඳුරේ දී එවකට කොළඹ අගරදගුරුව සිටි අති උතුම් දෙව් දහම් විශාරද ආචාර්ය නික්ලස් මාකස් ප්‍රනාන්දු හිමිපණන්ගේ පින්බර සුරතින් කොළඹ අගරදගුරු පදවි සේවාව සඳහා පුදදුරු වරම් ලබා සසුන් ගත විය. ඉන්පසුව දළුගම මීසමේ සහයක මීසම් සේවක වශයෙන් කටයුතු කළ මෙතුමා 1983 දී මිදෙල්ලවිට මීසමේ මීසම් සේවක වශයෙන් කටයුතු කළේය. මේ යුගයේ දී මිදෙල්ලවිට මීසමට දේවස්ථාන 5 ක් අයත්ව තිබිණි. මේ දේවස්ථානවල ජනතාවගේ අධ්‍යාත්මික හා සමාජ සංවර්ධන කටයුතුවලට මූලිකත්වය ගෙන කටයුතු කළ මෙතුමා ස්වඋත්සාහයෙන් කැලණිය විශ්ව විද්‍යාලයට ඇතුලු වී කලා අංශයෙන් ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය ද සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද හිමිකර ගන්නා ලදි. කෙතරම් අධ්‍යාපනික වැඩ බහුල වූවත් මීසමේ වැඩ අධික වූවත් සැම විටම සැම දෙනා සමඟ සිනහමුසු මුහුණින් යුතුව සැමදෙනා සමඟ වචනයක් හෝ දෙකක් කථා කිරීම මෙතුමාගේ සිරිත විය. එවකට කතෝලික පවුල් 25 කට අඩු සංඛ්‍යාවක් සිටි ගණේමුල්ල දේවස්ථානය සම්පූර්ණයෙන් කපරාරු කිරීම මෙතුමාගේ සේවා කාලයේ සිහිවටනයකි.

ඉන්පසු 1986 දී මාබෝල මීසම් සේවක වශයෙන් කටයුතු කළ මෙතුමා රජයේ ගුරු වෘත්තියට ප්‍රවිශ්ඨ වී ග්‍රැන්ඩ්පාස් සා. ජෝශප් පිරිමි විදුහලේ උප විදුහල්පති වශයෙන් කටයුතු කළේ ය. 1993 දී කෙරවලපිටිය දේවස්ථානයේ නේවාසිකව සිට රාගම බැසිලිකා මහ විදුහලේ නියෝජ්‍ය විදුහල්පති වශයෙන් කටයුතු කළේ ය. 2001 වසරේ දී කෝට්ටේ සා. තෝමස් විදුහලේ විදුහල්පති වශයෙන් පත්වීම් ලද මෙතුමෝ මේ වන තෙක් ම එම නිලයේ වැඩ කටයුතුවල නිරතවෙති. 2003 වසරේ දී ජාතික අධ්‍යාපන ආයතනයෙන් අධ්‍යාපනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හිමිකර ගත් මෙතුමා අතින් කෝට්ටේ සා. තෝමස් විදුහලට සිදුවූ සේවාව වචනයෙන් විස්තර කළ නොහැකිය. මෙම විදුහලේ විනය, ක්‍රීඩා, අධ්‍යාපන අංශවලින් ඉහල නමක් දිනා ගැනීමට හැකිවූයේ මෙතුමාගේ ධෛර්ය නිසාමය. ගුරු, ශිෂ්‍ය, දෙමාපිය, ආදි ශිෂ්‍ය සබඳතා මනා ලෙසින් ගොඩනගා ගනිමින් ප්‍රදේශයේ ජනප්‍රියතම පාසලක් බවට පත් කිරීමට මෙතුමාට හැකිවිය.

2011 නොවැම්බර් මස 28 වන දින “ලෙසීනා” හී නාමධාරී කොළඹ සහයක රදගුරු තුමන් ලෙස පත්කළ බව 16 වන බෙනඩික් සුදොතුම් පියාණන් විසින් ප්‍රකාශයට පත් කරන ලදී.

අවංක, නිහතමානී, එඩිතර, කාර්යශූර අබිසෙස් ලාභි නවක මැක්ස්වල් සිල්වා රදගුරු හිමිපාණනි, ඔබ තුමා ලඟ ඇති අත් දැකීම් සම්භාරය තුළ කොළඹ අගරදගුරු පදවියේ දේව වචනය මාංශ ගතකරවීමට අවශ්‍ය සුදොතුම්








# නව රදගුරු
# කාචයේ සටහන්

## කොළඹ අගරදගුරු පදවි නව සහයක රදගුරු අති උතුම් ෆිඩෙලිස් ලයනල් එම්මෑනුවෙල් හිම්පාණන්ගේ නිල ලාංඡනය

**සෑම රදගුරුතුමකුටම තමනට ආවේනික වූ නිල ලාංඡනයක් සහ තේමාවක් ඇත. මෙම නිල ලාංඡනයේ සහ තේමාවේ අදහස් මත තම අනාගත එඬේරික කර්තව්‍ය අර්ථවත් කර ගැනීමට ඔවුහු අදිටන් කරගනිති. මෙම නිල ලාංඡනය ඔහු සකස් කරගනුයේ තම රටේ සංස්කෘතිය, සදාචාරය සහ සභ්‍යත්වය පදනම් කරගනිමිනි. බොහෝ විට මෙම ලාංඡනය දේශය කලාවෙන් ඔපවත් වේ. මේ අනුව අගරදගුරු පදවි නව රදගුරු අති උතුම් දෙව් දහම් විශාරද ආචාර්ය ෆිඩෙලිස් ලයනල් එම්මෑනුවෙල් ප්‍රනාන්දු හිම්පාණන්ගේ නිල ලාංඡනය ද ඉහත කී අයුරු නිර්මාණය වී ඇත.**

නව රදගුරු හිම්පාණන්ගේ නිල ලාංඡනය වටකොට එය පසකට ගැට පේලි තුන බැගින් දෙපස ගැට දොළොසකින් සම්බන්ධ වූ අති විශාල හිස් වැසුමකි. මෙයින් මොහු රෝමානු කතෝලික සභාවේ නිලලත් අයෙක් බව හඟවනු ලැබේ. මෙතුමාගේ නිල ලාංඡනයේ බඳ කොටස තද රක්ත වර්ණයෙන් සහ නීල වර්ණයෙන් ඔප් නැංවී ඇත. තද රක්ත වර්ණය ප්‍රාණ පරිත්‍යාගී බව හඟවයි. එසේම එම කොටසේ පහලින් ඇති ඔලීව අතු දෙක සා. ලුසියා ප්‍රාණ පරිත්‍යාගී මුනිවරියට කැපකර ඇති ආසන දෙව්මැඳුරට අනුබද්ධිතව හැදී වැඩුණු බව මෙය සිහියට නඟවයි. එසේම මෙම ලාංඡනයේ රක්ත වර්ණ කොටසේ පහලින් නැංගුරමක සළකුණක් දක්නට ලැබේ. මේ මඟින් දේව ධාර්මික බලාපොරොත්තුව පෙන්නුම් කෙරේ. නවක රදගුරු තුමා තම පූජක ජීවිතයෙන් වැඩිකලක් දේව ධර්මීය ඉගැන්වීමේ කාර්යභාරයට උර දුන් කථිකාචාර්යවරයකු බව සනිටුහන් කෙරේ.


මෙම නිල ලාංඡනයේ ඉහළ කොටස නීල වර්ණයෙන් ඔපවත් වී ඇති අතර එහි කොන් අටක් ඇති සුවිශාල සුවිශේෂී වල්ගා තරුවක් දක්නට ලැබේ. මේ මඟින් ජේසු සමිඳුන් බෙත්ලෙහෙමේ උපන් කල මෙවැනි සුවිශේෂී තරුවක් ස්වර්ගයෙන් ලෝකයට පැමිණ අහසේ දර්ශනය වී සමිඳාණන් වහන්සේ මනුෂ්‍යයන් අතර ඉපදී ඇති බව ලෝකයාට පෙන්නුම් කළ බව හඟවයි. නවක රදගුරු හිම්පාණන්ගේ නම එම්මෑනුවෙල් වේ. මෙම ඉංග්‍රීසි වදනේ අර්ථය “සමිඳාණෝ අප සමඟය” යන්නයි.

නවක රදගුරුතුමාගේ නිල ලාංඡනයේ බඳ කොටසේ හරිමැද මරිමව් සංකේතය දක්වා ඇති අතර එමඟින් නවක රදගුරුතුමා දෙව්මවුන්ට දක්වන ආදර සහ ගෞරවය හුවා දක්වන අතර තමන්ගේ රදගුරු සේවාව මරිමවුන්ගේ මැදිහත්කමින් සාර්ථකවත් කරගැනීමට අදිටන් කරන බව පෙන්නුම් කෙරේ.

මෙම නිල ලාංඡනයේ හරි මැදින් රදගුරු යශ්ටිය දිස්වේ. මිනිස් වර්ගයාගේ පව් වෙනුවෙන් කුරුසියේ ඇණගැසුම් කෑ ජේසු සමිඳුන්ව මුළු ලොවට හඳුන්වා දීමට තම රදගුරු එඬේරික සේවාව තුළ කැපවන බව පෙන්නුම් කරයි.

මෙතුමාගේ තේමා වදන වශයෙන් තෝරාගෙන ඇත්තේ "DOMINUS VOBISCUM" යන ලතින් වදනකි. මෙහි සිංහල අර්ථය “ස්වාමින් වහන්සේ ඔබ සමඟ වන සේක්වා” යනුයි.


★ මෙම ලාංඡනය නිර්මාණය - ගරු ඇන්සලම් කෲස් පියතුමා ★ ග්‍රැෆික් නිර්මාණය - ගරු අමිල රවින්ද්‍ර වැන්වෝල් පියතුමා (කෝට්ටේ සහය මීසම් සේවක) ★ සිංහල අර්ථකථනය - ගරු එල්මෝ රාජ් ප්‍රනාන්දු පියතුමා (සා. මරියා දේවස්ථානය, වැලිවිට, කඩුවෙල)
























# මීගමුව - තිල්ලන්දූවේදී අප දුටු ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමා

2001 මැයි මස 10 වන දින මුළු පුංචි රෝමයම දුක් සාගරයක ගිල්වමින් ඉතාමත් අභිරහස් ලෙස ගරු අබා කොස්තා පියතුමා මීගමුව සා. ජෝශප් දේවස්ථානයේ මීසම් ගෘහය තුළම ඝාතනය කර තිබුණි. එම අභිරහස්‍යමය ඝාතනයෙන් පසු මුළු තිල්ලන්දූව මීසමේ පමණක් නොව මීගමුව පුරවරයේත් සමස්ත ශ්‍රී ලංකාවේත් කතෝලික ජනතාව කම්පාවට පත් වූ අතර එම අභිරහස් මරණය පිළිබඳ කිසිම තොරතුරක් එළිදරව් නොවීම නිසා දැඩි කනස්සල්ලටත්, කළකිරීමටත් පත්වූ බව රහසක් නොවේ.

ගරු අබා කොස්තා පියතුමා ඝාතනය වූයේ තිල්ලන්දූව (මල්වත්ත) ශාන්ත ජෝශප් දේවස්ථානයේ සියවස් ජුබිලිය සැමරීමට හරියටම වසරක් තිබියදී එම ජුබිලි මංගල්‍යයට මීසම් ජනතාව අධ්‍යාත්මිකව පෙළ ගැසෙමින් සහ ජුබිලි මංගල්‍ය කටයුතු සැලසුම් කරමින් සහ සම්පාදනය කරමින් සිටිය දී ය.

එම කටයුතු සම්පාදනයේ මූලිකම නියමුවාවූ මීසම් සේවක ගරු අබා කොස්තා පියතුමා කිසිවෙක් නොසිතූ මොහොතක අභිරහස්‍යමය ලෙස හදිසියේ ඝාතනය වීමෙන් පසු තිල්ලන්දූව මීසම් ජනතාවත්, විශේෂයෙන්ම ජුබිලි මංගල්‍ය කටයුතු සම්පාදනයේ පෙරමුණ ගෙන ක්‍රියා කළ මීසමේ මූලිකයිනුත් එඬේරා නොමැති බැටළු රැළක් මෙන් විසුරුනු අතර මහසයුර මැද දී හදිසියේම කපිතාන්වරයා මියගිය මගී නෞකාවක් මෙන් අසරණ විය. “කළයුත්තේ කුමක් ද? නොකළ යුත්තේ කුමක්දැයි” තීන්දු තීරණ ගැනීමට මූලික වීමට කිසිවකු නොවීය.

ගරු අබා කොස්තා පියතුමා ඝාතනය කොට තිබුණේ මීසම් ගෘහය තුළවූ අතර මීසම් ගෘහයට ඇතුළුවන විසිත්ත කාමරයේ බිම පුරාමත් බිත්තිවලත් එතුමාගේ රුධිරය විසිරී ගලාගොස් තිබූ අතර එය දුටු මීසම් ජනතාව මෙන්ම කතෝලික පූජා ප්‍රසාදිවරුන්ද භීතියට මෙන්ම බලවත් සංත්‍රාසයට පත්විය. එනිසා කිසිම පියතුමකු නැවත මෙම මීසමට පැමිණෙතැයි මීසම් වාසීන් සිහිනෙන්වත් නොසිතූහ. තිල්ලන්දූව මීසමට පැමිණ මීසම් සේවක පියතුමන් වශයෙන් අධ්‍යාත්මික කටයුතු ආරම්භ කරන ලෙස අගරදගුරුතුමන් ගරු පියවරුන් කීපදෙනකුගෙන්ම ඉල්ලා සිටියද ඒ සියලුම දෙනා එය ප්‍රතික්ෂේප කළ බවට ද විවිධ ආරංචි පැතිර යන්නට විය. එනිසා තිල්ලන්දූව මීසම් ජනතාව ඉරිදා දිව්‍ය පූජාවට වෙනත් දේවස්ථාන සොයා ඇදීගිය අතර තම ආගමික අවශ්‍යතා යාබද මීසම් සේවක පියවරුන්ගෙන් ඉටුකර ගැනීමට ද පියවර ගත්හ.

නව මීසම් සේවක පියතුමකු පිළිබඳ අදහස අත්හරිමින් මෙලෙස සති කීපයක් ගෙවී ගියේය. අබා කොස්තා පියතුමාගේ ඝාතනයත් සමඟ තිල්ලන්දූව මීසමේ ද අවසානය සිදුවිනැයි බොහෝ දෙනා සිතූහ.

කාලය මෙලෙස ගෙවී යද්දී මහනුවර අම්පිටිය දෙව්සත්හලේ අධ්‍යක්ෂ පියතුමා වශයෙන් කටයුතු කොට නිවාඩුවක් සඳහා විදේශගතව සිට සේවය සඳහා නැවත දිවයිනට පැමිණෙන ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු නමැති පියතුමකු තිල්ලන්දූවට එන බවට ආරංචියක් පැතිර යන්නට විය. එහෙත් එය කිසිවෙකුත් විශ්වාස නොකළ අතර එබඳු උසස් තනතුරු හෙබවූ පියතුමකු තිල්ලන්දූව වැනි මීසමකට පැමිණෙන බවට පැතිරෙන කතාව තවත් එක් ප්‍රබන්ධයක් පමණක් වියහැකි බව පවසමින් බොහෝ දෙනා එය මුළුමනින්ම බැහැර කළහ.

එහෙත් ඒ සියළුම මිත්‍යාවන් දුරු කරමින් 2001 වසරේ ජුනි මාසයේ දිනක එතුමා හුදෙකලාවම අපගේ දේවස්ථානයේ මීසම් සේවක පියතුමන්

15 පිටුවට »

ආර්. දම්මිකා රූද්‍රිගෝ
තිල්ලන්දූව, මීගමුව





# හිමි දෙනමගේ මතක තොරතුරු






## අතිඋතුම් මැක්ස්වල් සිල්වා නවක සහයක රදගුරු හිමිපාණන්ගේ නිල ලාංඡනය


**සෑම රදගුරුතුමකුටම තමනට ආවේනික වූ නිල ලාංඡනයක් සහ තේමාවක් ඇත. මෙම නිල ලාංඡනයේ සහ තේමාවේ අදහස මත තම අනාගත සේවාව අර්ථවත් කරගැනීමට ඔවුහු අදිටන් කර ගනිති. මෙම නිල ලාංඡනය ඔහු සකස් කරගනුයේ තම රටේ සංස්කෘතිය, සදාචාරය සහ සභ්‍යත්වය පදනම් කරගනිමිනි. බොහෝ විට මෙම ලාංඡනය දේශීය කලාවෙන් ඔපවත් වේ. මේ අනුව කොළඹ පදවි නව සහයක රදගුරු අති උතුම් දෙව්දහම් විශාරද ආචාර්ය මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා හිමිපාණන්ගේ නිල ලාංඡනය ද ඉහත කී අයුරින් නිර්මාණය වී ඇත.**

නව රදගුරු හිමිපාණන්ගේ ලාංඡනය වටකොට එකපසකට ගැටපේළි තුන බැගින් දෙපස ගැට පේලි 12 ක් සමඟින් සම්බන්ධ වූ අති විශාල හිස්වැස්මක් ඉහළින්ම දක්නට ලැබේ. මේ මඟින් මෙතුමා රෝමානු කතෝලික සභාවේ නිලලත් පාලකයකු බව හඟවයි. මෙතුමාගේ නිල ලාංඡනයේ බඳ කොටස මෙරූන් වර්ණයෙන් සහ රන්වන් පැහැයෙන් යුක්තය. මෙම බඳ කොටසේ ඉහළ කොටස රන්වන් පැහැයෙන් යුක්තවන අතර එය ජයග්‍රහණය සංකේතවත් කරයි. එහි පහල කොටස මෙරූන් වර්ණයෙන් යුක්තවන අතර එය ජයග්‍රහණය සංකේතවත් කරයි. එහි පහළ කොටස මෙරූන් වර්ණයෙන් යුක්තවන අතර එය ශක්තිය හඟවයි. කෝට්ටේ සා. තෝමස් විදුහලේ ධජයට එහි නිර්මාතෘ ගරු සෙකරියස් පියතුමා යෙදූ මෙම වර්ණ මෙතුමා තෝරාගෙන ඇත්තේ තම පූජක ජීවිතයේ වැඩිම කලක් එහි විදුහල්පති ධුරය (වසර 10) හෙබවූ බැවිනි. මෙම වර්ණ දෙක වෙන් වන්නේ දැති කියතකිනි. එමඟින් වඩු කර්මාන්තයට ලෝ සුපතල මොරටු පුරවරයේ විල්ලෝරාවත්ත ග්‍රාමයෙන් මෙතුමා පැවත එන බව හඟවයි. මෙම ලාංඡනයේ බඳ කොටසේ පහළ කොටසේ රන් පැහැති පහනක් දක්නට ලැබෙන අතර එය දැනුම හා ප්‍රඥාව විදහා දක්වයි. එසේම එම පහනේ තුන් ආකාරයට බෙදුනු දැල්ලක් දක්නට ලැබේ. මෙය ප්‍රඥාවේ හා දැනුමේ මූලාරම්භය ශු. ත්‍රිත්වය බව හඟවයි. එසේම මෙම පහනේ බඳ කොටසේ පරෙවි විලාශයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේ නිරූපණය කරයි. එසේම මෙම පහනේ හැඬලය සඳහා යොදාගෙන ඇත්තේ එලබරිත වී කරලකි. මෙමඟින් වී කරලේ ධාන්‍යයෙන් ශ්‍රී ශුද්ධවූ පූජය නිපදවෙන බව හඟවයි. සියලු ප්‍රඥාවේ හා දැනුමේ උල්පත වන ශු. ත්‍රිත්වයේ සරණින් තම පූජක ජීවිතයේ වැඩිම කලක් ගුරු වෘත්තියේ නියැලුණා සේම එම ශු. ත්‍රිත්වයේ වරමින් වී කරළින් නිපදවන ශ්‍රී ශුද්ධවූ පූපයේ වැඩසිටින ජේසු සමිඳුන්ව ලොවට ප්‍රකාශ කිරීමට තම රදගුරුවරය ප්‍රයෝජනයට ගන්නා බව මෙමඟින් හැඟවේ.

මෙම ලාංඡනයේ ඉහළ කොටසේ ඇති නා මලින් දෙව්මවුන්ව සංකේතවත් වේ. තමාගේ සෑම වැඩකටයුත්තකදීම දෙව් මවුන් තුළ තිබුණා වූ නිහතමානීකම, බැහැපත්කම හා දේව කැමැත්ත ඉටුකිරීම වැනි ගුණාංගයන් ඉදිරියෙන් තබා ගන්නා බව පෙන්නුම් කරයි.

නව රදගුරුතුමාගේ ලාංඡනයේ හරිමැද අනුරාධපුර යුගයේ කුරුසිය දක්නට ලැබේ. මෙය කෝට්ටේ කතෝලික සංකේතය වශයෙන් ද යොදා ගනු ලැබේ. තමා කෝට්ටේ සේවයේ යෙදෙමින් සිටියදී රදගුරුවරයට ඔසවනු ලැබූ බව පසක් කර දෙයි. මෙතුමාගේ ආදර්ශපාඨය "CIBAVIT EOS EX ADIPE FRUMENITI" වේ. මෙය ලතින් වදනකි. මෙය ගීතාවලියේ 81 වන ගීතයේ 16 වන වගන්තියෙන් තෝරාගෙන ඇත. "එතුමාණෝ ඉස්තරම් ධාන්‍යයෙන් ඔබ පෝෂණය කරන සේක" යන්න මෙහි අර්ථයයි. මෙය දිව්‍ය සත්ප්‍රසාද මංගල දින භාවිතා කරන ගීය වේ. තමන් මෙතුවක් කල් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින් පෝෂණය ලද බවත් ඉදිරි සේවාවේදී ද එම පෝෂණයේ ශක්තිමත් වී ජනතා සේවයට කැපවූ බවත් ඉඟි කරවයි.

★ මෙම ලාංඡනය නිර්මාණය - ගරු ඇන්සලම් කෲස් පියතුමා
★ ග්‍රැෆික් නිර්මාණය - ගරු අමිල රවින්ද්‍ර වැන්වෝල් පියතුමා (කෝට්ටේ සහය මීසම් සේවක) ★ සිංහල අර්ථකථනය - ගරු එල්මෝ රාජ් ප්‍රනාන්දු පියතුමා (සා. මරියා දේවස්ථානය, වැලිවිට, කඩුවෙල)























## හැඳල - කෙරවලපිටියේදී අප දුටු ගරු මැක්ස්වල් සිල්වා පියතුමා

අපගේ දේවස්ථානය නායකකන්ද කෙරවලපිටිය ශා. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයයි. එවකට අප දේවස්ථානය භාරව කටයුතු කළේ නායකකන්ද මීසම් සේවකව සිටි, සග සුව දිනූ ගරු බෙනඩික් ජයතිලක පියතුමායි.

දිනක් එතුමා අප දේවස්ථානයට නේවාසිකව සිටිමින් සේවය කිරීමට ගරු පියතුමකු පැමිණෙන බව දැනුම් දෙන ලදී. සගසුව දිනූ ගරු සිරිල් පීරිස් පියතුමාගෙන් පසු වසර ගණනාවක් දේවස්ථානයට පියතුමකුගේ අඩුව හොඳින් දැන තිබීම නිසා පියතුමකු පැමිණීමේ ආරංචිය ලොකු කුඩා කාගේත් සිත් වලට විශාල සතුටක් ගෙන දෙන්නක් විය.

එවකට අපගේ මීසම් ගෘහය අබලන් තත්ත්වයක තිබූ බැවින් පියතුමකුට විසීමට සුදුසු තත්ත්වයට අලුත් වැඩියා කිරීමටත් දේවස්ථානයත් ඒ අවටත් පිරිසිදු කර පරිසරය පිරිසිදුව තබා ගැනීමටත් අප සැම උනන්දුවෙන් කටයුතු කළේ ගරු නවක පියතුමන් පිළිගැනීමටය.

එක් ඉරුදිනක සවස් වරුවේ පියතුමා පිළි ගැනීමට ගම්වාසී පිරිස දේවස්ථානයට එක් රොක් විය. නොබෝ වේලාවකින් පැමිණි වාහන ප්‍රමාණය නිසා දේවස්ථාන භූමියත් ඉන් පිටත් වාහන විශාල ප්‍රමාණයකින් පිරී ඉතිරී ගියහ. මෙසේ පැමිණි වාහන ප්‍රමාණයෙන් පැහැදිලි වූයේ මෙම පියතුමා මීට කළින් සිටි මාබෝල මීසමට කර ඇති මහඟු සේවාවයි. මේ අතර දේවස්ථානයේ ප්‍රධාන දොරටුව ඉදිපිට මිදුලෙහි පරණ මාදිලියේ වාහනයක් පැමිණ නතර කරන ලදි. එහි දොර ඇර බිමට බැස්සේ පැහැපත් සිනහවකින් මුව සරසා ගත් ජවසම්පන්න පියතුමෙකි. ඉන් පසු මාබෝලෙන් පැමිණි ජනතාව පියතුමාගෙන් සමුගෙන නැවත නිවෙස්වලට ගියේ දෙනෙත්වල කඳුළු පුරවාගෙනය. එදින ඔවුන්ගේ දෙනෙත් වල මා දුටු කඳුළුත් කලකට පසු පියතුමා අප දේවස්ථානයෙන් සමුගෙන කෝට්ටේ සා. තෝමස් විදුහලේ විදුහල්පති ලෙස වෙන්වී ගිය දින අප දෙනෙත් වලින් හෙළු කඳුළුත් එතුමා සහ අප අතර ඇති වූ ආදරයේත් එකමුතු කමේත් සහෝදරත්වයේත් සංකේතයක් ලෙස සිහිපත් කළ හැකිය.

1993.09.05 සිට 2001. 09.25 දක්වා එතුමා අප දේවස්ථානයට කළ සේවය අති ප්‍රශංසනීය විය. විවිධ සමිති සමාගම් ආරම්භකර, තිබූ සමිති සමාගම්වලට නව ජවයක් දී එතුමා ක්‍රියාකාරී සංගමයක් නිර්මාණය කළේ විශාල කැපවීමකිනි.

දේවස්ථානයේ වැඩිහිටි, තරුණ සහ කුඩා පිරිස් ඒකරාශී කර එතුමා නව ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණ කටයුතු විශාල ප්‍රමාණයක් කළේ දේවස්ථානය වෙනුවෙනි. මේ සෑම කටයුත්තකදීම එතුමාගේ ශ්‍රමය සහ දහදිය හෙළමින් ද අන් අය සමඟින් උරෙන් උර ගැටෙමින් මහන්සි වී වැඩ කිරීමට ද එතුමාට විශාල හැකියාවක් තිබුණි. සමහර අවස්ථාවල දී වැඩකරන පිරිස අතර එතුමා හඳුනා ගැනීමට පවා අපහසු විය. අන් අය මෙන් එතුමා ද දහඩිය හෙළමින් වැඩකළ අවස්ථා අනන්ත විය.

මා දිනක් එතුමා සමඟ දේවස්ථාන භූමිය පිරිසිදු කරමින් සිටින අවස්ථාවක දී වාහනයකින් පැමිණි මහතකු "ෆාදර් ඔෆිස් එකේ ඉන්නවද?" කියා පියතුමන්ගෙන්ම අසන ලදී. මෙවැනි අවස්ථා බොහෝ සිදුවී ඇත. අප දහඩිය හෙලන සෑම විටක දීම එතුමා ද අප සමඟ දහඩිය හෙලීම නිසා අපට ද ශාරීරික වශයෙන් හෝ මානසික වශයෙන් කිසිදු වෙහෙසක් ඇති නොවීය. ලොකු, කුඩා කාගේත් සිත් තුළ විශාල ශක්තියක් ඇති කිරීමට සමත් වූයේ එතුමාගේ එම ගුණයයි.

දුර දක්නා නුවණක් සහ පරිණත බුද්ධියක් මෙතුමා සතුවිය. ගස්වලට සහ පරිසරයට ආදරය කිරීමටත් පැලක් සිටුවන්නට, එයට සාත්තු කරන්නට, අලංකාර උද්‍යානයක් නිර්මාණය කරන්නට එතුමාට තිබුණේ 15 පිටුවට »

සුමිත් කුමාර - කෙරවලපිටිය, හැඳල









# ජන සමාජයේ ඇතිවන ප්‍රශ්නවලට බුද්ධියෙන් සිතා ආධ්‍යාත්මිකව පිළිතුරු දෙනවා මිස ඇඟෙන් හෝ ඔළුවෙන් කටයුතු කිරීම සුදුසු නැහැ.

## අති උතුම් එම්මානුවෙල් ප්‍රනාන්දු සහායක රදගුරු හිමි

යාපනය නම් සුන්දර ගම්මානයේ 1948 මැයි මස 20 වැනි දින උපත ලැබූ පිදේලිස් ලයනල් එම්මෑනුවෙල් නම් ළදරුවා කුඩා කාලයේ පටන්ම ආගමට දහමට ලැදිව තම ජීවිතය ගත කළේ පූජකවරය බලාපොරොත්තුවෙන් හෝ රදගුරුවරය බලාපොරොත්තුවෙන් නොව, තමන් උපන් බිමටත් එහි වසන සියල්ලන්ටත් කුමක් හෝ මෙහෙවරක් කිරීමේ අධිෂ්ඨානයෙනි. ලයනල් එම්මෑනුවෙල් ක්‍රමයෙන් කාය ශක්තියෙන් වැඩෙත්ම තම දෙමාපියන් කොළඹ නගරයට ගෙනැවිත් කොටහේන සා. බෙනඩික්ට් විද්‍යාලය වෙත ඇතුළු කරවිය.

කල්යත්ම දෙවියන් වහන්සේගේ හඬ තම අභ්‍යන්තරයෙන් ම ඇසෙන්නට වත්ම දේව කැමැත්ත ඉටුකරනු වස් පුහුණුව ලබාගනු සඳහා කොළඹ බොරැල්ල සා. ඇලෝසියස් පුංචි සෙමනේරියට ඇතුළු වූයේ 1965 ජනවාරි මස මුල්භාගයේ දී ය. එහිදී අධ්‍යාපන කටයුතු සඳහා ඇල්මක් දක්වමින් ආධ්‍යාත්මික ජීවිතයට ද නැඹුරුව ක්‍රීඩා කටයුතු කෙරෙහි ද උනන්දුව දක්වන ඔහු දෙවිසත්හල තුළ දීප්ත්මත් ජීවිතයක් ගත කරන්නට සමත් විය. පූජක පුහුණුවේ වැඩිදුර අධ්‍යාපන කටයුතු සඳහා හෙතෙම හපුතලේ සා. ජුලියන් එමාඩ් දෙවිසත්හල වෙත ඇතුළු වූයේ 1966 ජනවාරි මසදී ය.

එම දෙවිසත්හල තුළ හය මසක අධ්‍යාපනයක් ලබන ඔහු එම වසරේම ජූනි මස අම්පිටිය ජාතික දෙවිසත්හල වෙත ප්‍රවේශ වෙයි. එහි දී වසර තුනක කාලයක් තුළ දේව ධර්මය හා දර්ශනය හැදෑරීමෙන් අනතුරුව තේවාචාර්යවරය ලබා බී. ටී. එච්. දේව ධර්මය උපාධිය වෙනුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා 1969 වසරේ දී රෝමය වෙත ගියේය. එහිදී තම අධ්‍යාපන කටයුතු ද සාර්ථක ලෙස නිම කරමින් 1973 ජනවාරි 06 වැනි දින රෝමයේ සා. පේදුරු බැසිලිකාවේ දී හය වැනි පාවුළු පාප්තුමන් අතින් පූජකවරය ලැබීය.

ඒ සමගම ශීල ධර්මය පිළිබඳ උපාධිය ද ලබා 1974 අග භාගයේ දී පෙරලා තම මව් රටට පැමිණෙන ගරු පියතුමා එතැන් පටන් දේව රාජ්‍ය ගොඩනගන කර්තව්‍යයට උරදෙන්නේ තම ජීවිතයේ සියළු ලෞකික හා ආධ්‍යාත්මික අභියෝග යන් එකිනෙක වෙන් වෙන් වශයෙන් හඳුනා ගනිමිනි. ගරු ලයනල් එම්මෑනුවෙල් ප්‍රනාන්දු පියතුමන්ට රදගුරු වරම් ලැබීම මුල්කරගෙන එතුමන්ගේ ජීවිතයේ මෙතෙක් ආ ගමන හා දෙවියන් වහන්සේ සමග බැඳුනු ජීවිත අත්දැකීම පිළිබඳව කතා බස් කිරීමට ප්‍රදීපයේ අපි උන්වහන්සේ හමු වීමු.

### මීසම් ජීවිතයේ ආරම්භය

මගේ ජීවිතයේ මීසම් සේවය ආරම්භ කළේ දළුගම මීසමෙන්, පසුව හංවැල්ල සහ කොටහේන මීසම්වලත් මම සේවය කළා. දළුගම මීසමේ සේවය කරනකොට සපුගස්කන්ද කොටසත් බලා ගැනීමට මට වගකීම පැවරුණා. කොටහේන මීසමේ සේවය කරනකොට කොච්චිකඩේ සා. අන්තොනි මීසමේ වගකීමත් පැවරුනේ මට. 1976 ජූලි මස සිට 1977 පෙබරවාරි මස දක්වාම මම කොටහේන මීසමේ සේවය කළා.

### දෙවියන් වහන්සේට ලංව ජීවත්වන්නට ජනතාවට කියා දෙමු

මීසම් සේවය කිරීම තුළින් ශාන්තුවර භක්තිය වර්ධනය කර ගැනීමටත් ඊට අනුව ජීවිතය සකස් කර ගැනීමටත් මම නිරායාසයෙන් ම පෙළඹුණා. අපි කිතුනුවන් ලෙසට සාන්තුවර භක්තිය අධ්‍යයන කිරීමත් ඊට අනුව අපේ ජීවිත සකස් කර ගැනීමට දරණ වෑයම නිසා අපේ ජීවිත ශුද්ධවත්කම කරා එසැවෙනවා. මේ තුළින් විශේෂයෙන් ජනතාවට සේවය කිරීමට අපට ශක්තිය හා ධෛර්‍යය ලැබෙනවා. පදවි පූජක තුමන්ලා විශේෂයෙන් තම ආධ්‍යාත්මිකත්වය වර්ධනය කරගන්නේ ජනතාව තුළ ජනතාව අතර සේවය කිරීම තුළින්. මගේ පූජක ජීවිතයේ ආධ්‍යාත්මිකත්වය වර්ධනය කරගන්නට තවත් පිටිවහලක් වූයේ ගරු සිරි ඔස්කා අභයරත්න පියතුමායි.

මම දළුගම මීසමේ සේවය කරන කාල පරිච්ඡේදයේ දී සෑම සඳුදා දිනයකම අගරදගුරු මැඳුරේ පැවැත්වෙන පියතුමන්ලාගේ රැස්වීමට පැමිණීමට පෙර අප පියතුමන්ලා කණ්ඩායමක් ඔස්කා අභයරත්න පියතුමා සමග පෞද්ගලික යාච්ඤාවට සහභාගී වෙනවා. කොළඹ කොටුවේ හයවැනි පාවුළු මධ්‍යස්ථානයේ පස්වැනි තට්ටුවේ තිබෙන පුබුදු මධ්‍යස්ථානයේ දී පෞද්ගලික යාච්ඤාවේ මෙනෙහි කිරීම් කරනවා. එහිදී යාච්ඤා ජීවිතය ප්‍රගුණ කරගන්නවා. ඒ තුළින් මට මගේ පූජක ජීවිතයට මුහුණ දෙන්නටත් ජනතාවට දේව කැමැත්ත කරන්න මඟ පෙන්වන්නටත් මහත් වූ ප්‍රඥාවත් ශක්තියත් ඇතිවුණා. යාච්ඤා ජීවිතය සම්බන්ධ ඒ පන්නරය මට තවමත් මගේ ජීවිතයේ රැඳිලා තියෙනවා. අපි සභාවේ නිල යාච්ඤා කියනවා වගේ අභ්‍යන්තරයෙන් දෙවියන් වහන්සේ හා සමඟ පෞද්ගලිකව කරන යාච්ඤාවත් ගැඹුරු හරයක් මෙන්ම ජීවිත ඇතුලාන්ත අත්දැකීමක් වෙත අප රැගෙන යනවා. ඒ අත්දැකීම දෙවියන් වහන්සේට වඩාත් සමීපයි.

කිතු දන පුබුදුවේ පිවිසීමේ කතා අට දෙවියන් වහන්සේගේ ආදරය පිළිබඳ ඉතාම සරළව හා හරයාත්මක ලෙස කියා දෙනවා. ඒ කතා ඒවාට සහභාගීවන මිනිසුන්ගේ ජීවිත වෙනස් කරනවා. මෙය අපේ සභාවේ තියෙන උතුම් දේව කර්තව්‍යයක්. දේව වචනයත් සමඟ කණ්ඩායම් වශයෙන් ජීවත් වී ඒ මොහොතේ ජීවිතය ගත කිරීමට දෙවියන් වහන්සේ අපව කැඳවන බව පුබුදුවේ කතාමාලා තුළ අපට පසක් කර දෙනවා. දෙවියන් වහන්සේට වඩාත් ලංව ජීවත් විය හැකි පරිසරයක් ජනතාවට නිර්මාණය කරනවා මිස ජනතාව කළ යුත්තේ කුමක් ද යන්න අප කියා දිය යුතු නැහැ. විශේෂයෙන් 2012 දේව වචනයේ වසර, දේව වචනය තුළ ජීවත් වෙන්නට අපි ජනතාවට මඟපෙන්විය යුතුයි.

1976-1977 කාලය වන විට මම ගොඩාක් පවුල් සේවාවට සම්බන්ධවත් වැඩ කටයුතු කළා. ඊට හේතු වුනේ මගේ අයියා ඇන්ටන් ප්‍රනාන්දු සහ එයාගේ බිරිඳ මේරි ප්‍රනාන්දු පවුල් සේවාවේ විවාහ අපේක්ෂකයින් සමඟ ගොඩාක් වැඩ කළා. ඒ අය සමඟ මමත් මේ වැඩවලට එකතු වුනා.

### අනෙකාගේ අවශ්‍යතා තේරුම් නොගැනීම නිසා අති වූ ගැටළුවක්

අපේ රටේ දශක තුනක් තිස්සේ පැවැති ජාතික ගැටළුව මට හිතෙන විදිහට යුද්ධයක් දක්වා වර්ධනය වුනේ අපි කාගෙත් අවාසනාවටයි. යුද්ධය දිග්ගැස්සුනා. ජීවිත විශාල සංඛ්‍යාවක් නැතිවුණා වගේම දේපල ද ගණනින් මිණිය නොහැකි තරමින් විනාශයට පත්වුනා. සිංහල බෞද්ධයින්ගෙන් සමහර සිංහල ජනකොටස් සිංහල ජාතිවාදය කරපින්නා ගන්නාවිට දෙමළ ජාතිකයින්ගේ සමහරු ද දෙමළ ජාතිවාදය කරපින්නා ගත්තා. සිංහල නායකයින් සිංහල ජාතිවාදීන් ගෙන් මැරුම් කෑවේ දෙමලුන්ට තැන දෙන්නට යනවාය කියන චෝදනාවත් සමඟයි. ඒ වගේම දෙමළ නායකයින් ද දෙමළ ජාතිවාදීන්ගෙන් මැරුම් කෑවා. සිංහලුන්ට කත් අදිනවා මිස තම දෙමළ අයිතීන් දිනා නොගන්නවාය කියන චෝදනාව මත දෙමළ සමාජයේත් ඔවුනොවුන්

> **අපි නිහඬව ඉඳලා නැහැ. ඉදිරියේ දී ඉන්නෙත් නැහැ. බොහෝ ප්‍රශ්න වල දී ඒවායේ ස්වභාවයන් ගැන අපි හරිහැටි විමර්ශනය කළ යුතුයි. එසේ විමර්ශනය නොකර කතෝලික සභාව මැදිහත් වීමට හෝ උත්තර දීමට යන්නේ නැහැ. හොඳම උදාහරණය රාවතාවත්ත ළමා නිවාසයේ දී ඇති වූ ගැටළුවේ දී කතෝලික සභාව ක්‍රියා කළ ආකාරයයි. කාදිනල් තුමා හොඳට හොයලා බලලා පැහැදිලි ස්ථාවරයක සිට කළ ප්‍රකාශය. ජන සමාජයේ ඇතිවන ප්‍රශ්නවලට බුද්ධියෙන් සිතා ආධ්‍යාත්මිකව පිළිතුරු දෙනවා මිස ඇඟෙන් හෝ ඔළුවෙන් කටයුතු කිරීම සුදුසු නැහැ.**

අතරත් ගැටළු මතු වුණා.

චෙල්වනායගම් වැනි දෙමළ ජනනායකයින් ඉදිරිපත් වෙලා උතුරු නැගෙනහිරට විශේෂයෙන් බහුතරයක් දෙමළ ජනතාවක් සිටින ප්‍රදේශවලට ස්වයංපාලන අයිතියක් දෙන ලෙස ඉල්លුවා. චෙල්වනායගම් වැනි ජන නායකයින් දෙමළ ජනතාවගේ අයිතීන් දිනා ගන්නට බැලුවේ අවිහිංසාවාදී ලෙසටයි. දෙමළ ජනතාව සහ සිංහල ජනතාව දෙගොල්ලෝ දෙපැත්තට කඹ ඇදලා මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මේ ගැටළුව දෙමළ ජනතාව සහ සිංහල ජනතාව දැන්වත් තේරුම් ගත යුතුයි. ජනකොටස් දෙක තුළම විවිධත්වයන් තියෙනවා. ඒ විවිධත්වයන් අප තේරුම් ගත යුතුයි. තලෙන්තු ද හඳුනාගෙන අප සියළු දෙනා එකට එක්ව මේ ගමන යාමට සූදානම් විය යුතුයි.

එක්සත් රාජ්‍යයක හොඳම උදාහරණය ඇමරිකාව හෝ එන්ගලන්තය කියලා මම කියන්නේ නැහැ. එහෙත් ඔවුන්ට ජනපද පනහක් තිබුණත් ඒ සියල්ලම එකතු කරලා එකම රාජ්‍යයක් හැදුවා. එකම රාජ්‍යයක් තුළ එකිනෙකාගේ විවිධත්වයන්ට අනුව කටයුතු කරන්නට ඉඩ දුන්නා. අපිට ප්‍රධාන ආගම් හතරක් තියෙනවා ඒ ආගම් හතර තුළම සාමය සංහිඳියාව ගැන කතා කරනවා. එකමුතුකම ගැන වගේම අසල්වැසියාට ප්‍රේම කිරීම ගැනත් කතා කරනවා. එහෙම නම් ඒ ආගම්වල හරයන්ට ගරු කරලා ඒවායේ තියෙන වටිනාකම් ද අපගේ ජීවිතවලට ඈදාගෙන ජීවත් වීමට හැකි විය යුතුයි. ජාතික ගැටළුවට පළමු විසඳුම දියහැක්කේ මෙරට සිංහල දෙමළ ජනතාවටයි. එයනම් සිංහල ජනතාව දෙමළ ඉගෙන ගැනීමත්, දෙමළ ජනතාව සිංහල ඉගෙන ගැනීමත් හරහා ඇතිවන සංහිඳියාවයි. උතුරේ ජනතාව දකුණේ සිංහල ජනතාව දකින්නේ තමනට ප්‍රතිවරුද්ධ පිරිසක් ලෙසටයි. දකුණේ සිංහල ජනතාව උතුරේ දෙමළ ජනතාව දෙස බලන්නෙත් සැක සහිත ලෙසයි. අපි කතෝලික ජනතාවක් ලෙසට මේ දෙගොල්ලෝ සමඟින්ම එකට එක්ව ජීවත් විය හැකි ශක්තියක් තියෙනවා.

### උතුරු නැගෙනහිර ජනතාව තවමත් භීතියෙන්

උතුරු නැගෙනහිර යුද්ධය අවසන් වෙලා දැන් අවුරුදු දෙකකට වඩා වැඩි කාලයක් ගතවෙලා. එහි ජනතාවට තවමත් සැනසිල්ලක් නැති තත්ත්වයක් තියෙනවා. මූලික වශයෙන් සමාජීයියව ඔවුන් තවමත් ඉදිරියට එන්නේ නැහැ. එළියට පහළට බැහැලා යන්ඩ බැරි භීතියක් ඔවුන් තවමත් තම ජීවිතවල අත්දකිනවා. තවමත් නිදහසේ හැසිරෙන්න බැරි තත්ත්වයන් උතුරුකරයේ අභ්‍යන්තරයෙන් අපිට දැනෙනවා. ඔවුන්ගේ දෛනික දිවිපෙවතට තියෙන එකම බාධාව ඒ පළාත් හමුදාකරණය වීමයි. ඒ ජනතාවගේ ඉඩකඩම් හා ගෙවල් දොරවල් වෙත හමුදාව ඇතුල්වෙලා. තවමත් ඒවා එහි ජනතාවට නිදහස් කර දීලා නැහැ. යුද්ධය අවසන් වූ වහාම හමුදා භට පිරිස් ඉවත්විය යුතුව තිබුණාය කියලා මම කියන්නේ නැහැ. එහෙත් වත්මනය වනවිට හමුදාකරණය අවම කර හෝ සිවිල් පරිපාලනයකට ඉඩකඩ ඇති කරන්නට උත්සහයක්වත් දැරීම වඩාත් වැදගත්.

උතුරුකරයේ බහුතරයක් දෙමළ ජනතාව ජීවත්වන නිසා ඒ පළාත්වල පමණ ඉක්මවා බෞද්ධ ආගමික සිද්ධස්ථාන ඇති කිරීම හෝ ඒ සමාන සංස්කෘතීන් ඇති කිරීමට උත්සහ දැරීම නුසුදුසුයි නේ ද? මේ වනවිටත් උතුරු නැගෙනහිර පළාත් තුළ සිවිල් පරිපාලනයක් ඇතිකරන ලෙස කාදිනල් තුමා ආණ්ඩුවෙන් ඉල්ලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය සහයන් හා ගරු පියතුමන්ලාගේ සේවා කටයුතු පවා ලබා දීමට කාදිනල් තුමා සූදානම් බව ආණ්ඩුවට දන්වා තිබෙනවා. දැනට පූජක පුහුණුව ලබන සිංහල ගරු සහෝදරවරු නව දෙනෙක් ද යාපනයේ දෙවිසත්හලේ දෙමළ භාෂා අධ්‍යාපනය ලබමින් ඉන්නවා. කතෝලික ජනසමාජයක් ලෙසට අප උත්සහ කරමින් සිටින්නේ ද මේ බිම තුළ ජන විවිධත්වය ඇති කිරීමටයි.

ජාතික ගැටළුවට ආණ්ඩුව මොනතරම් තිරසර විසඳුමක් දෙන්නට උත්සහ කළත් දෙමල පාර්ශ්වයෙත් සිංහල පාර්ශ්වයෙත් සිටින අන්තවාදී කණ්ඩායම් නිසා ආණ්ඩුවට ඒ කාරණය කරගන්නට බැරිව ඉන්නවා. එල්. එල්. ආර්. සී යෝජනාත් ආණ්ඩුව සැළකිල්ලට ගන්නවානම් හොඳයි. යුද්ධය අවසානයෙන් පසු උතුරේ ජනතාවට උතුරු වසන්තය ලෙසින් සංගීත සැණකෙළි හා කානිවල් පවත්වමින් ඉන්නවා. එකම පවුලේ අම්මා තාත්තා සහෝදර සහෝදරියන් නැති වී ගිය ජන සමාජයකට සැණකෙළිවලින් උත්තර දීලා හරි යයි ද? උතුරු වසන්තයේ අර්ථය පාරවල් හැදීම සහ කානිවල් දමන එක විතර ද? ජන ජීවිතයේ සංවර්ධනයට සිද්ධවෙන්නේ මොනවා ද?

### ජනතාවගේ පැත්ත ගැනීම දේව කාර්යයක්

අපි නිහඬව ඉඳලා නැහැ. ඉදිරියේ දී ඉන්නෙත් නැහැ. බොහෝ ප්‍රශ්න වල දී ඒවායේ ස්වභාවයන් ගැන අපි හරිහැටි විමර්ශනය කළ යුතුයි. එසේ විමර්ශනය නොකර කතෝලික සභාව මැදිහත් වීමට හෝ උත්තර දීමට යන්නේ නැහැ. සභාවක් ලෙසට අපිට තියෙන ලොකුම ගැටළුව දේශපාලනඥයින් පිල් මාරු කිරීමයි. දේශපාලනඥයින් හැසිරෙන හැසිරෙන ගානට හෝ වෙනයම් ආකාරයෙන් රට තුළ ඇතිවෙන ප්‍රශ්නවලට අපිට උත්තර දෙන්නටත් බැහැ. එසේ කරන්නෙත් නැහැ. හොඳම උදාහරණය රාවතාවත්ත ළමා නිවාසයේ දී ඇති වූ ගැටළුවේ දී කතෝලික සභාව ක්‍රියා කළ ආකාරයයි. කාදිනල් තුමා හොඳට හොයලා බලලා පැහැදිලි ස්ථාවරයක සිට කළ ප්‍රකාශය. ජන සමාජයේ ඇතිවන ප්‍රශ්නවලට බුද්ධියෙන් සිතා ආධ්‍යාත්මිකව පිළිතුරු දෙනවා මිස ඇඟෙන් හෝ ඔළුවෙන් කටයුතු කිරීම සුදුසු නැහැ. කතෝලික සභාවට විරුද්ධත්වය පල කරන අය ජනසමාජයේ විවිධ තරාතිරම් වල සිටිනවා. විශේෂයෙන් සමහර ජනමාධ්‍ය සභාවට පහර ගහනවා.

ළමා නිවාසයේ අකටයුතුකම් සිද්ධවෙනවා නම් ඒ සඳහා පැමිණිල්ලක් තිබිය යුතුයි. පැමිණිල්ලක් නැතිව ළමා ආරක්ෂක අධිකාරියේ සභාපතිනිය මාධ්‍ය පිරිවරාගෙන ඇවිත් ළමා නිවස වටළනවා. මෙය නීති විරෝධීයි. මෙය කාගේ හෝ කුහක යටි අරමුණු මුදුන් පමුණුවා ගැනීමට කල උප්පර වැට්ටියක්. මේ වටා ගෙතී තිබූ අසම්භ්‍ය කරුණු කාරණා කාදිනල් තුමා එකිනෙක විමර්ශනය කර නිර්භය ලෙස පෙනී සිටියා. රටේ සමාජයේ කිසිදු කාරණයක දී අපි නිහඬ වෙන්නේ නැහැ. විශේෂයෙන් ජනතාවගේ හා වින්දිතයින්ගේ පැත්ත ගෙන කටයුතු කරනවා. ජනතාවගේ පැත්ත ගන්න ජනතාව වෙනුවෙන් කතා කරන්න කතෝලික සභාවට හුදු වගකීමක් නොව කැඳවීමක් තියෙනවා.

සංවාද සටහන
**රුක්මාල් සිල්වා**







# රට දෙකඩ කරනවාට මං විරුද්ධයි; එහෙත් මනුෂ්‍යයන්ගේ අයිතිවාසිකම් ලබාදිය යුතුමයි



## අති උතුම් මැක්ස්වල් සිල්වා සහායක රදගුරු හිමි

කොළඹ අගරදගුරු පදවියේ එඬේරාණන් ලෙස 1988 කාලය වන විට කටයුතු කළේ වත්මනයේ විශ්‍රාමිකව සිටින අති උත්තම නිකලස් මාකස් ප්‍රනාන්දු හිමිපාණන්ය. එම වර්ෂයේ කොළඹ අගරදගුරු පදවියේ ගරු පියතුමන්ලාගේ වාර්ෂික රැස්වීම පැවැතියේ නොවැම්බර් මාසයේ දී ය. මෙම රැස්වීම සඳහා මෙදින පැමිණ සිටි පියතුමන්ලාට නිකලස් මාකස් ප්‍රනාන්දු අගරදගුරු තුමන්ගෙන් පැනයක් ඉදිරිපත් විය. එය නම් අප පදවියේ දුප්පත් පාසල් වල දරුවන් හට අධ්‍යාපනය දෙන්න කැපවීමට කැමති කවුරුන් ද යන්නයි. එය භාරගැනීමටත් ඒ වෙනුවෙන් පිළිතුරු දෙන්නටත් රැස්වීම් සභාවේ පියතුමන්ලා දෙදෙනෙකු ඉදිරිපත් විය. ඉන් එක් අයෙක් වූයේ ගරු මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා පියතුමන්ය.

හෙතෙම ප්‍රථමයෙන්ම රජයේ පාසලකට පත්වීම ලැබුවේ 1992 වසරේ ය. ඒ කොළඹ ග්‍රෑන්ඩ්පාස් සා. ජෝසප් විද්‍යාලයටය. මෙම පත්වීම කතෝලික සභාව තුළ පියතුමෙක් ලෙසට ලැබූ ප්‍රථම පත්වීම ලෙස ඉතිහාස ගතවී තිබෙයි. ඒ අනුව 1992 දෙසැම්බර් සිට 1998 මාර්තු 31 වැනි දා දක්වා එම පාසල තුළත් 1998 මාර්තු 31 සිට 2001 ජූනි මස දක්වා රාගම බැසිලිකා විදුහලේත් නියෝජ්‍ය විදුහල්පති ලෙසත් කටයුතු කළ ගරු පියතුමා 2001 ජූලි 16 වැනි දා සිට රදගුරු වරම් ලබන තෙක් මේ දක්වාම කටයුතු කළේ කෝට්ටේ සා. තෝමස් විද්‍යාලයේ ය. මේ වන විට මෙම පාසලේ විදුහල්පති වරයා ලෙස වසර 12 ක් උන්වහන්සේ සේවය කර තිබේ.

ගරු මැක්ස්වල් ග්‍රැන්විල් සිල්වා පියතුමා 1953 සැප්තැම්බර් 27 වැනි දින මොරටුව විල්ලෝරාවත්ත ගම්පියසේ උපත ලබා මොරටුව සා. සෙබස්තියන් විද්‍යාලයෙන් ප්‍රාථමික අධ්‍යාපනය ලැබීය. හෙතෙම බොරැල්ල සා. ඇලෝසියස් දෙවිසත්හලට ඇතුලුවූයේ 1969 මැයි 03 වැනි දා ය. 1974 පෙබරවාරි 09 වැනි දා සිට 1981 ජූලි 11 වැනි දා දක්වා අම්පිටිය ජාතික දෙවි සත්හලෙන් දේව ධර්මය හා දර්ශනය හදාරන ගරු පියතුමා 1981 වසරේම ජූලි 25 වැනි දා පූජක වරය ලබයි.

**රදගුරුතුමනි, පූජකවරය ලබා ඔබවහන්සේ කළ මීසම් සේවයේ අත්දැකීම් පිළිබඳ කතා කළොත්?**

දළුගම සා. ප්‍රැන්සිස් දේවස්ථානයේ සහයක පියතුමා ලෙසට මම මීසම් සේවය ආරම්භ කළා. එහි වසර දෙකක් හිටියා. ඉන්පසු ගනේමුල්ල තිබ්බටුගොඩ මිදෙල්ලවිට මීසමට පැමිණියා. එම මීසමට තවත් මීසම් හයක් අයත්ව තිබුණා. තිබ්බටුගොඩ, මිදෙල්ලවිට, නිවන්දම, යක්කඩුව සහ ගණේමුල්ල යන මීසම් වගේම කොස්සින්න තවත් පුංචි මීසමකුත් තිබුණා. මීසම් පහක් පාලනය කිරීම විශාල අභියෝගයක්ව තිබුණා. මේ මීසම් පහ අතර දුර ප්‍රමාණය විශාල ලෙස විහිදී තිබුණා. පූජකවරය ලබා මේ ආකාරයෙන් මම මීසම් සේවය කරමින් සිටින විට 1985 ඔක්තෝබර් 25 වැනි දා මාව කැලණිය විශ්ව විද්‍යාලය වෙත තේරුණා. එහිදී මම ඉංග්‍රීසි, බටහිර සම්භවය සංස්කෘතිය සහ සමාජ විද්‍යාව මම මගේ උපාධිය වෙනුවෙන් කළා. විෂයන් දෙකක් ඉංග්‍රීසියෙන් සහ අනිත් විෂය හෙවත් සමාජ විද්‍යාව සිංහල භාෂාවෙන් ම ඉගෙන ගත්තා. මේ කාලය වනවිට කැළණිය විශ්ව විද්‍යාලය තුළ සමාජ විද්‍යාව ඉංග්‍රීසි බසින් තිබුණේ නැහැ. දිනපතා උදේට එක් එක් මීසමක දින පහේම දිව්‍ය පූජාව කරලා හවසට ඒ මීසම් වලට අදාල සේවාවන් සිදු කරනවා. මේ ආකාරයේ මීසම් පහම බලමින් වැඩ කටයුතු කළා. මීසම් වැඩ කරමින් විශ්ව විද්‍යාලයේ උපාධිය සඳහා අධ්‍යාපනය ලැබීමත් මට ලොකු අභියෝගයක් වී තිබුණා.

**ඔබ වහන්සේ රජයේ පාසල් ගුරුවරයෙක් මෙන්ම විදුහල්පතිවරයෙක් ඒ ගැනත් ටිකක් කතා කරමු ද?**

රජයේ පාසලක ළමුන්ට අකුරු කරවනවා කියන්නේ යමක් කමක් තියෙන අයගේ දරුවො වගේම නැතිබැරි දුප්පත් දරුවො සමගත් ජීවත් වෙන්නට අවස්ථාව ලැබෙනවා. ඒ සම්බන්ධයෙන් විවිධ අත්දැකීම් තම ජීවිතයට ලැබෙනවා. අපි ඒ ගැන තැකීමකින් කටයුතු කරනවා. අද බොහෝ දෙමාපියන් තම දරුවන්ට ස්වාමිලාගෙන් අධ්‍යාපන දෙන්නට හරිම කැමතියි. ආගම් බේදයකින් තොරව ඒ කැමැත්ත දෙමාපියන්ට තියෙනවා. ස්වාමිකෙනෙක් මාර්ග යෙන් සිස්ටර් කෙනෙක් මාර්ගයෙන් තම දරුවන්ට අකුරු කරවන්නට දෙමාපියන් කැමැතියි.

දරුවා කියන්නේ ලොකු මිනිහෙක් හෝ පුංචි මිනිහෙකුත් නෙමේ. දරුවා කියන්නේ පොඩි දරුවෙක්. ඔවුන්ව තේරුම් ගැනීම ජීවිතයේ විශාල අභියෝගයක්. අප ඔවුන්ව නිවැරදිව තේරුම් ගැනීම තුළින් ස්වාමිලා කවුද, සිස්ටර්ලා කවුද කියලා ඔවුන් කවදා හෝ දිනෙක තේරුම් ගන්නවා. අනාගතයේ දී බොහෝ විට ඔවුන් මේ ජීවිතවලට ඇතුළු වෙන්නට හෝ පැවිදි ජීවිත තෝරා ගන්නට පුළුවනි. ඒ නිසා දරුවන්ට ඉතාම පරිසමින්, ආදරයෙන්, දයාවෙන් හා ලෙන්ගතුකමින් යුතුව සැළකීම අත්‍යාවශ්‍යයි. කෙටියෙන්ම කිව්වොත් දරුවන්ට දෙවෙනි අම්මා හෝ තාත්තා විය යුත්තේ ගුරුවරයා හෝ ගුරුවරියයි.

**වත්මනයේ පාසල් දරුවන් පිළිබඳ ඔබවහන්සේට හසල අත්දැකීම් තියෙනවා නේද?**

අපි ජීවත්වෙන සමාජය ඉතාම වේගයෙන් වෙනස් වෙමින් තියෙනවා. මේ වේගය දරුවන්ට ඔරොත්තු දෙන්නේ නැහැ. දරුවන්ට විතරක් නෙමේ වැඩිහිටි අපටත් ඔරොත්තු දෙන්නේ නැහැ. ඒ නිසායි අපට දරුවන්ට උගැන්වීමේ කටයුතු කිරීමට අපහසු වී තියෙන්නේ. අද අපේ රටේ ජනමාධ්‍යත් ඉතාම සංවිධානාත්මක සහ තියුණුයි. හැදෙන දරුවන්ට මාධ්‍ය තුළින් හොඳ වගේම නොහොඳත් ලැබෙනවා. අප ජීවත්වෙන මුළු මහත් සමාජයම විවෘතයි. ගෝලීයකරණය වී තිබෙනවා. විශ්වය ලෝකය අප ළඟටම පැමිණ තිබෙනවා. ඒ නිසාම දරුවා තමන් තුළ තිබෙන ආර්ථික හා භෞතික අඩුපාඩුකම් දකිනවා. එවිට නිරායාසයෙන්ම දරුවා තුළ අභ්‍යන්තරික, මානසික ගැටුමක් ද ඇති වෙනවා. සමාජයේ සිටින අනිකුත් අයට, මට වඩා භෞතික සම්පත් තියෙනවා. එහෙත් ඒවා මට නැති බව සිතමින් දුප්පත් දිළිඳු දරුවන් දුකට පත් වෙනවා. මෙය දරුවන් තුළ ඇතිවන අවාසනාවන්ත තත්ත්වයක්. මේ තත්ත්වය ජය ගන්නට දරුවන්ට ශක්තිය දීම අපට තිබෙන අභියෝගයක්.

**මේ අභියෝග ජය ගන්නට දෙමාපියන්ගෙන් දරුවන්ට ලැබෙන පිටිවහල කොහොමද?**

මේ සඳහා දරුවන්ට දෙමාපියන්ගෙන් කිසිම පිටිවහලක් ලැබෙන්නේ නැහැ. දෙමාපියන් ජීවිත ගැටගහන්නත් දරුවන්ගේ බඩවියත රකින්නත් උදේ හවා ලොකු සටහනක යෙදෙනවා. අද දරුවන් කෙරෙහි ඇති වී තිබෙන භයංකරම කාරණය නම් මේ දරුවන්ගේ හුගාක් මව්වරු විදේශ ගතවෙලා. තම මව්වරු විදේශගත වු දරුවන් හුගාක් දෙනාට යන එනමන් නැති වෙලා. මව්වරු දරුවන් අතහැර දමා විදේශ ගත වීමෙන් දරුවන්ට විශාල අපරාධයක් කරන බව මගේ වැටහීමයි.

> **මාධ්‍ය යනු රටේ ජනතාවගේ ජීවනාලියක්. මාධ්‍යවේදියා නිරන්තරයෙන්ම වගකීමෙන් යුතුව කටයුතු කිරීම අවශ්‍යයි. මාධ්‍යවේදියා වගකීමෙන් කටයුතු නොකළොත් රට අවුලෙන් අවුලට යනවා.**
>
> **විශේෂයෙන් පාසල්වල ඇතිවන අපචාර ක්‍රියා, දූෂණ සහ ප්‍රචණ්ඩ ක්‍රියා මාධ්‍ය මඟින් වීරත්වය නංවා වාර්තා කිරීම හා ඒවායේ රූප රාමු ප්‍රදර්ශනය කිරීමෙන් අනිකුත් පාසල්වල දරුවනුත් එවැනි ක්‍රියාවන් සඳහා ම පෙළඹීමක් ඇතිවෙනවා. මෙයින් තව තවත් සමාජයේ පිරිහීම් ඇති වෙනවා. අපේ රටේ පාසල් දරුවන් තවමත් ස්ට්‍රයික් කරලා නැහැ. පාරට බැහැලත් නැහැ. ජනමාධ්‍යයට ඒ ක්‍රියාව වූවත් කළ හැකියි.**

**මෙවැනි දරුවන්ට පිළිසරණක් වෙන්න ගුරුවරුන්ට හැකි ද?**

මේ තත්ත්වය තේරුම් ගන්නවානම් එසේ තේරුම් ගැනීමට ගුරුවරු බොහෝ දෙනෙක් ඉන්නවා. මගේ පාසලේ ඔයාකාරයෙන් මව්වරු විදේශගත වූ දරුවන්ට තවත් අම්මා කෙනෙක් ලෙසට කටයුතු කරන ගුරුවරු ඉන්නවා. ඒ ගුරුවරු බඩගින්නේ ඉන්න දරුවන්ව හොයලා බලලා කන්ඩ බොන්ඩ ටික ලබා දෙනවා. ආදරය ලබා දෙමින් දිරි ගන්වමින් දෙවෙනි අම්මෙක් වගේ කටයුතු කරනවා. නමුත් හැම ගුරුවරයෙකුටම මේ කාර්යය කරන්නට බැහැ. එසේ කළ නොහැක්කේ ගුරුවරුන්ට ද තිබෙන ජීවිත සංකීර්ණත්වය හා කාර්ය බහුලත්වය නිසායි. සමහර ගුරුවරු රටේ ඈත දුර ප්‍රදේශවල සිට පත්වීම් ගෙන කොළඹට ඇවිත් ජීවිතය ජීවත් කරවන්න විශාල කැප කිරීම් කරනවා. පාසලකට පත්වීමක් ගත්තු දා ඉඳලාම ගෙවල් කුලී ගෙවලා ටිකක් බඩට කනවා බොනවා හැරෙන්නට ජීවිතයේ කිසිම දියුණුවක් නැතිව ඉන්නවා.

**රදගුරු වරම් ලැබීම පිළිබඳ ඔබවහන්සේගේ අදහස කුමක් ද?**

මගේ අදහස මේකයි. නගරයේ දුප්පත් පොහොසත් බේද තියෙන දරුවො ඉන්නවා. පොහොසත් දරුවො වගේම දුප්පත් දරුවො අනන්ත අප්‍රමාණව ඉන්නවා. පොහොසත් දරුවො නගරයේ සුපිරි පාසල්වලට යනකොට ඒ පහසුකම් භුක්ති විඳිනකොටත් දුප්පත් දරුවො කල්පනා කරනවා අපිට මේවා නැත්තේ ඇයි කියලා. පොහොසත් දරුවන්ට ලස්සන ගෙවල් දොරවල් යාන වාහන වගේම නිවස ඉස්සරහ අලංකාර, රමණීය තිල් තණ බිම් තීරද තියෙනවා. දුප්පත් දරුවෝ හිතනවා මේවා මට නැත්තේ ඇයි කියලා. ඒ නොදරුවො ව්‍යංග යෙන් තම දෙමාපියන්ගෙන් ද අහනවා. දෙමාපියන් ද නිරුත්තරයි. ඒ දුක, වේදනාව දරුවන්ට සේම දෙමාපියන්ටත් තියෙනවා. සමහර දෙමාපියන් බොහෝ සෙයින් දුක් විඳගෙන හෝ පුද්ගලික පාසල්වලට දරුවන්ව ඇතුළත් කරනවා.

**ඔබ වහන්සේ ඒත් කතා කළේ පාසල් දරුවන් ගැනම නේද. මට රදගුරුවරය ගැන කියන්න?**

මම පූජකවරය ලබන දා බිස්කුන් වහන්සේට පොරොන්දුවක් දුන්නා කීකරුකම, වෘත්ත ශුද්ධිය සහ දිළිඳුකම යන කාරණා තුන වෙනුවෙන් ජීවත් වෙන බවට. මේ සම්බන්ධයෙන් මම දෙවියන් වහන්සේ ඉදිරියේ පෙනී සිට නිරන්තරයෙන් ම මේ කාරණා තුන ඉෂ්ඨ සිද්ධ කරන්නට වරය ඉල්ලා යාච්ඤා කළා. ඊට අනුව පූජකවරය ලැබූ වහම මම මීසම් සේවය වෙත යෙදෙව්වා. මම ඒ කාරණය ඉටු කළා. ඉන්පසු බිස්කුන් වහන්සේ මට පාසල් දරුවන් වෙනුවෙන් සේවය කරන්නට ආරාධනා කළා. මා ඊටත් කීකරු වුනා. වත්මනයේ දෙවියන් වහන්සේ මා රදගුරුවරය සඳහා තෝරාගෙන තිබෙනවා. එයටත් හිස නමා මා කීකරු වෙනවා. ඉන්පසුව ද මා හට පවසන ඕනෑම කාරණයක් වෙනුවෙන් ජීවිතය පුද කරන්නට පැකිලෙන්නේ නැහැ.

රදගුරුවරය දෙවියන් වහන්සේට වඩාත් ලංව ජනතාව වෙනුවෙන් සේවය කරන්නට ලැබුනු අවස්ථාවක් ලෙසටයි මා දකින්නේ.

**දශක තුනකට ආසන්න කාලයක් තිස්සේ පැවැති යුද්ධයක් අවසන් වුනා. තවම ඊට දේශපාලනික විසඳුමක් දී නැහැ. ඒ විසඳුම කෙසේ විය යුතු ද?**

මේ රටේ එකට ජීවත්වන අපි කවුරුත් සහෝදරයෝ. යුද්ධය ජයග්‍රහනය කිරීම පිළිබඳව අපි කවුරුත් සතුටු වෙනවා. අපි එකම රටේ ඉන්න සෙනඟක් නිසා මනුෂ්‍යයින් වශයෙන් දෙමළ ජනතාවටත් අයිතිවාසිකම් ගණනාවක්ම තියෙනවා. හොඳම උදාහරණය LLRC. එය ඉතාම සාධාරණ පිළිවෙලට යනවා. විදේශීය නැනවතුන් බුද්ධිමතුන් හා සමස්ථ ලෝකයාම මේ කෙරෙහි අවධානයෙන් ඉන්නවා. මෙරට ජීවත්වෙන සිංහල ජනතාව වගේම දෙමළ ජනතාවත් සතුටින් ජීවත් වෙන්න කැමතියි. එසේ නම් දෙමළ ජනතාවගේ සාධාරණ අයිතිවාසිකම් ලබාදිය යුතුයි. රට දෙකඩ කිරීමක් විය යුතු නැහැ. එහෙත් දෙමළ ජනතාවට නිදහසේ නිවිහැනහිල්ලේ ජීවත්විය යුතු නිදහසවත් තිබිය යුතුයි. එදා ඒ නිදහස දෙමළ ජනතාවට දුන්නා නම් මේ ගැටළුව මෙතරම්ම දුරදිග නොයන්න තිබුණා.

මේ ගැටළුවට විසඳුමක් දෙන්නට ආණ්ඩුවට තවම හැකියාවක් නැත්තේ ආණ්ඩුව තුළම ඉන්න විවිධ පාර්ශ්වයන්ගෙන් ඒ සඳහා බාධාවන් තිබෙන නිසාය. රට දෙකඩ කරනවාට මම විරුද්ධයි. එහෙත් මනුෂ්‍යයන්ගේ අයිතිවාසිකම් ලබාදිය යුතුමයි. දෙමළ කතා කරන අයව වඩ වඩාත් රාජ්‍ය සේවය වෙත බඳවා ගන්නවා සේම සිංහල අයත් දෙමළ භාෂාව ඉගෙන ගත යුතුයි. සිංහල අය දෙමළ භාෂාව ඉගෙන නොගැනීමත් ලොකු පාඩුවක්.

**අපේ රටේ මාධ්‍ය හැසිරීම පිළිබඳව ඔබ වහන්සේ සෑහීමකට පත් වෙනවා ද?**

අපේ රටේ මාධ්‍ය හැසිරීම පිළිබඳව ඇත්තටම මම සෑහීමකට පත් වෙන්නේ නැහැ. මාධ්‍ය පමණ ඉක්මවා හැසිරෙනවා. ප්‍රමාණය අභිබවා යනවා. මාධ්‍ය යනු රටේ ජනතාවගේ ජීවනාලියක්. මාධ්‍යවේදියා නිරන්තරයෙන්ම වගකීමෙන් යුතුව කටයුතු කිරීම අවශ්‍යයි. තම දැනුම මාකට් කරනවාට වඩා සමාජ සුබ සිද්ධිය ගැනත් සිතිය යුතුයි. මාධ්‍යවේදියා වගකීමෙන් කටයුතු නොකළොත් රට අවුලෙන් අවුලට යනවා.


විශේෂයෙන් පාසල්වල ඇතිවන අපචාර ක්‍රියා, දූෂණ සහ ප්‍රචණ්ඩ ක්‍රියා මාධ්‍ය මඟින් වීරත්වය නංවා වාර්තා කිරීම හා ඒවායේ රූප රාමු ප්‍රදර්ශනය කිරීමෙන් අනිකුත් පාසල්වල දරුවනුත් එවැනි ක්‍රියාවන් සඳහා ම පෙළඹීමක් ඇතිවෙනවා. මෙයින් තව තවත් සමාජයේ පිරිහීම් ඇති වෙනවා. අපේ රටේ පාසල් දරුවන් තවමත් ස්ට්‍රයික් කරලා නැහැ. පාරට බැහැලත් නැහැ. ජනමාධ්‍යයට ඒ ක්‍රියාව වූවත් කළ හැකියි.

**සමාජය යහ ගැන්වීම කෙරෙහි සිවිල් වැසියන් ගේ කාර්යය භාරය කෙසේ විය යුතු ද?**

පළමුව සිවිල් වැසියා සෑම සියළු කාරණයක් සම්බන්ධයෙන් ම දැනුවත් අයෙක් විය යුතුයි. ඒ දැනුවත් භාවය තුළින් ඉදිරියට යාම අවශ්‍ය යි. සමාජයේ සිදුවන අසාධාරණකම් හෝ අකටයුතුකම් දැක දැකත් නොදැක්කා සේ සහ ඒ පිළිබඳ ඇසීමෙන් නොඇසුනා සේ නොසිට තමනට හැකි අයුරින් ක්‍රියාත්මක වන්නට සහ ජීවිතයේ ප්‍රායෝගික යමක් රටේ ජනතාව වෙනුවෙන් කරන්නට ඉදිරියට ආ යුතුමයි. ඒ වෙනුවෙන් කිතුනුවන්ට කැඳවීමක් මෙන්ම දූත කාර්යයක් තිබෙන බව වටහා ගත යුතුයි.

සංවාද සටහන
**රුක්මාල් සිල්වා**

# යාම යැදුමට සහ පොදු යැදුමට අත්වැලක් ලෙසින්




ශුද්ධ ලියැවිලි වසර

**දේව ධර්ම නිකේතනයේ අදියුරු අතිගරු දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා**

**හැඳින්වීම :**

ශුද්ධවූ සභාවේ පොදු නිල යැදුම සමන්විත වන්නේ ශුද්ධ බයිබලයේ ගීතාවලිය ග්‍රන්ථයෙන් තෝරා ගත් ගීතිකා ඇසුරෙනි. යාම යැදුම පිළිවෙත තුළ ගීතාවලියේ ගීතිකා ද පුරාණ ගිවිසුමෙන් හා නව ගිවිසුමෙන් ගන්නා ලද ප්‍රශංසා ගීතිකා කීපයක් ද ඇතුළත් ය. ගීතාවලිය දේව ජනතාව තම ජීවිතයේ විවිධ අවස්ථා හා පසුබිම් තුළ ව්‍යවහාර කළ යැදුම් සමුච්චියක් ලෙස හඳුන්වා දිය හැකිය. පසුකාලීනව ජෙරුසලෙම් දේව මන්දිරය කේන්ද්‍ර කොට ක්‍රමවත් ජනවන්දනා පිළිවෙතක් සේ ඒවා භාවිතා කෙරිණි. පරම්පරාවෙන් පරම්පරාවට මෙම යැදුම් ගීතිකා සම්ප්‍රදාය ගලා ගියේ දේව ජනතාවගේ ඇතුළාන්ත පිපාසය සංසිඳුවමින් ඔවුන් ගැඹුරු ආධ්‍යාත්මික හා සමාජයීය පැවැත්මකට යොමු කරවමිනි. අපට උරුම වූ මේ උතුම් යැදුම් සම්ප්‍රදාය ඵලබරව භාවිත කිරීම සඳහා සාන්ත සභාව අප සැමට මඟ පෙන්වමින් දිරි ගන්වන්නීය.

**ගීතාවලිය ග්‍රන්ථයට හැඳින්වීමක්**

(අ) නාමයඃ

ගීතාවලිය ග්‍රන්ථයේ නම හෙබ්‍රෙව් බසින් "තෙහිල්ලිම්" (Tehillim) වන අතර එය "තෙහිළි ගී" යනුවෙන් සිංහලට වර නැගෙයි. ඉන් පොදු ලෙසින් හැඟවෙන්නේ "ප්‍රශංසා ගී" යන්නයි. ශු. බයිබලයේ ග්‍රීක පිටපතේ යෙදෙන නාම "ප්සාල්මොයි" (Psalmoi) යන්නය. ඉන් හැඟවෙන්නේ වාදන භාණ්ඩ ඇසුරෙන් ගායනා කෙරෙන යැදුම් ගී යන්නයි. මෙම නාමය පොතෙහි අන්තර්ගතය හා දැක්මට සරිලන බව පෙනේ.

**(ආ) ශුද්ධ බයිබලය තුළ ගීතාවලියේ වැදගත්කම**

ගීතාවලිය පුරාණ ගිවිසුම් ග්‍රන්ථාවලියෙහි ජනප්‍රියම ග්‍රන්ථය ලෙස හඳුන්වා දිය හැකිවේ. එය හුදෙක් යැදුම් සංග්‍රහයක් පමණක් නොවේ. එය ශුද්ධ බයිබලයේ මූලික තේමාවන් රැගත් දේව ධාර්මික සම්පිණ්ඩනයකි. දෙවියන් වහන්සේගේ මැවීමේ ක්‍රියාව (ගීතා 8), ගැලවීමේ ක්‍රියාව (ගීතා 81:5-10), මෙසියානික පැතුම (ගීතා 110), දැහැමියාවේ පදන වන අචල විශ්වාසය (ගීතා. 23), ශීලධර්මයේ මූලික ප්‍රතිපත්තියක් වන සාධාරණත්වය (ගීතා 72:1-4) උදාහරණ වේ. ඒ අනුව ගීතාවලිය ග්‍රන්ථය යැදුමට මෙන්ම භාවනාවට ද අත්වැලකි.

ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ගීතාවලියෙහි දැක්ම සහ අධ්‍යාත්මිකත්වය අවධාරණය කළ අන්දම නව ගිවිසුමෙහි මනාව දිස්වේ. තමන් වහන්සේගේ මෙසියානික අනන්‍යතාව පැහැදිලි කිරීම සඳහා ගීතාවලිය ග්‍රන්ථය ද උන්වහන්සේ පදනම් කර ගත් සේකඃ "මා පිළිබඳව මෝසෙස්ගේ ව්‍යවස්ථාවලියෙහි ද දිවැසාවලියෙහි ද ගීතාවලියෙහි ද ලියා ඇති හැම දෙයම ඉෂ්ට විය යුතු යයි මා ඔබ සමඟ සිටිය දී ඔබට පැවසූ වචනයෙහි තේරුම මේය." (ලූක් 24:44). උන්වහන්සේ දුක්ප්‍රාප්ති මොහොතේ දී දෙවි පියාණන් වෙත නංවන ළසෝ වදන් තවත් උදාහරණයකි. (මාක් 15:34, ගීතා 22:1-2).

මේ අනුව බැලීමේ දී ගැලවීමේ ඉතිහාසයේ විවිධ අදියර ඔස්සේ දේව ජනතාවගේ යැදුම් දිවිය ද, ආධ්‍යාත්මික පැවැත්මද පෝෂණය වූ අන්දම පිළිබඳ දැක්මක් ගීතාවලිය තුළින් දැකිය හැකිය.

**ගීතාවලියෙහි ලේඛන පසුබිම**

ගීතාවලිය ග්‍රන්ථයෙහි සම්පාදනය සාම්ප්‍රදායිකව ආරූඪ කෙරෙන්නේ දාවිත් රජු වෙතය. එයට එක් හේතුවක් වශයෙන් දාවිත් රජ වීණා වාදනය කළ බව සඳහන් වන පුරාණ ගිවිසුම් කතා පුවත ඉදිරිපත් කළ හැකිය. (1 සාමුවෙල් 16:14-23). තවත් වැදගත් හේතුවක් වන්නේ ජෙරුසලෙම් දෙව් මැඳුරේ ජනවන්දනා ගායනා කටයුතු දාවිත් රජුගේ මඟ පෙන්වීම යටතේ සිදුවීම පිළිබඳ සඳහනයි. (2 වංශා. 29:25-30). එහෙත් අද විශාරදයන් පෙන්වා දෙන පරිදි ගීතාවලියෙහි ගීතිකා සමුච්චිය ඉතා සංකීර්ණ ලෙස සම්පාදනය වූවකි. සමහරක් ගීත ඉතා පැරණි වන අතර (දාවිත් රජුගේ කාලයට පෙර) තවත් සමහරක් පසුකාලීනව සම්පාදනය වී ඇත. එම ගීතිකා බොහොමයක කර්තෘත්වයේ පසුබිම පැහැදිලි නැත. කර්තෘත්වය ජනතාවගේ ගෞරවයට හා පිළිගැනීමට පාත්‍ර වූ චරිත සම්බන්කොට දැක්වීම පුරාතන ලෝකයෙහි ලේඛන අංගයක් වූ බව මතක තබා ගැනීම වැදගත් ය. ඒ අනුව ගීතාවලියේ සම්පාදනය දාවිත් රජුට ආරූඪ කිරීම පිළිගත හැකිය.

ගීතාවලියෙහි ගීතිකා වලට ඉහළින් දක්වා ඇති උපශීර්ෂ පාඨ පසුකාලීනව ජුදෙව් ආගමික ගුරුවරුන් (රබ්බිවරුන්) විසින් එක් කරනු ලැබ ඇත්තේ ජනවන්දනා කටයුතු වලට ආධාරයක් වශයෙනි.

★ දෙව්මැඳුරේ ගායනය මෙහෙයවන කණ්ඩායම් වලට උපදෙස් දීමට (තේරා සහ අසාප් යන කණ්ඩායම්වලට : ගීතා 45, ගීතා 80)

★ දේව ජනතාවට මඟ පෙන්වූ නායකයන් යාච්ඤා ජීවිතයට සම්බන්ධ වූවන් ලෙස දැක්වීමට (මෝසෙස්: ගීතා 90, ජෙරමියා 137, සොලමන් 72)

★ මෙනෙහි කිරීමට රුකුලක් සේ ඓතිහාසික සිදුවීම සඳහන් කිරීම.

(සියලු සතුරන්ගෙන්, සාවුල් අතින් දාවිත් රජ බේරා ගැනීම ගැන : ගීතා.18, 1 සාමුවෙල් 19, දාවිත් රජ පරදාර සේවනයෙන් පසු මනස්ථාපනය වීම ගැන : ගීතා 51, 2 සාමුවෙල් 12)

**(තවත් කොටසක් ලබන සතියේ)**

## 2012 දේව වචනයේ වසර — සාමාන්‍ය සමයේ පස්වන ඉරුදින



**පළමුවන කියවීම : ජෝබ් 7:1-4, 6-7**

මරණින් මතු ජීවිතයක් පිළිබඳ විශ්වාසයක් නොතිබුණු සමයක යකුගේ ක්‍රියාවල ඵල විපාක මෙලොව ජීවිතය තුළ යැයි පිළිගැණුනි. එහෙත් දමිටුවා මරණය දක්වා දුක් විඳින්නෙත් අදමිටුවා ජීවිතයේ අවසානය දක්වා යහතින් ජීත් වන්නේ ඇයිද යන්න ගැටළුවක් විය. ක්‍රි.පූ. 6 වන සියවසේ පමණ ජෝබ්ගේ පොත ලියැවී ඇත්තේ මෙම ගැටළුවට යම්කිසි පිළිතුරක් සැපයීමටය. ධර්මිෂ්ඨ යැයි දෙවියන් වහන්සේ විසින් පිළිගනු ලැබූ ජෝබ් පවසන්නේ රෑ දහවල් දෙකේහි දැරිය නොහැකි දුක්වේදනා තමා විඳින බවය. ඔහු මේ හේතුකොට ගෙන විශ්වාස භංගත්වයට පැමිණ ඇති බව පෙනේ. සමහර අයගේ අත්දැකීම ද මෙවැනිය. දුක හා වේදනාවේ අරුතක් ඇත්ද යන්න බොහෝ අයගේ ගැටළුවකි. එහෙත් අද මරණින් මතු විපාක පිළිබඳ විශ්වාසයක් ඇති අපට දුක් කරදරවල තේරුම කුමක්දැයි සොයා බැලීම යෝග්‍ය වේ.

**දෙවන කියවීම : 1 කොරින්ති 9, 16-19, 22-23**

පාවුළු තුමා සඳහන් කරන පරිදි ශුභාරංචිය අන්‍යයන් හට ප්‍රකාශ කිරීම මනාපයක් නොව අනිවාර්ය වගකීමකි. එය පලදායී ලෙස ප්‍රකාශ කළ හැක්කේ අන්‍යයන් සමඟ සංවේදී වීමෙන් ය. එවිට එය පිළිගත හැකි සමීප පණිවුඩයක් බවට පත් වේ.




**ශුභාරංචිය: මාක් 1:29-39**

ජේසුස් වහන්සේ පේදුරු තුමාගේ නැන්දණිය ඇතුළු බොහෝ ආබාධ වලින් පෙළුණු අය සුවපත් කළ සේක. මෙයින් මනුෂ්‍යයන් වෙත ඇති දෙවියන් වහන්සේගේ කරුණාව ප්‍රකාශ කෙරේ. එහෙත් උන්වහන්සේගේ මහත් ක්‍රියා නිසා වූ ජනයාගේ ප්‍රතිචාරය නොසලකා උන්වහන්සේ එහි නොරැඳී ශුභාරංචිය දේශනා කිරීමට වෙනත් ස්ථාන වලට ගමන් ගත් සේක.

**මෙනෙහි කිරීම**

දුක හා වේදනාව සමහර විටෙක දුර කළ නොහැකි වුවත් දෙවියන් වහන්සේ සමඟ සමීප අත්දැකීමක් තුළින් එය යම් තරමකට අවබෝධ කරගෙන එය සමඟ ජීවත් විය හැකිය.

ශුභාරංචියට ප්‍රකාශ කිරීම හා එයට සාක්ෂි දැරීම අප සතු අනිවාර්ය වගකීමකි. එය අප ඉටු කරන්නේ කෙසේ ද? අන් අයගේ දුක් හා කරදර වලට සංවේදී වෙමින් ක්‍රිස්තුන් වහන්සේ මෙන් ඒවායින් අන්‍යයන් මුදා ගැනීම අප සතු වගකීමකි.

එමනිසා එක් තැනකට කොටු නොවී හැකි සියල්ලන් වෙතට අපගේ අවධානය යොමු කිරීම යෝග්‍ය වේ.

> **"දුක හා වේදනාවේ අරුතක් ඇත්ද යන්න බොහෝ අයගේ ගැටළුවකි. එහෙත් අද මරණින් මතු විපාක පිළිබඳ විශ්වාසයක් ඇති අපට දුක් කරදරවල තේරුම කුමක්දැයි සොයා බැලීම යෝග්‍ය වේ."**

## ගරු හෙන්රි සිල්වා පියතුමා — 21

# උත්පත්ති පොත




### 6. පාපය පිළිබඳ තෙවන කථාව
### ජලගැල්මේ කථාව - උත්පත්ති 6:1-9:17

**මූලාශ්‍ර**

1. මූලාශ්‍ර සම්බන්ධ ගැටළුවක් වෙයි.

★ එකම දෙය දෙවරක් කියනු දක්නට ලැබේ. නිද. ජලගැල්මකින් ලෝකය විනාශ කිරීමට යාම පිළිබඳ දේව අභිමතය 6/7 මෙන්ම 6/13 හි ද දක්නට ලැබේ.
★ නෝවාට දේව අභිමතය දැනුම් දීම ද 6/17 සහ 7/4 හි සඳහන්වේ.
★ ජලගැල්මෙහි ආරම්භය 7/10 හා 7/11 දක්නට ලැබේ.
★ ජලය බැස යාම 8/1 හා 8/3 සඳහන් වෙයි.
★ නැවත ජල ගැල්මකින් ලෝකය විනාශ නොකරන බවට වු දෙවියන් වහන්සේගේ පොරොන්දුව 8/21 මෙන්ම 9/15 හි ද දිස්වෙයි.

2. එකිනෙකට වෙනස් කරුණු විස්තරයෙහි ඇත. නිද. 7/2 හි නැවට ගත යුතු සතුන් සංඛ්‍යාව පවිත්‍ර සතුන්ගෙන් (යාග පූජා සඳහා භාවිත කරන) ජෝඩු හත බැගින් හා අපවිත්‍ර සතුන්ගෙන් (යාග පූජා සඳහා හෝ අනුභවය සඳහා භාවිත නොකරන ) ජෝඩුව බැගිනි. එහෙත් 7/8 හි සඳහන් වන්නේ පවිත්‍ර සතුන්ගේ හා අපවිත්‍ර සතුන්ගෙන් ජෝඩුව බැගින් නැවට ගත යුතු බවය.

3. පැහැදිලිව පෙනෙන සාහිත්‍යමය ශෛලීන් දෙකක් කථා පුවතෙහි ඇතුලත්ව ඇත.

එබැවින් එකිනෙකට වෙනස් මූලාශ්‍ර දෙකක් මෙහි එක්කොට ඇති බව නිගමනය කළ යුතුය.
ඒවාඃ
("ජේ") යාවිස්ත සහ ("පී") පූජක සම්ප්‍රදායයන්ය. තෙවැනි මූලාශ්‍රයක්ද මෙහි ඇත. "ආර්" (R) මෙම මූලාශ්‍ර දෙක එක් කළ සංස්කාරකවරයාය.

**ඓතිහාසිකත්වය**

මෙම කථා පුවතෙහි යම් ඓතිහාසික ගැටළු දක්නට ලැබෙයි.

1. නැවේ ප්‍රමාණය හා එහි ඇතුලු කළ හැකි සතුන් සංඛ්‍යාව
2. සතුනට දීම සඳහා අවශ්‍ය කෑම සෙවීම හා රැස් කිරීම.
3. බයිබලීය ජල ගැල්මේ කථාව හා බොහෝ සමානතා දක්වන පුරාණ මැද පෙරදිගට ආවේනික ජල ගැල්මේ කථා ද ඇත.
   නිද. ගිලීගමේෂ් යනුවෙන් හැඳීන්වෙන බැබිලෝනියානු ජල ගැල්මේ කථාව. මෙය බයිබලීය කථාවට බෙහෙවින් සමාන වන අතර ඒ හා සමකාලීන කෘතියක් බව පෙන්නුම් කරයි.

**ගිල්ගමේෂ්**

ගිල්ගමේෂ් නම් වීරයා හිස් හතක් ඇති 'හුවාවා' නම් බියකරු මකර සර්පයකු මරා දැමූ බව කියැවෙයි. ඒ අනුව ඉෂ්මාර් (නින්ටු) දේවතාවිය ඔහුට පෙම් බඳියි. නමුත්, ඔහු ඇගේ ප්‍රේමය ප්‍රතික්ෂේප කරයි. කෝපාවිෂ්ඨ වන දේවතාවිය ගිල්ගමේෂ්ගේ සමීපතම මිතුරා වන එන්කිඩු මරා දමයි. ගිල්ගමේෂ් දිවි ගලවා ගැනීම සඳහා උට්නාපිෂ්ටිම් නම් මුතුන් මිත්තකු සොයා යයි. හෙතෙම මහා ජලගැල්මකින් දිවි ගලවා ගැනීමෙන් අනතුරුව අමරණීයත්වය ලද අයෙකි. කථාවට අනුව, මිනිසුන් පමණට වඩා ඝෝෂා කිරීම පිළිබඳව දෙවිවරු කෝපවුහ. එනිසා ඔව්හු එක් රැස් වී මනුෂ්‍ය සංහතිය වෙත ජල ගැල්මක් එවා මනුෂ්‍යයන් මෙලොවින් තුරන් කර දැමීමට තීරණය කළහ. මෙය ක්‍රියාත්මක කිරීම භාර වුයේ 'එන්ලිල්' නම් ප්‍රධාන දෙවියාටය. 'එආ' නම්වු දෙවියන් තම මිතුරු උට්නාපිෂ්ටිම්ට මේ බව දන්වා මහා ජල ගැල්මෙන් බේරීම සඳහා යාත්‍රාවක් සාදන්නට ඔහුට උපදෙස් දෙයි. උට්නාපිෂ්ටිම්, තම පවුලේ අයද තමනට අයත් සතුන්ද යාත්‍රාව තුළට ගෙන ජල ගැල්මෙන් බේරෙයි. පළමුව කපුටකු ද අනතුරුව පරවියකුද පිටතට යැවීමෙන් පසුව ජලය බැස ගොන් ඇති බව ඔහු දැනගනී. අනතුරුව දෙවිවරු, අමරණීයත්වය ලැබීම සඳහා ජීවන වෘක්ෂයෙන් අනුභව කරන ලෙස ඔහුට උපදෙස් දෙති.

ඇකේඩියානු භාෂාවෙන් (පුරාණ මෙසපොතේමියානු භාෂාවකි) ඉදිරිපත් කරන ජල ගැල්මේ කථාවක්ද වෙයි. එහි වීරයා අට්‍රාහාසිස්ය. මෙම කථාව බයිබලීය කථාවට වඩා අවුරුදු දාහක් පමණ පැරණිය. ජලගැල්ම පිළිබඳ ඉපැරණි සුමේරියානු කථාවක්ද වෙයි. එහි වීරයා සිවුසුද්‍රාය. එබැවින් සාමාන්‍ය පිළිගැනීම වනුයේ, බයිබල් කතුවරුන් පාපයේ විනාශකාරී ප්‍රතිඵල පිළිබඳ ඉගැන්වීමක් ඉදිරිපත් කිරීම සඳහා පුරාණ මැද පෙරදිග ප්‍රචලිතව පැවති ජල ගැල්මේ කථාවක් උපකාරී කරගෙන ඇති බවය. බයිබලිය ජල ගැල්මේ කථාව වෙනස් වූ අංගයන් සහිත වු අතර පැවතුන ජල ගැල්මේ කථා බයිබල් කතුවරුන් විසින් යළි රචනා කර ඇති බව පෙනේ. එනම්.

1. පුරාණ මැද පෙරදිග පැවති අනෙකුත් ජල ගැල්මේ කථාවල ප්‍රධාන අංගය වනුයේ බහු දේව වාදයයි. (දෙවිවරු කිපදෙනකු ඇදහිම) බයිබලිය ජල ගැල්මේ කථාව තුළ බහු දේව වාදය මුලුමනින් ඉවත් කොට ඇත.

2. බයිබල් කතුවරු අනෙක් ජල ගැල්මේ කථාවල ඇති අතිශයෝක්තිය සහිත යෙදුම් සියල්ල ඉවත් කර ඇත. නිද. ගිල්ගමේෂ්හි යාත්‍රාව තට්ටු හතක් සහිත සිලින්ඩරාකාර යාත්‍රාවකි.


3. බයිබල් කතුවරු අනෙකුත් ජල ගැල්මේ කථාවල දක්නට නොමැති දේව ධර්මයක් බයිබලීය කථාවෙන් හඳුන්වා දී ඇත.

**(තවත් කොටසක් ලබන සතියේ...)**

# සලාපුර සසුන්කෙත අස්වද්දන්නට නවක පූජක පුතුන් නම දෙනෙක්

2012 ක් වූ නවම් මස 11 වන ශනි දින පෙ.ව. 9.00 ට සලාපුර කාර්මෙල් දේවමාතාවන්ගේ ආසන දෙව් මැඳුරේ දී සලාපුර රදගුරු අති උතුම් දෙව්ශ්‍රීත වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන් අතින් සමිඳුන් තුළ තේවාචාරීන් නව දෙනෙක් පූජක තේවා වරම් ලබති.

### ගරු කේ. ජනක නිශාන්ත තේවාචාරිතුමා



කඩයාමොට්ටේ මීසම් සංඝයට අයත් කරුක්කුමඩුව ග්‍රාමයෙහි කේ. ෂෙල්ටන් අප්පුහාමි සහ ශ්‍යාමා සුරනි සංගීතා යන යුවළට දාව 1983 පෙබරවාරි මස 01 දින ගරු කේ. ජනක නිශාන්ත තේවාචාරිතුමන් උපත ලැබීය. තම මූලික අධ්‍යාපනය සාරතී කණිටු විදුහලින් සහ නවදන්කුලම රජයේ විදුහලින් හදාරනු ලැබූ මෙතුමා 2000 මැයි මස 21 වන දින මාරවිල සා. පාවුළු කනිටු දෙව්සත්හලට ඇතුලත් විය. අනතුරුව තම උසස් පෙළ අධ්‍යාපනය සා. සේවියර් මධ්‍ය මහා විදුහලින් නිමකළ ඉක්බිති 2003.09.13 දින කළුතර දහම් සෙවන දෙව්සත්හලට ඇතුලත්ව එහි අධ්‍යාපන කටයුතු හමාර කිරීමෙන් අනතුරුව 2004.9.23 දින අම්පිටිය ජාතික දෙව්සත්හටල ඇතුලත් විය. එහිදී දර්ශනවාදය සහ දේවධර්මය හැදෑරීමෙන් පසුව 2011.10.29 දින තේවාචාර්ය ධූරය ලැබීය. තේවාධූර වරම් ලැබීමට පෙර සහ පසුව එතුමා කරුවලගස් වැව සහ තලවිල යන මීසම් හී තම සේවා කටයුතු සිදුකරන ලදී. මෙතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 8.30 ට කරුක්කුමඩුව ජපමාලයේ අප ස්වාමිදුවගේ දෙව්මැඳුරේ දී සිදුකරනු ලබයි.

### ගරු විරාජ් එරංග තේවාචාරිතුමා



අඹකඳවිල මීසම් සංඝයට අයත් ඉරණවිල ග්‍රාමයෙහි බී. කේ. ඩේවිඩ් රුදිගු සහ එල්. මරිය ඩාර්ලින් හාමි යන යුවළට දාව 1983.03.09 දින ගරු විරාජ් එරංග තේවාචාරිතුමන් උපත ලැබීය. මෙතුමා 1998.01.08 දින මාරවිල සා. පාවුළු කණිටු දෙව්සත්හලට ඇතුලත් වී තම උසස් පෙළ අධ්‍යාපනය සා. සේවියර් මධ්‍ය මහා විද්‍යාලයෙන් නිමකර අනතුරුව 2003.09.13 දින කළුතර දහම් සෙවන දෙව්සත්හලට ඇතුලත් විය. එහි අධ්‍යාපන කටයුතු හමාර කිරීමෙන් අනතුරුව 2004.09.23 දින අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුලත්ව දර්ශනවාදය හා දේවධර්මය හැදෑරීමෙන් පසුව 2011.10.29 දින තේවාචාර්ය ධූරය ලැබීය.

තේවාධූර වරම් ලැබීමට පෙර හා පසුව එතුමා කට්ටකාඩුව සහ කටුනේරිය යන මීසම් හී තම සේවා කටයුතු සිදුකරන ලදී. මෙතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 9.00 ඉරණවිල ශු. කාර්මෙල් මාතා දේවස්ථානයේ දී සිදුකරනු ලබයි.

### ගරු ශ්‍රීනිත් ප්‍රනිල්ක තේවාචාරිතුමා



වයික්කාල මීසම් සංඝයට අයත් සින්දාත්‍රිය ග්‍රාමයෙහි ඩබ්. ප්‍රැන්සිස් කරුණාසිරි ප්‍රනාන්දු සහ නීලා මිල්රඩ් ප්‍රනාන්දු යන යුවළට දාව 1983.03.10 දින ගරු ශ්‍රීනිත් ප්‍රනිල්ක තේවාචාරිතුමන් උපත ලැබීය. මෙතුමා 1997.01.06 දින මාරවිල සා. පාවුළු කණිටු දෙව්සත්හටල ඇතුලත් වී තම උසස් පෙළ අධ්‍යාපනය සා. සේවියර් මධ්‍ය මහා විද්‍යාලයෙන් නිමකර, අනතුරුව 2003.09.13 දින කළුතර දහම් සෙවන දෙව්සත්හටල ඇතුලත් විය. එහි අධ්‍යාපන කටයුතු හමාර කිරීමෙන් අනතුරුව 2004.09.23 දින අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුලත්ව දර්ශනවාදය හා දේවධර්මය හැදෑරීමෙන් පසුව 2011.10.29 දින තේවාචාර්ය ධූරය ලැබීය.

තේවාධූර වරම් ලැබීමට පෙර හා පසුව මෙතුමා කටුනේරිය සහ වනාතවිල්ලුව යන මීසම් හි තම සේවා කටයුතු සිදුකරන ලදී. මෙතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 9.00 ට සින්දාත්‍රිය සින්දාත්‍රි මාතා දෙව්මැඳුරේ දී සිදුකරනු ලබයි.


### ගරු ජෝශප් ඩෙනිස් ගයාන් තේවාචාරිතුමා



නයිනමඩම මීසම් සංඝයට අයත් ඩී. ආර්. ජෝශප් මැලින්ටන් අප්පුහාමි සහ ඩබ්. මරියමදලේනා පෙරේරා යන යුවළට දාව 1984.03.10 දින ගරු ජෝශප් ඩෙනිස් තේවාචාරිතුමා උපත ලැබීය. තම මූලික අධ්‍යාපනය නයිනමඩම සා. මරියා විද්‍යාලයෙන් සහ මාරවිල සා. සේවියර් විද්‍යාලයෙන් හදාරනු ලැබූ මෙතුමා 1999.01.03 දින මාරවිල සා. පාවුළු කණිටු දෙව්සත්හලට ඇතුලත්ව තම උසස් පෙළ අධ්‍යාපනය එහි නිමාකොට 2003.09.13 දින කළුතර දහම් සෙවන දෙව්සත්හලට ඇතුලත් විය. එහි අධ්‍යාපන කටයුතු හමාර කිරීමෙන් අනතුරුව 2004.09.23 දින අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුලත්ව එහිදී දර්ශනවාදය සහ දේවධර්මය හැදෑරීමෙන් අනතුරුව 2011.10.29 දින තේවාචාර්ය ධූරය ලැබීය.

තේවාධූර වරම් ලැබීමට පෙර සහ පසුව එතුමා වනාතවිල්ලුව සහ වෙන්නප්පුව යන මීසම් හී තම සේවා කටයුතු සිදුකරන ලදී. මෙතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 7.30 ට නයිනමඩම වික්ෂෝප දේවමාතා දෙව්මැඳුරේ දී සිදුකරනු ලබයි.

### ගරු සුජාන් නිශ්ශංක තේවාචාරිතුමා



තොඩුවාව මීසම් සංඝයට අයත් ජේ. ඒ. ගිරිගෝරිස් අප්පු සහ පී. ටී. මරියමදලේනා ප්‍රනාන්දු යන යුවළට දාව 1984.08.28 දින ගරු සුජාන් නිශ්ශංක තේවාචාරිතුමා උපත ලැබීය. තම මූලික අධ්‍යාපනය තොඩුවාව සා. අන්තෝනි මහා විදුහලින් නිමකළ මෙතුමා 1999.01.05 දින මාරවිල සා. පාවුළු කනිටු දෙව්සත්හටල ඇතුළු වී සා. සේවියර් විදුහලින් තව දුරටත් අධ්‍යාපනය හදාරා 2003.09.13 දින කළුතර දහම් සෙවන දෙව්සත්හලට ඇතුලත් විය. එහි අධ්‍යාපන කටයුතු හමාර කිරීමෙන් අනතුරුව 2004.09.23 දින අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුලත්ව එහිදී දර්ශණවාදය සහ දේවධර්මය හැදෑරීමෙන් පසුව 2011.10.29 දින තේවාචාර්ය ධූරය ලැබීය.

තේවාධූර වරම් ලැබීමට පෙර සහ පසුව එතුමා නාත්තන්ඩිය සහ කරුවලගස්වැව යන මීසම් හී තම සේවා කටයුතු සිදු කරන ලදී. මෙතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 7.30 ට තොඩුවාව සා. අන්තෝනි මුනිඳුන්ගේ දෙව්මැඳුරේ දී සිදුකරනු ලබයි.

### ගරු දුමින්ද සුරේෂ් කුමාර තේවාචාරිතුමා



අඹකඳවිල මීසම් සංඝයට අයත් ඉරණවිල ග්‍රාමයෙහි එච්. ඒ. ඩී. මයිකල් අප්පුහාමි හා ඩබ්. පුෂ්පා තෙරෙස් ජයන්ති යන යුවළට දාව 1985.03.27 දින ගරු දුමින්ද සුරේෂ් තේවාචාරිතුමන් උපත ලැබීය. මෙතුමා 1999.01.05 දින මාරවිල සා. පාවුළු කණිටු දෙව්සත්හලට ඇතුලත් වී තම අධ්‍යාපනය සා. සේවියර් මධ්‍ය මහා විද්‍යාලයෙන් නිමකර අනතුරුව 2003.09.13 දින කළුතර දහම් සෙවන දෙව්සත්හලට ඇතුලත් විය. එහි අධ්‍යාපන කටයුතු හමාර කිරීමෙන් අනතුරුව 2004.09.23 දින අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුලත්ව දර්ශනවාදය හා දේවධර්මය හැදෑරීමෙන් පසුව 2011.10.29 දින තේවාචාර්ය ධූරය ලැබීය. තේවාධූර වරම් ලැබීමට පෙර හා පසුව එතුමා වෙන්නප්පුව සහ ආණමඩුව යන මීසම් හි නව සේවා කටයුතු සිදු කරන ලදී. මෙතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 9.00 ඉරණවිල ශු. කාර්මෙල් මාතා දෙවස්ථානයේ දී සිදුකරනු ලබයි.

### ගරු ශිරාන් චාමක තේවාචාරිතුමා



කටුනේරිය මීසම් සංඝයට අයත් ඉහළ කටුනේරිය ග්‍රාමයෙහි ඩබ්. ජී. අයිවන් රන්ජන් පෙරේරා සහ ඩබ්. එම්. මොනිකා ප්‍රින්සි ප්‍රනාන්දු යන යුවළට දාව 1985.05.24 දින ගරු ශිරාන් චාමක තේවාචාරිතුමන් උපත ලැබීය. මෙතුමා තම මූලික අධ්‍යාපනය කටුනේරිය සා. සෙබස්තියන් මධ්‍ය මහා විදුහලින් හමාර කර 2000.01.23 මාරවිල කුඩා දෙව්සත්හලට ඇතුලත්ව තම උසස් පෙළ අධ්‍යාපනය සා. සේවියර් මධ්‍ය මහා විදුහලින් හැදෑරීය. අනතුරුව 2003.09.13 දින කළුතර දහම් සෙවන දෙව්සත්හලට ඇතුලත් වී එහි අධ්‍යාපන කටයුතු හමාර කිරීමෙන් අනතුරුව 2004.09.23 දින අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුලත්ව දර්ශනවාදය හා දේවධර්මය හැදෑරීමෙන් පසුව 2011.10.29 දින තේවාචාර්ය ධූරය ලැබීය.

තේවාධූර වරම් ලැබීමට පෙර හා පසුව එතුමා තලවිල සහ දුම්මලදෙණිය යන මීසම් හී තම සේවා කටයුතු සිදුකරන ලදී. මෙතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 8.30 ට කටුනේරිය සා. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ දී සිදුකරනු ලබයි.


### ගරු ඉසංක මිහිරාන් තේවාචාරිතුමා



උල්හිටියාව මීසම් සංඝයට අයත් ඩබ්. ජූඩ්. එම්මානුවෙල් ප්‍රනාන්දු සහ එම්. උදුලා වසන්ති ප්‍රනාන්දු යන යුවලට දාව 1985.10.28 දින ගරු ඉසංක මිහිරාන් තේවාචාරීතුමා උපත ලැබීය. මෙතුමා තම මූලික අධ්‍යාපනය වෙන්නප්පුව ජෝශප් වාස් විදුහලින් නිමකර 2000.01.13 මාරවිල කුඩා දෙව්සත්හලට ඇතුලත්ව තම උසස් පෙළ අධ්‍යාපනය සා. සේවියර් මධ්‍ය මහා විදුහලින් හැදෑරීය. අනතුරුව 2003.09.13 දින කළුතර දහම් සෙවන දෙව්සත්හලට ඇතුලත් වී එහි අධ්‍යාපන කටයුතු හමාර කිරීමෙන් අනතුරුව 2004.09.23 දින අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුලත්ව දර්ශනවාදය හා දේවධර්මය හැදෑරීමෙන් පසුව 2003.10.29 දින තේවාචාර්ය ධූරය ලැබීය.

තේවාධූර වරම් ලැබීමට පෙර සහ පසුව එතුමා ආණමඩුව සහ නාත්තන්ඩිය යන මීසම් හි තම සේවා කටයුතු සිදුකරන ලදී. මෙතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 7.30 ට උල්හිටියාව සා. සේවියර් දේවස්ථානයේ දී සිදුකරනු ලබයි.

### ගරු පැතුම් නිර්මාල් තේවාචාරිතුමා



කටුනේරිය මීසම් සංඝයේ මුදුකටුව ග්‍රාමයෙහි එම්. එම්. සී. ජයන්ත අප්පුහාමි සහ කේ. ආර්. ජී නිර්මාලා ප්‍රනාන්දු යන යුවළට දාව 1985.12.28 දින ගරු පැතුම් නිර්මාල් තේවාචාරි තුමන් උපත ලැබීය. මෙතුමා 2000.01.13 මාරවිල සා. පාවුළු කනිටු දෙව්සත්හලට ඇතුලත්ව තම අධ්‍යාපනය මාරවිල සා. සේවියර් මධ්‍ය මහා විදුහලින් හමාර කිරීමෙන් අනතුරුව 2003.09.13 දින කළුතර දහම් සෙවන දෙව්සත්හලට ඇතුලත් විය. එහි අධ්‍යාපනය නිමාකිරීමෙන් අනතුරුව 2004.09.23 දින අම්පිටිය ජාතික දෙව්සත්හලට ඇතුලත්ව දර්ශනවාදය හා දේවධර්මය හැදෑරීමෙන් පසුව 2011.10.29 දින තේවාචාර්ය ධූරය ලැබීය. තේවාධූර වරම් ලැබීමට පෙර සහ පසුව එතුමා දුම්මලදෙණිය සහ කට්ටාකඩුව යන මීසම් හී තම සේවා කටයුතු සිදුකරන ලදී. මෙතුමාගේ කුළුදුල් දිව්‍ය යාගය 2012 පෙබරවාරි මස 12 දින පෙ.ව. 8.30 ට කටුනේරිය සා. සෙබස්තියන් මුනිඳුන්ගේ දෙව්මැඳුරේ දී සිදුකරනු ලබයි.

**රනිල් ඉන්දික පෙරේරා සහෝදරතුමා**
ජාතික දෙව්සත්හල - අම්පිටිය

# මට තාම මතකයි අයියේ !



ගරු මැක්ස්වල් සිල්වා පියතුමා - සහයක රදගුරු වරයට නම් කිරීම ඇසීමෙන් එක කුස උපන් සහෝදරයකු වශයෙන් මට මහත් සන්තෝෂයක් ඇතිවිය. ඔබ වයස අවුරුදු 10 යේදී පමණ අප හට පාඩම් උගැන් වූ අයුරුත් - අප සමඟ වත්තේ දුවමින් ක්‍රිකට් ගැසූ අයුරුත් මා සිහිපත් කරන්නේ ඉතා සෙනහසිනි. එතුමා කුඩා කල අප තාත්තාගේ රැලේ බයිසිකලය පිටුපස වත්තට ගෙන ගොස් එහි සීනුව නාද කරමින් බයිසිකලය පදින්න පුහුණු වනකම් මා වැටෙන්න නොදී එය අල්ලාගෙන පස්සෙන් දිවූ ඒ සුන්දර අත්දැකීම් ද, පසුව ඔබ පුහුණු වූ පසු මට එය පදින්න පුහුණු කළ අයුරුත් අද මෙන් මට මතකය. අප පාසල් බස් රථයේ ගමන් කළ ආකාරයත් ඔබට ශත 05 භාග ටිකට් එක දී මං සම්පූර්ණ ටිකට් එකක් ඉල්ලූ විට ඔබ කොන්දොස්තරව හාස්‍යයට ලක්කරමින් මා හට 1/2 ටිකට් එකක්
ලබාගැනීමට සැලස්විය. එක ඇඳේ නිදියා ගත් අප කිසිදාකවත් රණ්ඩු කරගෙන නැත. ප්‍රශ්න ඇති කරගෙන දබර කරගෙන ද නැත.
එසේ එක පතේ කා බී සිටි ඔබ හිටිහැටියේ ගිහි ගෙය අතහැර - බොරැල්ලේ දෙව්සත්හලට පූජක දිවියට පුහුණු වීමට යන විට ඔබට අවුරුදු 13 ක් පමණ විය. වසර දෙකකින් බාල මා හට එම දිනය ඉතා දුක්මුසු දිනයක් විය.

එහෙත් ඔබ කවදා හෝ පියතුමකු වන බව නම් මට එදා සිටම පැහැදීමක් තිබුණි. පාන්දරින් නැගිට කොස්පැලැන මඩමේ ගරු පූපොන් සුවාමිට පූජාවට උදව් වූ සැටිත්, විල්ලෝරාවත්ත කනිටු පිරිමි මරිය හමුදාවට බැඳී ලොකු සහෝදරයන් සිටිය දී සුළු කාලකින් එහි ලේකම් ධූරය භාරගෙන වාර්තා ඉතා ලස්සනට ලියා කියවූ හැටිත් මට මතකයි. වෙලේ දුප්පත් පැල්පතේ කොස්පැලැන කොරියාව දුප්පත් ළමුන්ව දහම් පාසලට එක්කරගෙන ඒමට මව්පියන්ට උපදෙස් දුන්නේ අපවෙද මරිය සේවයට පොළඹවමිනි. පිළියන්දල වැවල ශු. ලාසරස් මුනිතුමන්ගේ නුවාන වලට ඔබ අපව එක්කරගෙන ගියේ මළ හිරු බැස යන හැන්දෑවේය. එහෙත් එය අවසන්වී අප රබර් වතු මැදින් ආපසු ආවේ කට්ට කළුවරේ පොල්කටුවකට ඉටිපන්දම් ගසා එහි ආලෝකයෙනි.

මොරටුව සා. සෙබස්තියන් විදුහලේ 8 වසරේ ඔබ ඉගෙන ගන්නා කාලයේ පාසල් ඇරී යාළුවන් සමඟ ගෙදරට හොරෙන් පාපන්දු ක්‍රීඩා කිරීමට යන විට මාවද හවුල් කර ගත්තේ එසේ නොවුනහොත් මා ගෙදර ගොස් දෙමව්පියන්ට කියාවි කියා දැයි යන්න මට ප්‍රශ්නයක් විය.

පාපන්දු මෙන්ම ක්‍රිකට් වලටද ආසාවක්, දක්ෂතාවක් දැක්වූ එතුමාට එදා හයේ පහරක් ගැසීම ඉතා සුළුදෙයකි. තට්ටු ක්‍රිකට් වලට එතරම් ආසාවක් නැති නිසා පන්දුවට ඉතා ඉක්මනින් පහර දෙන්නට හරි සූරයෙකි. වැඩිමහල් අයයිලා සමඟ ක්‍රිකට් මැච් ගැසීමට අමතක නොකළ අතර නිවාඩු කාලයේ සමකාලික ක්‍රිකට් මිත්‍රයන් අතර ගරු සුනිල් කුමාර ඇන්ටන් ජයලත්, ස්වර්ගස්ථ සුනිල් හර්මන් පියතුමන් හා අතිගරු සිරිල් ගාමිණී නාහිමිපාණන්ද විය.

මෝල්පේ විජය බෞද්ධ මධ්‍යස්ථානයේ ලොකු හාමුදුරුවෝ, මෙතොදිස්ත පල්ලියේ පාස්ටර්, පල්ලියේ සන්ක්‍රිස්තියන් මාමා ගමේ එකම ගොන්කරත්තයේ යමින් එකට හෝඩිය පංතියේ ඉගෙන ගත්ත සුනිල්, එතුමාගේ සුහද මිත්‍රයො වූහ. දිනක් මොරටුමුල්ලේ හමුවූ බරකරත්ත මිත්‍රයාගේ කරත්තේ නැගී ගෙදර ආ අයියා අම්මාගේ හාස්‍යයට ලක්වූවා මට මතකයි.

තාත්තා සේවය කළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගොස් එහි 10 වන මහලේ සිට කොළඹ ජැටිය දිහා බලා සිටි ඔහු එය සිහිපත් කරන්නේ ඉතා සෙනෙහසිනි. තමාට ගණිතය උගැන්වූ මෝල්පේ අයිරින් අක්කා, අර්ල් සර්, සිහිකරන්නේ ඉතා ආදරයෙනි. මරිය හමුදාවේ ඇන්ටනි ලියනගේ, බෙනඩික් අයියා හා සනී සහෝදරයා ඔහුගේ පරණ මරිය හමුදා මිත්‍රයෝය. කවදත් කවුරුන් සමඟත් ඉතා සුහදව ජීවත් වූ මගේ වැඩිමහලු සහෝදරයා පිය නගන නව මාවතේ දෙවියන් වහන්සේ ඔබට දුන් එම වගකීම හරියාකාර කිරීමට දෙව්වරම් පිහිට ලැබේවා.

**- සොයුරු ඇන්ජලෝ සිල්වා ලියයි**

# හේද බින්න නොවී එකමුතු වීමට නායකකන්ද ජුබිලියෙන් ආදර්ශයක්




**ලංකාවේ බොහෝ මීසම් තුළ ජුබිලි සංවත්සර සැමරීමේ ප්‍රවනතාවයක් අද වන විට පවතී. නමුත් බොහෝ ජුබිලි සංවත්සර කෙළවර වනුයේ විවිධ මත ගැටුම් හා හේද ඇතිවීම තුළය. ඇතැම් දේවස්ථාන, ජුබිලි සැමරුම පසෙක තබා වසා දමන්නට සිදුවූ අවස්ථාද වාර්ථා වීම කිතුනුවන් ලෙස අතිශයින්ම කණගාටුව දනවන්නකි. කෙසේ නමුත් ජුබිලි සැමරිය යුත්තේ කෙලෙසදැයි යන්නට පූර්වාදර්ශයක් මෙරට සියලුම කිතුනු ජනතාව හට නායකකන්ද මීසම උදාහරණ කොටගෙන දැක්වීමට මෙම ලිපිය පාදක කොට ගනිමි.**

### වැඩිම කතෝලික පිරිසක් ඇති මීසම

නායකකන්ද යනු ශ්‍රී ලංකාව තුළ තිබෙන වැඩිම කතෝලික ජනගහණයෙන් සමන්විත මීසම වේ. නායකකන්ද කානික්ක දේවමාතාවන්ගේ දේවස්ථානයත්, බලගල ප්‍රාතිහාර්යවූ සදාසරණ අප දේව මාතා දේවස්ථානයත්, කෙරවළපිටිය ශු. ජුසේ මුනිඳුන්ගේ දේවස්ථානයත් කේන්ද්‍රකොට ගෙන බිහි වූ මීසමකි. අතිශය බහුතරයක් කතෝලික වූද බෞද්ධ හා හින්දු බැතිමතුන් සුළුතරයකගෙන්ද සමන්විත නායකකන්ද මීසම පාරම්පරිකව දිගින් දිග ටම ගෙන ආ කතෝලික ඇදහිලි ක්‍රම, උත්සව හා මංගල්‍යය රාශියකින් යුක්ත වූ මීසමකි. සිංහල බහුතරයක් හා ද්‍රවිඩ, බර්ගර් වැනි සුළුතරයකින් යුත් වූ කතෝලික පසුබිමක් ඇති නායකකන්ද මීසමේ පිබිදීමේ පිටුපස ස්වර්ගස්ථ බෙනඩික් ජයතිලක පියතුමා, ග්‍රෙගරි ජයන්ත පියතුමා වැන්නන්ගේ දැවැන්ත සෙවනැල්ල අමතක කළ නොහැකිය. නායකකන්ද මීසම 150 වැනි ජුබිලිය සැමරීමට වසරකුත් මාස කිහිපයකට පෙර ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමන්ගේ පැමිණීම සිදුවන අතර එතුමන් විසින් සිදු කරන පළමු කාර්‍යය වන්නේ මීසමේ විසිරී වෙන් වී සිටින්නවුන් එකතු කර එක්රැස් කිරීමයි. 150 වැනි වසරේ ජුබිලිය සමරන්නට සූදානම් වන දැවැන්ත මීසමක් වූ නායකකන්ද දේවස්ථානය ඒ වන විටත් ප්‍රතිසංස්කරණ කටයුතු රාශියක් කළ යුතුව තිබූ, වසර ගණනකින් පිළිසකර කර නොතිබූ දේවස්ථානයක් විය. මීසම් සභාවේදී ආ යෝජනාවක් මත නවක පියතුමන් වන ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමන් මෙම දැවැන්ත දේවස්ථානය ප්‍රතිසංස්කරණය කළ යුතු බව පිළිගෙන ඒ සඳහා එකඟවීය. නමුත් නායකකන්ද වැනි දැවැන්ත දෙව්මැඳුරක් ප්‍රතිසංස්කරණය කර නව මුහුණුවරක් ලබා දීම එතරම් පහසු කටයුත්තක් නොවේ ඒ සඳහා දැවැන්ත මුදලක් වැය වන බව ද නොරහසකි. එය සෙවීමද එතරම් පහසු කටයුත්තක් නොවේ. මෙහිදී මීසම් සේවක ගරු මහේන්ද්‍ර පියතුමන්ගේ දර්ශනය වූයේ පළමුව මීසමේ සියලු සමිති සමාගම් හා සංඝ එක්රැස්කර එකමුතු කළ යුතු බවයි. එවිට එහි දෙවන අදියර වන දෙව්මැඳුර පිළිසකර කිරීමට අවශ්‍ය කරන දැවැන්ත මුදල් සම්භාරය සෙවීම අපහසුවක් නොවන බවයි.

### ලක්ෂ 320 ක ඉලක්කයක්

දෙව්මැඳුරේ ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කර නිම කිරීම සඳහා අවශ්‍ය වූ මුළු මුදල ලක්ෂ 320 ක් පමණ විය. එවැනි විශාල මුදලක් සොයා ගැනීම එතරම් පහසු කටයුත්තක් ද නොවේ. නව මීසම් සේවක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමා මෙහිදී අවධානය යොමු කළ කාරණා කිහිපයක් වෙයි. එනම් දෙව්මැඳුර ප්‍රතිසංස්කරණය කිරීමට පෙර කොට්ඨාශ ප්‍රතිසංවිධානය කර ශක්තිමත් කිරීමයි. එලෙසම සමිති සමාගම් ද නැවත ශක්තිමත් කිරීම මෙම දැවැන්ත කාර්යයට රුකුලක් බව එතුමන්ට පෙනී ගියේය. එලෙසින්ම මෙවැනි විශාල මුදල් ප්‍රමාණයක් සොයා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රම වේදය කුමක්දැයි යන්න තීරණය කිරීම එතුමා මුහුණ දුන් මීළඟ අභියෝගය විය. පළමුව මීසමේ පවුල් වෙත ගොස් ඔවුන්ට ලබාදිය හැකි පරිදි මුදල් රැස්කරගැනීම මූලික සැලැස්ම විය. ඉතිරිය සොයා ගැනීම ඉන්පසු ඇති අභියෝගය විය. අවශ්‍ය ඉතිරි මුදල ලක්ෂ 45 ක් විය. ඒ සඳහා තමන් කලින් සේවය කළ කඳාන මීසමේ කළ අරමුදල් රැස්කිරීමක අත්දැකීම මේ අවස්ථාවේ එතුමාගේ සිහියට නැගිණි. එනම් දැවැන්ත ජුබිලි පොළක් හා පා ගමනක් සංවිධානය කර ඒ තුළින් අවශ්‍ය කරන මුදල් සොයා ගැනීමයි. නමුත් ඒ සා විශාල පොළක් සංවිධානය ලෙහෙසි පහසු කටයුත්තක් නොවීය. මෙවැනි දැවැන්ත මුදලක් සෙවීම සඳහා සංවිධානය කරනු ලබන දැවැන්ත පොල සාර්ථක වුවහොත් හොඳය. නමුත් යම් හෙයකින් එය අසාර්ථක වුවහොත් තවත් පාඩුවක් පමණක් නොව සියලු දෙනාගේම දෝෂාරෝපණය ද ලැබෙන බව නියත කරුණක් විය. ඒ නිසා ඉතා සැලසුම් සහගතව සංවිධානාත්මකව හා නිවැරදි කළමනාකරණයෙන් යුතුව මෙම දැවැන්ත පොළ පැවැත්විය යුතු විය. ඒ සඳහා මෙහි සංවිධාන කටයුතු නිවැරදි ලෙස කළමනාකරණය කළ හැකි කණ්ඩායමකට මෙය බාරදිය යුතු විය. පියතුමා ඒ සඳහා වඩාත් සුදුසු යැයි කල්පනා කරන ලද්දේ දේවස්ථානයේ අලුතින් පිහිටුවාගනු ලැබූ "තරුණ ක්‍රිස්තියානි පවුල් එකතුව" නම් කණ්ඩායමයි. වසර 15 කට ආසන්න ගණනක් නායකකන්ද "ජුසේවාස් තරුණ සමිතියේ" කටයුතු කර පසුව විවාහ වී එම කටයුතු වලින් ඈත්ව සිටි තරුණ විවාහක පවුල් 14 ක පමණ සාමාජික සාමාජිකාවන් එක් වී මෙම නව සමිතිය පිහිටුවාගෙන තිබුණි. ඇරඹී කෙටි කාලයක් වුවද අදාළ කෙටි කාලය තුළ පියතුමා විසින් ලබාදුන් සියලු බැරෑරුම් කටයුතු ඉතා සාර්ථකව හා මනා කළමනාකාරී ලෙස සිදු කරනු ලැබීම නිසා මෙම කණ්ඩායම පියතුමන්ගේ විශ්වාසය හා අවධානය දිනාගෙන තිබුණි. එ නිසාම "ජුබිලි පොළ" සංවිධාන කටයුතු "තරුණ ක්‍රිස්තියානි පවුල් එකතුවටත්", ජුබිලි පා ගමන සංවිධානය ඒ වන විට මනා සංවිධාන ශක්තියකින් යුත් දේවස්ථානයේ "ජුසේ වාස් තරුණ සමිතියටත්" බාර දෙන ලදි.

### ලාභයට බඩු භාණ්ඩ සෙවූ මෙහෙයුම

මීළඟ කරුණ නම් ජුබිලි පොළ පවත්වන දෙදින පුරාම එයට සහභාගි වී බඩු භාණ්ඩ මිළදී ගන්නා සියල්ලන්ට අවශ්‍ය පරිදි සියලු බඩු භාණ්ඩ එක් රැස්කර අංග සම්පූර්ණ පොළක් පැවැත්වීමයි. ඒ සඳහා එක් එක් කොට්ඨාශයට විවිධ බඩු භාණ්ඩ ලබා දීමට නියමකර ඉලක්කයක් ලබා දෙන ලදි. බොහෝ විට එම ඉලක්කය ලක්ෂය හෝ ලක්ෂ එකහමාරක් පමණ විය. පියතුමාගේ හා තරුණ පවුල් ව්‍යාපාරයේ දැනුවත් කිරීම හා මෙහෙයවීම මත සියලු කොට්ඨාශවල කොට්ඨාශ නායකයින් තමන්ගේ කොට්ඨාශවල සාමාජිකයන් සමඟ ගෙයින් ගෙට ගොස් අදාළ ඉලක්කය සපුරා ගැනීම සඳහා දිවා රෑ නොබලා දැඩි සේ වෙහෙස මහන්සි වී වැඩ කළහ. ඇතැමෙක් වරින් වර අධෛර්යයට පත් වුවත් පියතුමාගේ හා සංවිධායක කණ්ඩායමේ මඟ පෙන්වීමත් උපදෙසුත් මත ඔවුන් නැවතත් සිය ඉලක්ක කරා කැපවී වැඩ කළහ. දේවස්ථානයේ සමිති සමාගම් සියල්ලට ද මෙලෙසින්ම ඉලක්ක ලබා දී තිබුණි. ඔවුන්ද දිවා රෑ නොබලා ඉලක්ක සපුරා ගැනීමෙහිලා වෙහෙස විය. ජුබිලි පොළ සඳහා වෙළෙඳ කුටි 60කට වැඩි ගණනක් පිහිටුවීම ඉලක්කය විය. ඒ කුටි අතර, හාල්, පොල්, එළවළු, පළතුරු, සබන්, කිරිපිටි, ආහාර පාන, තුනපහ, සීනි, ඇඳුම් පැළඳුම්, ටින් කෑම, කොළ කැඳ, ක්ෂණික ආහාර, විසිතුරු බඩු, ඉලෙක්ට්‍රොනික් බඩු, සෙල්ලම්බඩු වැනි භාණ්ඩ වර්ග විශාල ප්‍රමාණයක් විය. එලෙසම එම පොළ භූමියේම සැණකෙළියක් සහ සංගීත සන්ධ්‍යාවක් ද විය. මේ සියල්ල එක් වූ විට එය මෙතෙක් හැඳල ප්‍රදේශයේ පැවැත්වූ අති දැවැන්තම පොළ බවට පත් වූයේ නිතැතින්ය. පොළට ඉතා ලාභයට බඩු එකතු කිරීම සඳහා හාල් සොයා මරදගහමුල, පොළොන්නරුව වැනි ප්‍රදේශවලටත්, ලාබයට පොල් සොයා කුරුණෑගල, පුත්තලම වැනි ප්‍රදේශවලටත්, එළවළු සොයා නුවරඑළිය එළවළු වගා භූමි වලටත් සහායක පියතුමන්ලා ප්‍රමුඛ අපේ සාමාජිකයන් යනු දක්නට හැකිවිය. මෙම ජුබිලි පොළ සාර්ථක කරගැනීම පිටුපස සිටිමින් ඉතා විශාල වෙහෙස මහන්සියක් වූ එක් අයෙකු වන්නේ මීසම් සහයක පිය නිර්මාල් මාලක පියතුමාය. උන් වහන්සේ අප වෙනුවෙන් ලාබයට පොල් සොයා කුරුණෑගල ගිය අවස්ථාවේ පොල් ගෝනි පවා කරගසා වාහන වලට පැටවූ බව මෙය කියවන අවස්ථාව වන විටත් බොහෝ දෙනා නොදන්නා රහසකි. ඇත්තෙන්ම නායකකන්ද ජනතාව නිර්මාල් මාලක පියතුමා කළ කැපවීම් වෙනුවෙන් ණය ගැතිය. ශිරාන් දසා පියතුමා ද දහම් පාසල හා සමිති සමාගම් සමඟ එක් වී දිවා රෑ නොබලා මේ වෙනුවෙන් වෙහෙසීය. එය මුළු මීසමටම ජවය සැපයීමක් විය.

### හේද නොමැතිව මුළු මීසමම එකම පවුලක් වීම

නායකකන්ද මීසම, සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යය තුනටම අයත් ජනතාව විශාල ප්‍රමාණයකින් සමන්විතය. නමුත් කිසිදාක ඔවුන් එකිනෙකා එකට එක් වී සහයෝගයෙන් කටයුතු කළ දිනයක් මාගේ මතකයේ නැත. නමුත් "ජුබිලි පොළ" නිසා මෙම සියලු දෙනා එකිනෙකා හා කටයුතු කරන්නට විය. එකිනෙකා හඳුනා ගන්නට ද විය. එකමුතුව දිවා රෑ නොබලා, සිය ජාති, භාෂා හේද නොබලා කටයුතු කළහ. සිංහල අපි ද්‍රවිඩ සංඝයේ ජනයාගෙන් "අන්නා තෝසයක් දෙන්න.., වඩයක් දෙන්න..කියා තෝස, වඩේ ඉල්ලාගෙන කෑහ." ඔවුන්ද "මල්ලී... අපිට තව පොල් ඕනේ.., හාල් ඉවරයි තව හාල් තියෙනවද ?..." යනුවෙන් වෙන කවරදාවත් නැති විදිහට සිංහල ජනයා සමඟ එක්වී සහයෝගයෙන් කටයුතු කරන්නට විය. ඉංග්‍රීසි ගායනා කණ්ඩායම, ඉංග්‍රීසි තරුණ සමිතිය වෙනදාටත් වැඩියෙන් සිංහල, දෙමළ සොයුරන් සමඟ එකට එක්වී සහයෝගයෙන් කටයුතු කළහ. නායකකන්ද සැබෑවටම මීසම් පවුලක් වූයේ එදින ය.

### එක්වීමෙන්, කැපවීමෙන් ලද ජයග්‍රහණය

ආයතනවල කළමනාකරුවන්, විධායක නිලධාරීන් පවා හාල්මුට්ට, පොල් ගෝනි, එළවළු ගෝනි කරගැසූහ. කොට්ඨාශවල, සමිතිවල තරුණ තරුණියන් රෑ පුරා නිදි වරමින්, සීනි, පරිප්පු, කරවල, තේකොළ වැනි දේ පැකට් කිරීමේ හා මිල සටහන් කිරීමෙහි යෙදුනි. ඇතැම් හූ සිය දූ දරුවන්ද කැටිව විත් මීසම් ශාලාවේ කෙරෙන වැඩ කටයුතු සඳහා පවුල් පිටින් සහයෝගය දුන්හ. තමන්ගේ ගෙවල් වලින් කෑම බීම එවූ අයද සිටියහග අවශ්‍යපරිදි පියතුමාද කුමක් හෝ දෙයක් කෑමට බීමට ලබාදුන්හ. රෑ එළි වෙනතෙක් වැඩ කිරීමෙන් වෙහෙස මහන්සි වූ ඇතැමෙක් මීසම් ශාලාවේම බිම පැදුරක් එලාගෙන නිදා ගත්හ. කොට්ඨාශවල ජනතාව එක්වී කඩවල්වල, වෙළෙඳ කුටිවල බඩු විකුණූහ. දේවස්ථානය අවට සිටි ත්‍රීරෝද රථ රියදුරන් ජුබිලි පොල පැවැත්වෙන දෙදින පුරා ස්වේච්ඡාවෙන්ම දේවස්ථානයට ආධාර පිණිස සිය ත්‍රීරෝද රථ ධාවනයෙන් ලැබෙන මුදල දේවස්ථානයට ප්‍රධානය කළහ. ඒ අතර කිතුනු පමනක් නොව බොදුනු ත්‍රීරෝද රථ රියදුරන්ද විය. බෞද්ධ, හින්ද, මුස්ලිම් හේදයක් නොමැතිව බොහෝ දෙනා මුදලින්ද, ශ්‍රමයෙන්ද, බඩු භාණ්ඩවලින්ද සිය නොමසුරු දායකත්වය සැපයීය.

### පරීක්ෂාවන් හා විශ්වාසය

පොලේ මුල් අදියර ආරම්භ කිරීමට පෙර පියවරුන් සමඟ සංවිධාන කණ්ඩායම යාච්ඤාවේ යෙදී දෙවියන්ගේ පිහිට පැතූහ. සියල්ල යහපත් ලෙස සිදුවෙද්දී දෙවියන් එකවරම අප විශ්වාසය පරීක්ෂා කරන අවස්ථාවක් ද උදා විය. එනම් ජුබිලි පොල හා පාගමන ආරම්භක දින උදෑසන එකවරම ධාරානිපාත වර්ෂාවක් ඇදහැලෙන්නට විය. සංවිධායක මණ්ඩලය ප්‍රමුඛ සියලු දෙනා කලබල වී බලාපොරොත්තු භංග වූ මුහුණු වලින් විය. නමුත් විශ්වාසය පෙරදැරි කරගත් කිහිප දෙනකු දෙව් මවුන්ගේ ප්‍රතිමාවක් මීසම් ගෘහ ඉදිරිපිට තබා කුඩයක් ඉහළවා බාර විය. සියල්ලෝම ඒ අනුව යාච්ඤාවට එක් වූහ. විනාඩි කිහිපයකින් ධාරානිපාත වර්ෂාව පහවිය. එම යහපත් කාලගුණය ජුබිලි පොළ පැවැත්වූ දින දෙක අවසන් වී දෙව් මවුන්ගේ ප්‍රතිමාව ඉවත් කරන තුරුම පැවතීම අතිශය විශ්මිතය.

### සමස්ත කිතුනු ජනයාටම ආදර්ශයක්

ලක්ෂ 45 ක ඉලක්කයක් වෙනුවෙන් නායකකන්ද මීසමේ ජනයාගේ එකමුතුවීමේ අවසානය වූයේ ලක්ෂ 60 කට අධික මුදලක් සොයා ගැනීමට හැකිවීමයි. ජුබිලි නිසා ගහබැණ ගනිමින්, මතභේද ඇතිකරගෙන බෙදී වෙන් වී, විරසක වී, දෙව්මැඳුරු පවා වසන්නට සිදුවී ඇති යුගයක ගරු මහේන්ද්‍ර පියතුමාගේ මඟ පෙන්වීමෙන් ආගම්, ජාති, භාෂා හේද ඉවතලා නායකකන්ද මීසමේ ජනතාව පෙන් වූ, කැපවීම, එකමුතුකම සමස්ත ශ්‍රී ලංකා වාසී කතෝලික ජනතාවටම මා හැඟි පාඩමකි. ජුබිලියක් යනු බෙදී වෙන් වී ඇණකොටා ගැනීම නොව, එක්වී, කැපවී, වැයවී, ඉලක්ක ජය ගැනීමය. කිතු සමිඳුන්ව ජීවමාන කිරීමය යන්න නායකකන්දට පෙන්වීමට අවස්ථාව උදාවිය.

නායකකන්ද වැනි අති දැවැන්ත මීසමක, විවිධ ජන වර්ග වෙසෙන, භාෂා කිහිපයක් කතා කරන කිතුනුවන් වෙසෙන මීසමක ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමා කළ වෙනස සමස්ත කිතුනු වර්ගයාටම පාඩමකි. අද වන විට එකමුතු වී, අවදි වී, නැගිට සිටීම තුළින් පැරණි පෙනුමකින් යුතු වූ ඉපැරණි නායකකන්ද දෙව්මැඳුර ඉතා අලංකාර නව පෙනුමකින් සාඩම්බරව නැගී සිටිනු දැකීමම සතුටට කරුණකි.


ලක්ෂ 45 කට 55කටත් වඩා අතිශයින්ම වටිනා එකමුතුකම, සහයෝගය, කැපවීම, රැකගැනීම මින්පසු නායකකන්ද කිතුනු ජනතාවගේ වගකීම වේ.

එසේම දැන් නායකකන්දට ඇති විශාලම අභියෝගය මූලධර්මවාදීන්ගේ ආක්‍රමණයයි. එයද කොට්ඨාශ මට්ටමින් සංවිධානය වී, විධිමත්ව, සැලසුම් සහගතව ජයගත හැකි ක්‍රමයකට යෑමට ගරු මහේන්ද්‍ර ගුණතිලක පියතුමාට ශක්තිය ලැබේවායි අපි පතමු.

**150 වැනි සිය ජුබිලි මංගල්‍යය එකමුතුවෙන් හා අභිමානයෙන් සමරන නායකකන්ද මීසමේ කිතුනු සංඝයට ශුභාංශිංසන!**

**තිළිණ අලහකෝන්**

## මෝදර ජුසේ වාස් සංඝයේ රජත ජයන්තිය



මොරටුව කටුකුරුන්ද මීසමට අයත් මෝදර මේ දේවස්ථාන භූමිය අයත් වන්නේ "මහවත්ත" නමින් හැඳින්වුණු අක්කර 40 ක් පමණ වූ පොල් වත්තකටය. එම වත්තෙන් දේවස්ථානය සඳහා පර්චස් 90 ක පමණ භූමි ප්‍රදේශයක් මිලදී ග ැනීමට කටයුතු කළේ එවකට කටුකුරුන්ද කොරළවැල්ල මීසම් සේවකව සිටි ගරු සිරිල් පෙරේරා පියතුමාය. ඒ සඳහා ප්‍රතිපාදන සැලසුනේ කටුරුන්ද දේවස්ථාන ගිණුමෙන් හා අගරදගුරු නිවසෙනි.

1980 දශකය ආරම්භයේ නව ගාලුපාරේ වැඩකටයුතු ඇරඹීමත් සමගම මෙම දේවස්ථානය පිළිබඳ බලාපොරොත්තුවත් පෙරදැරි කරගෙන, විශේෂයෙන් මොරටු ගම් 18 න්ම කිතුනු ජනතාව මෙම ප්‍රදේශයේ ඉඩම් මිලදී ගනිමින් නිවෙස් ඉදිකිරීමට පටන් ගත්හ.

විවිධ බාධක මධ්‍යයේ 1984 වර්ෂයේ දේවස්ථාන භූමිය වටකොට අඩි 10 ක් පමණ උස තාප්පයක් ගොඩනැගීම ආරම්භ වූ අතර අතරමගදී මතුවූ නොයෙකුත් විරෝධතා නිසා එහි වැඩකටයුතු නවතා දැමීමට සිදුවිය. 1985 වර්ෂයේ "ජුසේ වාස් සේවා මධ්‍යස්ථානය" ලෙස අප පරණ පල්ලිය ලෙස හඳුන්වන ගොඩනැගිල්ල සඳහා මුල්ගල තැබුණේ එවකට කොළඹ කලාපීය නාහිමි අතිගරු රේමන්ඩ් පීරිස් නාහිමිපාණන් අතිනි.

ගරු බෙනඩික් ජයතිලක පිය සමයේ 1986 සැප්තැම්බර් මස 14 දින එවකට මොරටුව පාර්ලිමේන්තු මන්ත්‍රී විදේශකටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය ටිරෝන් ප්‍රනාන්දු මහතා ජුසේවාස් සේවා මධ්‍යස්ථානය විවෘත කළ අතර සහයක රදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් විසින් එය ආසිරි ගන්වන ලදී.

මෙතැන් සිට සෑම ඉරුදිනකම මේ ගොඩනැගිල්ලේ දිව්‍ය පූජාව හා දහම් පාසල පැවැත්වුණ අතර ණය මංගල්‍ය දිනයන්හිදි දිව්‍ය පූජාව පැවැත්වුණි. එවකට කොරළවැල්ල කන්‍යාරාමයේ විසූ ගරු දයාදූතික පැවිදි සොහොයුරියෝ මෙම ප්‍රදේශයේ පවුල් බැහැදැකීම, දිව්‍ය සත්ප්‍රසාදය දානය කිරීම, දහම් පාසල් ආදී කටයුතු සඳහා කැපවෙමින් ගරු පියතුමාට සහය දැක්වූහ.

ගරු ට්‍රෙවෝ මාටින් පියතුමා මීසම් සේවකව සිටි 1987 නොවැම්බර් මස 22 වන දින ක්‍රිස්තු රජාණන්ගේ මංගල්‍යය මෙහි පැවැත්වූ ප්‍රථම මංගල්‍යය විය. ගරු ට්‍රෙවෝ මාටින් පියතුමාගෙන් පසු මීසමේ සේවයට පැමිණි ගරු මහේෂ් ගනේමුල්ල, සහ ගරු සේසිරි ලෙනාඩ් පියවරුන් යටතේ මෙම කුඩා දෙව්මැඳුර හා දහම් පාසල තව තවත් දියුණුවට පත්වූ අතර මංගල්‍යය වාර්ෂිකව පවත්වන ලදී. 1995 වර්ෂයේ ජුසේවාස් පියතුමන් භාග්‍යවරට එසවීමෙන් පසු වාර්ෂික මංගල්‍ය වූයේ භාග්‍යවන්ත ජුසේවාස් පියතුමාගේ මංගල්‍යයි. අද දක්වාම වාර්ෂිකව මේ මංගල්‍යය පැවැත්වේ.

1996 මාර්තු මස 15 වන දින ගරු අන්දරේ ඩිඩෝන් (නි.ම.නි.) මීසම් සේවක පියතුමන් විසින් මෙම ගොඩනැගිල්ලට යාබදව නව දෙව්මැඳුරක් සඳහා මුල්ගල තබන ලදී. මේ දේවස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා මොරටු පුරවරයේ හා ඉන් පිටත සැදැහැවත් ජනතාව ද්‍රව්‍ය, ශ්‍රමය, මුදල් ආදී නොයෙක් අයුරින් ආධාර දුන් අතර සමහර කටයුතු සම්පූර්ණ වශයෙන් ඉටුකර දීමට භාර ගති. කටුකුරුන්ද මීසමේ සේවයට පැමිණි ගරු ශ්‍රීකාන්ත ප්‍රනාන්දු, ගරු මේරියස් ප්‍රනාන්දු, ගරු ජූඩ් ලක්ෂ්මන් යන පියවරුන් යටතේ පියවරෙන් පියවර ගොඩනැගුනු දේවස්ථානය ගරු ජූඩ් ලක්ෂ්මන් පියතුමා 2004 පෙබරවාරි මස 01 වනදා ආශිර්වාද කර විවෘත කරන ලද්දේ එවකට අගරදගුරු අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් හිමිපාණන් අතිනි. දේවස්ථානය විවෘත කිරීමෙන් පසු මීසමේ සේවය කළ ගරු සමන්ත කුරේරා සහ දැනට අප දේවස්ථානයේ මීසම් සේවක ගරු ක්‍රිෂන්තස් ප්‍රනාන්දු (නි.ම.නි.) පියවරු දේවස්ථානය තව තවත් අලංකාර කිරීමට බොහෝ වෙහෙස මහන්සිවූහ.

මේ කෙටි කාලය තුළ අප ග්‍රාමයෙන් පූජක පුතෙකු බිහිවීම ඉතිහාසයට එක්විය යුතුමය. ගරු උදාර ලක්ප්‍රිය ධර්මරත්න (නි.ම.නි.) පියතුමා 2011 වසරේ පූජකවරය ලැබීය. මේ කිතුනු සංඝයේ 25 වන රජත ජයන්ති උත්සවය පෙබරවාරි 11-12 දිනවලදී පැවැත්වේ.

**(නිර්මලා කාන්ති සහ ශ්‍රී කාන්ති අබේරත්න)**

## මීගමුව තිල්ලන්දූවේදී...

8 පිටුවෙන්

වශයෙන් පැමිණියේ මීසම් වාසී අප සැම දෙනාම මවිත කරවමිනි. මීසමට අලුතෙන් පියතුමකු ලැබීම පිළිබඳව ඇසූ මීසම් වාසී අප සැම දෙනාම එදා අතිශයින්ම සතුටට පත්වීමු. ඉතාමත් ප්‍රියමනාප, ප්‍රසන්න පෙනුමකින් සහ ශාන්ත කතා විලාශයකින් යුතු පියතුමා දුටු මීසම් වාසී අපි, අපට පියතුමකු ලැබීම පිළිබඳ විශාල සතුටක් ලැබුවද, තිල්ලන්දූව මීසමේ ඇති අභියෝග හමුවේ මෙතුමා කෙසේ ඒවාට මුහුණ දෙනු ඇද්ද? යන පැනයත් කොපමණ කලක් මෙතුමා මෙහි රැඳී සිටිවීද? යන පැනයත් අප කා තුළත් ඇති වී තිබුණ බව නම් අවංකවම කිව යුතුය.

අපගේ මීසමට පැමිණි ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමාට සිදුවූ පළමුවන අභියෝගය වූයේ නවාතැන් ගැනීමට දේවස්ථානයේ මීසම් ගෘහයක් නොමැති වීමයි. ගරු අබා කොස්තා පියතුමා ඝාතනය කළ මීසම් ගෘහය ඒ වන විටත් වසා දමා තිබුණ අතර ඝාතනය පිළිබඳ පොලිස් පරීක්ෂණ ද අවසන් වී නොතිබුණි. එමෙන්ම ලේ තැවරුණ මීසම් ගෘහය තුළ පියතුමකුට තනිව වාසය කිරීමට ද හැකියාවක් නැත. එහෙත් එතුමා පසු බැස්සේ නැත. මීසමේ ජනතාව එක්රැස් කළේය. පවතින තත්ත්වය පිළිබඳව සාකච්ඡා කළේය. ගරු අබා කොස්තා පියතුමා ඝාතනය වී දේවස්ථානය පාළු වී යාම පමණක් නොව මෙහි ලබන වසරේ දී සියවස් ජුබිලියක් සැමරීමට ද ඇති බව එතුමා දැනගත්තේ එම මීසම් ජනතාව සමඟ කළ සාකච්ඡාවේ දී යැයි බොහෝ දෙනකුට අවබෝධ විය.

නවාතැන් ප්‍රශ්නයට පිළියමක් එතුමාම සොයා ගත්තේය. දේවස්ථානයේ පුස්තකාලයට වෙන්කර තිබූ කාමරය සහ "සන්ක්‍රිස්තියන්"ගේ කාමරය එතුමාගේ තාවකාලික නවාතැන්පොළ විය. පිරිමි මීසම් වාසීන් එක්වී කණ්ඩායම් වලට බෙදී රාත්‍රි කාලයට දේවස්ථානය මුර කිරීම ආරම්භ කළේය. රාත්‍රියට මුහුණ වසා කළු ඇඳුම් ඇඳගත් පුද්ගලයින් දේවස්ථානය අවට ගැවසෙන බවට කටකතා පැතිර ගොස් තිබුණ අතර පියතුමකු ඝාතනය වූ දේවස්ථානයක් නිසා අළුතෙන් පත්ව ආ පියතුමා ආරක්ෂා කරගත යුතු බවට මීසම් වාසීහු දැඩිව විශ්වාස කළහ.

ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු පියතුමා දැඩි අධිෂ්ඨාන ශක්තියෙන් යුතුව ඕනෑම අභියෝගයක් ජයගත හැකි ආධ්‍යාත්මික ශක්තියකින් හෙබි පෞරුෂයක් හිමි අයකු බවට එතුමා ක්‍රියාවෙන්ම තහවුරු කර පෙන්වූයේය.

අධ්‍යාත්මිකව සහ මානසිකව ඇද වැටුන ජනතාවක් බවට පත්ව සිටි මීසම් වාසීන් නැවත අවදිකර වන්නට එතුමා දිවා රෑ නොබලා වැඩ කළේය. අබා කොස්තා පියතුමා මිය යන විට නතර වී තිබුණ තැන සිට ඉදිරියට ජුබිලි උත්සවය කිසිදු අඩුපාඩුවකින් තොරව නියමිත දිනයට පවත්වන්නට අවශ්‍ය සියලුම කටයුතු එතුමා සංවිධානය කළේය. එම කටයුතු සම්පාදනයේ දී එවකට කලාපීය අනුනාහිමි වශයෙන් කටයුතු කළ කෘතහස්ත පියතුමකු වූ සගසුව දිනූ ගරු ජෝ වික්‍රමසිංහ අනුනාහිමියන් සමඟ සහ එවකට අගරදගුරු පදවිය දැරූ අති උතුම් ඔස්වල්ඩ් ගෝමිස් අගරදගුරුතුමන් සමඟ නිරන්තර සංනිවේදන සබඳතා පවත්වාගෙන යාමට සහ අවශ්‍ය උපදෙස් සහ සහයෝගයන් ලබා ගැනීමටත් එතුමා පියවර ගත්තේය. දේවස්ථානය පිළිසකර කොට අබා කොස්තා සමරු මණ්ඩපයක් ද ඉදිකර වූයේය. ශ්‍රමදාන මඟින් දේවස්ථාන භූමිය අලංකාර කරවූයේය. අන්ත දුගියාගේ සිට ඉහළම පොහොසතා දක්වාත්, මන්දබුද්ධිකයාගේ සිට ඉහළම උගතා දක්වාත්, අහිංසකයාගේ සිට දාමරික චණ්ඩියා දක්වාත් ආදි වශයෙන් වූ මීසමේ සියලුම පැතිකඩයන් එකට එකතු කරවාගෙන හැම දෙනෙක් සමඟම සුහදව කටයුතු සම්පාදනය කරන්නට එතුමා පියවර ගත්තේය. එය එතුමාටම විශේෂ වූ සුවිශේෂී හැකියාවක් බවට අපි අත්දැක්කෙමු. මෙම සියළුම කරුණු තුළින් අප දුටුවේ එතුමාගේ වූ සමාජ අත්දැකීම් බහුල බව සහ ප්‍රවීන බවයි. සුවිශේෂී බුද්ධිමත් බව සහ නිහතමානී බවයි.

එතුමා සැම කෙනකුටම කරුණාවන්ත ලෙස ඇමතීමට හැකියාවක් ඇති මනා සංයමයකින් යුතු කාරුණික පුද්ගලයෙකි. බොහෝ විට එතුමාගේ මෙම නිරහංකාර පැවැත්ම නිසා සැමටම එතුමා ප්‍රියමනාප පුද්ගලයකු විය. තරුණයින් සහ ළමයින් එක්රැස්කොට විවිධ ශ්‍රමදාන පැවැත්වීමට ක්‍රියාකිරීම තුළින් දේවස්ථානයට නව ජීවයක් ලබා දීමට එතුමා සමත් වූ බව කිව යුතුය. එතුමාගේ මෙම ප්‍රියමනාප හැසිරීම නිසාම බොහෝ දෙනකු එතුමා හඳුන්වමින් කීවේ, **"අබා ගියපසු බබා ආවා"** යනුවෙනි.

ඒ තරමටම මීසම් වාසීනට ප්‍රියමනාප පියතුමකු වූ නිසාමය. අභියෝග හමුවේ නොසැලීම සහ අවස්ථාවට උචිත පරිදි තීන්දු තීරණ ගෙන ක්‍රියා කිරීමට ඇති සහජ හැකියාව අප එතුමාගේ චරිතාපදානය තුළින් අත්දුටු සුවිශේෂීම ලක්ෂණයයි.

එතුමා සහයක රදගුරුවරයකු ලෙස පත් වූ බවට දැනගත් තිල්ලන්දූව මීසම්වාසී අපි සියලු දෙනාම අතිශයින්ම සතුටට පත් වූයෙමු. මන්දයත්, එතුමා තනතුර නිසා බැබළෙන පුද්ගලයකු නොව එතුමා නිසා තනතුර බැබළෙන ලෙස ක්‍රියා කිරීමට හැකියාවක් ඇති කෘතහස්ත පුද්ගලයකු බව අප සැමදෙන අත්දැකීමෙන්ම දන්නා නිසාය. එපමණක් ද නොව අඳුරු අතීතයක් සහිත වූ තිල්ලන්දූව මීසම්වාසී අපට සතුටුවීමට තවත් අමතර කරුණක් ද අද දිනයේ ඇතිබව අප ආඩම්බරයෙන් සිහිපත් කරමු. එනම් වත්මන් අති උතුම් කාදිනල් තුමාද, එම්මානුවෙල් ප්‍රනාන්දු නව රදගුරුතුමා ද, අපගේ වත්මන් මීසම් සේවක ගරු ඇතනේෂියස් සමරසිංහ පියතුමා ද පුංචි දෙව්සත්හලේ සිට ජාතික දෙව්සත්හලට 1966 වර්ෂයේ ඇතුළු වූ කණ්ඩායමේ සමකාලීනයන් බව දැනගන්නට ලැබීම සතුටට කරුණකි.

නව සහයක රදගුරු ලෙස පත්වූ ගරු එම්මානුවෙල් ප්‍රනාන්දු නව රදගුරු තුමනට අපි සුබාසිංසන පිරිනමන්නෙමු. දෙව් ආසිරි පතමු. එතුමා නිදුක් නිරෝගීව දිගුකල් දිනෙත්වා!

## චිරං ජයතු ...

6 පිටුවෙන්

මොරටු මීසමේ ද බොහෝ දෙනා එයට ගොදුරු වූහ. දුකට, වේදනාවට, අසරණ බවට මුහුණ දුන් බැටළුවන්ට එතුමා සැබෑ එඬේරකු විය. අනාථ කඳවුරු තුළ සිටි ජනතාවගේ ශාරීරික හා ආධ්‍යාත්මික ජීවිත ගොඩනගන්නට එතුමා මූලික වූ අතර පරිත්‍යාගශීලි මොරටු ජනතාව එතුමාගේ දෑත් ශක්තිමත් කළහ. සෙත් සරණ ආයතනය හරහා මොරටුවේ ඉදිවූ අගරදගුරු නිකලස් මාකස් නිවාස සංකීර්ණය ඒ බවට මනාව සාක්ෂි සපයයි.

අවසන් කොට නව සහයක රදගුරු හිමිපාණෙනි, ශු. පාවුළු තුමන්ගේ වදන් ප්‍රකාර දෙවියන්වහන්සේ ඔබ තුළ යහපත් කාර්යයක් ආරම්භ කර ඇත. එය දේව මහිමය වෙනුවෙන් ඔබතුමා යහපත් ලෙස ඉටු කරනු ඇතැයි අපි විශ්වාස කරමු. ඒ වෙනුවෙන් අපි දෙවිඳුන් යදින්නෙමු.

**"ඔබ ශක්තිමත් කළාවූද, උන්වහන්සේගේ සේවයට පත් කිරීමට තරම් ඔබ ඇදහිලිවන්ත යැයි සැලකුවාවූද ක්‍රිස්තුන් වහන්සේට අපි ස්තුති කරමු."** ( 1 තිමෝති 12)

## 8 වසරක සිහිකිරීමයි

## ඇනී මඩප්පුලි

මෙම මස 09 වන දිනට ඔබ තුමිය අපගෙන් ඈත්ව අවුරුදු 8 ක් සම්පූර්ණ වන විට ඉමහත් බැතියෙන් හා කෘතඥතාවයෙන් මෑණියනි අපි ඔබ සිහිකරන්නෙමු.

කාලයත් සමග ජීවිතා බෝධයෙන් වැඩි දියුණුවත්ම දෙමාපියන් වෙත අපගේ ණයගැති බව කොතරම්දැයි වටහා ගනිමින් සිටින්නෙමු.

එම හැඟීමෙන්ම සමිඳුන් දෑතට ඔබ තුමිය නැවත නැවතත් භාර කරමින් උන්වහන්සේ තුළ සදා සැනසීම පතන්නෙමු.

**නෝබට් අන්ද්‍රාදි**
**නි.ම.නි. රදගුරු තුමන් ඇතුළු අදරැති පුතුන් හා ඥාතීන්.**

## අවමංගල්‍ය ස්තුති කිරීමයි



**ලැටී ලිලියන් (මොරින්) පීරිස්**

අප මෑණියන්ගේ අවමංගල්‍යයට සහභාගි වී වේදනාව සමනය කිරීමට පැමිණි රදගුරුතුමනට, පූජක පැවදි හා සියලු ඥාති මිත්‍රාදීන්ට ස්තුතිය ප්‍රකාශ කරමු. පෞද්ගලිකව එය ඉටුකරන්නට නොහැකිවීම ගැන කණගාටුව පළ කරමු.

ගරු එල්මෝ රාජ් පියතුමා ඇතුළු දරු කැල



**වැලිවිට ශා. මරියා දේවස්ථානයට අනුබද්ධිත "වැලිවිට වැඩිහිටි සංගමයේ" මෙහෙයවීමෙන් වැලිවිට සා. මරියා විදුහල් ශාලාවේ දී දෙවන වරටත් "නත්තල් ගී දැහැන" නත්තල් කැරොල් ප්‍රසංගය වැලිවිට මීසම් සේවක ගරු එල්මෝ රාජ් ප්‍රනාන්දු පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් එළිදැක්වූ මොහොත**

සංගමයේ ප්‍රධාන සංවිධායක ඩී. ඒ. සුමිත්‍රආරච්චි මහතා ප්‍රමුඛ ගායන හවුල නත්තල් කැරොල් ගීයක් ඉදිරිපත් කළ අයුරු. ගරු සභාපති එම්. සිරිසේන මහතා ද මේ අවස්ථාවට සහභාගි විය. (එම්. ජෝ. පාරිස්)

## හැඳල - කෙරවලපිටියේදී ...

9 පිටුවෙන්

මහඟු දක්ෂතාවයකි. අප දේවස්ථාන භූමිය අද අලංකාර තුරු ලතා වලින් පිරි භූමියක්ව ඇත්තේ එතුමාගේ ස්පර්ශයෙන් සැදුනු නිසාය. අද විශාල වූ මෙම ගස් එක්තරා කුඩා අවදියක දී දිනක් පියතුමා සමඟ එක්ව ඒවාට පොහොර දමන අවස්ථාවක දී පියතුමා කීවේ "පුතා අපි මේ හිටවන ගස් සාත්තු කරලා බලාගන්න. ගස් ලොකු වන විට මම මෙහෙ නැති වෙයි. ඔබලාත් ලොකු වී ළමයිනුත් ඉදීවි. අපි මේ අමාරු ටික අව්වේ ඉඳන් අමාරුවෙන් හෝ කළාට කමක් නෑ මොකද පුතාලගේ ළමයින් කවදා හරි මේ හෙවනේ කරදරයක් නැතිව සෙල්ලම් කරාවි" යනුවෙනි. අති උතුම් රදගුරු හිමිපාණෙනි, ඔබවහන්සේගේ එම වදන් අද යථාර්ථයක් බවට පත්වී ඇත. සැබවින්ම ඔබවහන්සේ ඒ ගස්වලට වඩා අපවත් ආදරයෙන් හදා වඩා ඇත. අප ද අද ඒ ගස්මෙන් උස් මහත් වී ඇත. වැඩිහිටියන් වී ඇත. අපගේ දරුවන් ද එම ගස් සෙවනේ පහස ලබනවා ඇත. එදා මෙන්ම අදත් ඔබවහන්සේ සමඟ ගත කළ එම කාලය නිරන්තරයෙන් අපගේ මතකයට එන්නේය. අප දේවස්ථානයේ මේ ලස්සන පරිසරය ඔබවහන්සේව මතකයට එන්නට තවත් හොඳ සංකේතයක් විය. එසේම අදටත් අප කාටත් දක්නට ඇති ඒ පියකරු සිනාව අමතක කළ නොහැකිය."ෆාදර් මැක්සි" සමඟ අප ගතකළ ඒ කාලය ඉතා වාසනාවන්ත කාලයක් ලෙස සාක්ෂි දරන්නට ඩොමිනික් සාවියෝ පූජා උදව්වන සමිතියේ සිටි පැරණි සාමාජිකයින් සේම තවත් බොහෝ දෙනෙක් එක්වන බවට කිසිම සැකයක් නැත. අතිඋතුම් මැක්ස්වල් සිල්වා රදගුරු හිමිපාණනි! ඔබවහන්සේගේ මෙම පදවි ප්‍රාප්තිය අපි ඔබවහන්සේ සමඟ සිටි දා සිට ඔබවහන්සේ තුළින් අප දුටුවෙමු. එය අපගේ ඇදහිල්ලෙහිද ප්‍රතිඵලයකැයි අප විශ්වාස කරන්නෙමු. ඔබවහන්සේ වැනි දක්ෂ පියතුමන් මෙවැනි පදවියන්ගෙන් පුරවා උන්වහන්සේගේ කෙත තව තවත් සරු කරන්නට තෝරා ගැනීම ගැන අප මහෝත්තම වූ දෙව්පියාණන් වහන්සේට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙමු.



දෙහිඕවිට සා. අන්තෝනි දේවස්ථානයේ වාර්ෂික එකමුතුවේදී දහම් පාසල් දරු දැරියන්ට ත්‍යාග ප්‍රදානය කරන ලදි. එහිදී පොල් තෙල් පහන දල්වා උත්සවය ආරම්භ කළ අයුරු.. දෙහිඕවිට මීසම් සේවක ගරු පියල් ප්‍රනාන්දු පියතුමා, දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායක සෙක්ටස් අර්සකුලරත්න මහතා ද මෙහි වෙති. (ජේ. ඇන්ටනි)

# නාගොඩ දහම් පාසල අලුත් ගමනකට ඇරැඹුමක්!

2012 නව වසරේ කඳාන, නාගොඩ ශු. ස්නාවක ජුවාම් දහම් පාසලේ ආරම්භයට වෙනස් මුහුණුවරක් ගෙන දෙමින්, ඊට දෙසතියකට පෙර මීසම් සේවක ගරු රන්ජන් සිල්වා පියතුමා එක් එක් දහම් ගුරුවරයාට, ගුරුවරියට එතුමන් පෞද්ගලිකව හමු වී දහම් පාසල පිළිබඳව ඔවුන්ගේ අදහස්, යෝජනා හා අඩුපාඩු සාකච්ඡා කිරීමට අවස්ථාව සලසා දුන්නේය.

සෑම වාරයකම නිවාඩු කාලයේ දහම් ගුරුවරුනට ධර්ම විවේක පැවැත්වීමට මීසම් සේවක පියතුමා කටයුතු සූදානම් කර තිබේ. මාසිකව එක් දිනක ගුරුවරුන් විසින් නිවෙසක ශු. පැය බැගින් පැවැත්වීමට තීරණය කැරිණ.

ශිෂ්‍ය නායක නායිකාවන් ගැන සොයා බැලීම, දහම් පාසල් ගායනා කණ්ඩායම ගොඩනැගීම, පැමිණීමේ ලේඛන නිසියාකාරව පවත්වාගෙන යාම හා දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය සඳහා මානව සංවර්ධන වැඩසටහන් පැවැත්වීමට ද කටයුතු යොදා ඇත. (ඩී. ඩී. මේරි රීටා)

# සමාජ මෙහෙවර අගැයුමට ලක්වේ

**දේශපාලන ක්ෂේත්‍රයේ පමණක් නොව, කිතුනු ජනතාව වෙනුවෙන් ද, තමන්ට කළ හැකි සේවාවක් උපරිම අයුරින් ඉටුකිරීමට බැඳී සිටින අය සිටීම, අපට මෙන්ම රටට ද මහත් ආඩම්බරයකි. අද නොයෙකුත් උසස් නිලතල දරණ, තාන්න මාන්න වලින් සපිරි පුද්ගලයන් කොතෙකුත් සිටියත්, ඔවුන්ගෙන් බොහෝ පිරිසකගෙන් සමාජීය මෙහෙවරක් නිසි අයුරින් ඉටුවෙනවා දැයි කීමට නොහැකිය. කිතුනුකම අග යමින් තම ප්‍රදේශය තුළට පමණක් නොව, පොදු ජනතාව වෙනුවෙන් ද අපට කළ හැකි සේවයක් වෙතොත්, එය අප අගය කළ යුතුය. ඉදිරියට ද මෙවැනි සමාජ සේවාවක්**



ජනතාව වෙනුවෙන් ඉටුකිරීමට, දෙවිඳුන්ගේ ආශිර්වාදය මා ප්‍රාර්ථනා කරනවා යයි අති උතුම් මැල්කම් කාදිනල් රංජිත් අගරදගුරු හිමිපාණෝ පැවසූහ.

කාදිනල් හිමි එසේ පැවසුවේ, බොරැල්ල අගරදගුරු නිවසේ පැවති කේ. පී. ඇන්ටනි සිල්වා මහතා විසින් සකස් කරන ලද "ඔබවහන්සේගේ ආශිර්වාදයෙන් සිදුකළ ජනතා මෙහෙවර" යන මැයෙන් සකස් කරන ලද සමරුව අගරදගුරු හිමිපාණන්ට පිළිගැන්වීමේ උලෙළේ දී ය. මේ උලෙළ සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝසප් මයිකල් පෙරේරා, දොස්තර ජයලත් ජයවර්ධන යන මහත්වරුද අතිගරු සිරිල් ගාමිණී ප්‍රනාන්දු, ජූලියන් තිසේරා, අයිවන් පීටර්ස් යන පියවරුන් ඇතුළුව අමුත්තන් කීප දෙනෙක් සහභාගි වූහ. (ඩී. ඇන්සලම් ප්‍රනාන්දු)

# ඔසුපැල හඳුනාගැනීමේ තරගයක්

ආයුර්වේද සංරක්ෂණ සභාව මඟින් වාර්ෂිකව පවත්වන ඔසුපැල හඳුනා ගැනීමේ තරගය මෙවර ද ජා-ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාසල් දූවා දරුවන්ගේ දැනුම වැඩිදියුණු කරලීම සඳහා පාසල් 5 කට වැඩි ප්‍රමාණයක් තෝරා ඇත.

පළමුවැනි, දෙවැනි හා තුන්වැනි ස්ථාන හිමිකර ගන්නා පාසල් දරුවනට වටිනා සහතික පත්‍රයක් හා පාසල් උපකරණ පිරිනැමේ.



**මීගමුව දළුපත සා. අන්තෝනි සිද්ධස්ථානයට අයත් කිතුනු ඒකකයන් අතර පවත්වන ලද නත්තල් ගවලෙන තරඟයෙන් ප්‍රථම ස්ථානය දිනාගත් "සමාදානයේ රාජේශ්වරිය" කිතුනු ඒකකය මඟින් ඉදිරිපත් කරන ලද ගවලෙනයි මේ. (සම්පත් විජේවර්ධන)**



**කැපුන්ගොඩ, මෝලවත්ත, ප්‍රදේශයේ තරුණ කැල විසින් නිර්මාණය කරන ලද මෙම ගවලෙන සාදා නිම කර ඇත්තේ කුඹල් මැටි සහ රෙදි පමණක් උපයෝගී කරගෙනයි. (එච්. එම්. බණ්ඩාර)**